## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 ජූනි

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.06.07 වෙනි දින පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 ජූනි මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සහභාගිත්වය:

1. ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - ගරු සභාපති
2. ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. ඩබ්.අබේසේන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. කේ.ඒ.අයි.ඒ.කන්දෙආරච්චි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
7. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
8. එච්.අමරාවතී මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
9. ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ.නිශාන් මැතිතුමා. - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
11. පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. අතුල ජයසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
14. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
15. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
16. යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
17. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
18. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
20. අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
22. වික්ටර් බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
23. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
24. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
25. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
26. එම්.වි.සුගත් මාධව මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
27. ආර්.පි.ශ්‍රියානි ජයකොඩි මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
28. රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
29. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
30. කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
31. බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
32. ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
33. එච්.ඒ.කේ.එන්.ජයවිර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

නොපැමිණි:

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය

කාර්යාල නිලධාරීන්:

I   ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්
II. ඩී.එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
III එම්.ජී.ආර්.සී.ජී.විජේරත්න මිය - සංවර්ධන නිලධාරී.

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2022.05.20 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 මැයි මාසයේ මහා සභාව 2022.05.09 වෙනි දින පැවත් වීමට නියමිතව තිබූ නමුත් රටේ පැවති ව්‍යාකූල තත්වය මත කල් තැබූ අතර එම න්‍යාය පත්‍රයට අදාලව 2022.05.20 වෙනි දින පවත් වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් එම වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොමැතිනම් එම මහා සභා වාර්තාව සභා සම්මත කරන ලෙසත් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

පිටු අංක 21 ඇති තමන් විසින් සිදු කරන ලද ප්‍රකාශයේ හිටපු සභාපති අබේවර්ධන විජේකෝන් මැතිතුමාගේ කාලයේදී ඇහැලියගොඩ බස් නැවතුම්පල ඉදි කළ බවත් පසුව හිටපු සභාපති අමිල කන්දෙආරච්චි මැතිතුමාගේ කාලයේදී එම භූමියේම කඩ කාමර කීපයක් ඉදි කළ බවත් ඒ කඩ කාමර ලබා ගත් අය විධිමත් ලෙස ටෙන්ඩර් පටිපාටියට අනුව එම කඩ කාමර ලබා ගෙන නිසි ලෙස බදු ගෙවමින් තිබියදී එම භූමියේම අනවසරයෙන් එයට වඩා දෙගුණයක් විශාල කඩ කාමරයක් ඉදි කර තිබෙන බව සඳහන් කළ බවත් එය වාර්තාවට ඇතුලත් විය යුතු බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. එම්. එම්. ෆර්හාන් මැතිතුමා:**

පිටු අංක 29 පිටුවේ සඳහන් තම කතාවේ රුපියල් ලක්ෂයක වටිනාකමකින් යුතු වීථි ලාම්පු තිබෙන බැවින් එය සවි කර දෙන ලෙස පමණක් ඉල්ලා සිටි බවත් ඒ ප්‍රකාශය එලෙස සංශෝධනය විය යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

පිටු අංක 18 හි තමන් විසින් සිදු කරන ලද ප්‍රකාශයේ සභාව සතු වත්කම් අත්‍යාවශ්‍ය දෙයට පමණක් වියදම් කරන ලෙසත් එසේ නොමැතිව එක් එක් අය විසින් යෝජනා ගෙන ආ පමණින් ඒ කාර්යන් සඳහා මුදල් වියදම් කිරීම මේ අවස්ථාවේ සිදු නොකළ යුතු බවට ප්‍රකාශ කළ බවත් එය වාර්තාවට ඇතුලත් විය යුතු බවත් පැවසීය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

පිටු අංක 28 තම නිල රථය පෞද්ගලික කාර්යන් සඳහා යොදා ගැනීමක් සිදු නොකල බවට සඳහන් ප්‍රකාශය ගරු සභාපතිතුමා විසින් සිදු කරන ලද ප්‍රකාශයක් බවත් මුද්‍රණ දෝෂයකින් එය තමන් විසින් සිදු කළ ප්‍රකායක් බවට සඳහන් වී ඇති බැවින් ඒ ප්‍රකාශය ගරු සභාපතිතුමාගේ ප්‍රකාශයක් ලෙස සංශෝධනය විය යුතු බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සඳහන් කරන ලද සංශෝධනයන්ට යටත්ව 2022.05.20 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කරන ලෙස දන්වා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඞී.එස්.එම්.නිමල් මැතිතුමා:**

2022 මැයි 20 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සඳහන් කරන ලද සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.05.20 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කරන ලද CLG AD/1/11/39 හා 2022.05.25 දිනැති ලිපිය මඟින් සියළුම මහජන නියෝජිතවරුන්ගේ 2021 හා 2022 වර්ෂයට අදාල වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙස දන්වා ඇති බැවින් න්‍යාය පත්‍ර සමඟ ලබා දී ඇති වත්කම් බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කර සමාදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කර අද දින රැගෙන එන ලෙස දන්වා ඇති බවත් ඒ අනුව සම්පූර්ණ කරන ලද වත්කම් බැරකම් ප්‍රකාශ කාර්යාලයට ලබා දීමට කටයුතු කරන ලෙසත් සියළුම මහජන නියෝජිතවරුන්ට දන්වා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

සියළුම මන්ත්‍රීවරුවන් අද දින වත්කම් බැරකම් ප්‍රකාශ රැගෙන නොපැමිණ ඇති බැවින් සහ අදාල ලේඛන සම්පූර්ණ කර ගැනීම සඳහා ටික දිනක් අවශ්‍ය වන බැවින් ඒ සඳහා දින කීපයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අදාල වත්කම් බැරකම් ප්‍රකාශ කඩිනමින් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කළ යුතු බැවින් න්‍යාය පත්‍රය ලබා දෙන අවස්ථාවේදි ඒවා මන්ත්‍රීවරුන් වෙත යොමු කළ බවත් අද දින ලබා දීමට නොහැකි නම් සතියක් ඇතුලත ඒවා ලබා දීමට කටයුතු කරන ලෙසත් දන්වා සිටින ලදී.

**(ඇ)** ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :

**(ඇ)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: - නැත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022.05.26 වෙනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් වන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඇමුණුම: 02**

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

**<u>මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභා වාර්තාව</u>**

**දිනය:-**2022.05.26 **වේලාව :- පෙ:ව:** 09.30

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් අනෙකුත් සමාජික ගරු මන්ත්‍රී තුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ වාර්තාවයි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා | ගරු සභාපති |
| 02 | විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා | ගරු උප සභාපති |
| 03 | ඩබ්.අබේසේන මැතිතුමා | |
| 04 | සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05 | සරත් විජේසිරි මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06 | එම්.එම්.ෆර්හාන් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 07 | ලක්මාල් සමරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 08 | විකුම් වන්දන කස්තිරගේ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 09 | සුධර්මා ලක්මාලි මැතිණිය | ගරු මන්ත්‍රිනී |

**මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් වූ බිල්පත්:-**

| අනු අංකය | විස්තරය | මුදල | බිල්පත් අංකය දිනය | ආයතනය |
|---|---|---|---|---|
| 01 | සභාවට අයත් RD 9461 අංක දරණ ට්‍රැක්ටරයේ පිටුපස ටයර් දෙක නැවත පිරවීම වෙනුවෙන් වූ බිල්පත ගෙවීම. | රු. 61,600.00 | 22290<br>2022.03.30 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්, දෙහිඕවිට |
| 02 | කෑගල්ල මහාධිකරණයේ අධිකරණයේ නඩු අංක 6210 රිට් නඩුව සඳහා අත්තිකාරම් මුදලක් ලබා දීම | රු.50,000.00 | - | නීතීඥ ටයිටස් මනතුංග මහතා |
| 03 | අවිස්සාවේල්ල මහාධිකරණයේ විභාග වන 70326(66) නඩුව සඳහා දිවුරුම් ප්‍රකාශ සකස් කිරීම, යතුරු ලියන කිරීම සඳහා සහ නඩු ගාස්තු ගෙවීම | රු.20,000.00 | - | නීතීඥ විජය නන්ද පත්මසිරි මහතා |

**කාරක සභාව වෙත ඉදිරිපත් වූ යෝජනා :**

I. පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීම සඳහා නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යොමු කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2022 ලිපිය කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

මහජන දිනයන් වන සඳුදා සහ බදාදා දිනයන් වලදී සියළුම කාර්ය මණ්ඩලය සේවයට කැඳවීමටත් ඉතිරි දින වලදී කාර්ය මණ්ඩලයෙන් 1/3 වන ලෙස සේවයට කැඳවීම සුදුසු බවට තීරණය කරන ලදී. එසේ වුවද අත්‍යාවශ්‍ය කාර්යන් තිබෙන අවස්ථා වලදී මෙම බෙදීම නොසලකා අදාල නිලධාරීන් සේවයට වාර්තා කළ යුතු බවටත් අනෙකුත් දිනයන් වලදී මහජනතාව අපහසුතාවට පත් වීම වැලැක්වීම සඳහා කාර්යාල කටයුතු සඳහා හැකි සෑම අවස්ථාවකදීම සඳුදා සහ බදාදා දිනයන් වලදී පැමිණෙන ලෙස දන්වා දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමත් සුදුසු බවට තීරණය කරන ලදී.

II.

රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා රාජ්‍ය ආායතන වලට උපදෙස් ලබා දෙමින් භාණ්ඩාගාර ලේකම්ගේ අත්සනින් යොමු කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මඟින් ලබා දී ඇති උපදෙස් සම්බන්ධයෙන් දැඩිව අවධානය යොමුකරන ලෙස දන්වා පළාත් පාලන කොමසාරිස් විසින් එන ලද ලිපිය කාරක සභාව වෙත යොමු කර තිබුණි.

තීරණය:

අදාල උපදෙස් කෙරෙහි අවධානය යොමු කර අනවශ්‍ය වියදම් කපා හැරීම සඳහා කඩිනම් පියවර ගැනීම සුදුසු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

III. පවතින බලශක්ති අර්බුදය හමුවේ විදුලිය හා ඉන්ධනඅරපිරිමැස්මෙන් භාවිතා කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙමින් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද 04/2022 චක්‍රලේඛය කාරක සභාව වත යොමු කර තිබුණි.

**තීරණය:**

පවතින තත්වය මත සූර්ය බල ශක්ති භාවිතය සම්බන්ධයෙන් අවදානය යොමු කිරීම සුදුසු බැවින් කාර්යාලයට සූර්ය බල ශක්ති පද්ධතියක් සවි කර ගැනීම සඳහා ලියා පදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා පරීක්ෂා කර ලැබෙන මිල ගණන් අනුව ණය මුදලක් වෙත යාමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

**iv**. සභාවට අයත් දේපල වල සිදු කර ඇති අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් විසින් දිගින් දිගටම මහා සභා රැස්වීම් වලදී අදහස් ප්‍රකාශ කරන බැවින්

I. දැරණියගල මාර්ගයේ පිහිටි පැරණි සභා භූමිය
II. ඇහැළියගොඩ බස් නැවතුමපළ
III. කුන්දගස්පිටිය හා වෙලන්ගල්ල සුසාන භූමි වල සිදු කර ඇති අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කරන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපියක් කාරක සභාව වෙත යොමු වී තිබුණි.

**තීරණය:**

ආණ්ඩු පක්ෂය හා විපක්ෂය නියෝජනය කරමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාගේ සභාපතිත්වයෙන් ගරු ප්‍රාදේශීය සබා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා , ගරු ප්‍රාදේශිය සභා

මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා ඇතුලත් කමිටුවක් පත් කර අදාල කාර්ය සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

**v.** දීගලවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පණ්ඩිගම හිඟුරලකන්ද , දෙහිඕවිට ලිපිනයේ පදිංචි අරුණ කුමාර රාජපක්ෂ මහතා සේවයට බඳවා ගැනීම සඳහා අවසර ඉල්ලා ඉදිරිපත් කරන ලද ලිපිය කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

මහා සභා අනුමැතියක් ලබා ගෙන අදාල බඳවා ගැනීම සිදු කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

**vi**. වර්තමානය වන විට කි.ග්‍රෑ. 37 ½ ක ගෑස් සිලින්ඩරයක මිල රු. 18,394.00 ක් පමණ වන බවත් එයින් පිළිස්සිය හැක්කේ මළ සිරුරු 02ක් පමණක් වන බැවින් ගෑස් වල අඛණ්ඩ මිල ඉහල යෑම හමුවේ ගෑස් නොමැති වීම මත බොහෝ මෘත දේහ භූමදානය කිරීම සිදු කරනු ලබන බවත් ඉදිරියේදී පවතින මිල ගණන් යටතේ මෘත දේහ ආදාහනය කිරිම සිදු කිරීම දුෂ්කර බැවින් ආදාහනාගාර ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා විෂය නිලධාරිනිය විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

බල ප්‍රදේශය තුළ රු. 12,000.00 ක් ලෙස හා බල ප්‍රදේශයෙන් පිටත රු.14,000.00ක් ලෙස අදාල ගාස්තු සංශෝධනය කිරීම මහා සභා අනුමැතිය ලබා ගෙන සිදු කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

**vii**. සභාවට අයත් පනාවල පෙර පාසලේ දරුවන් 40 ක් සඳහා පෙර පාසල් අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන වැඩපොත් වර්ග 04ක් මිල දී ගැනීම සඳහා කාරක සභා අනුමැතිය ඉල්ලා විෂය නිලධාරිනය විසින් කාරක සභාවට ලිපියක් යොමු කර තිබුණි.

**තීරණය:**

පෙර වර්ෂ වලදීත් එම පොත් සභාව මඟින් දරුවන්ට ලබා දුන් නිසා , මෙවරත් අදාල පොත් කට්ටල් ලබා දීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

**viii** . ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ල ආසන්නයේ පිහිටි සමන්ගිර වෙළඳසැල පසුගිය දිනක හදිසි ගිනි ගැනීමකට ලක් වූ අවස්ථාවේ සභාවේ ගිනි නිවීමේ උපකරන භාවිතා කර එම ගින්න මැඩ පැවැත්වීමට කටයුතු කරන ලදී. එම නිසා සභා කාර්යාලයට අවශ්‍ය ගිනි නිවිමේ උපකරණ නැවත මිලදී ගැනීම සිදු කළ යුතු බැවින් ඒ සඳහා රු. 35,000.00 ක මුදලක් සභාවට වැය කිරිමට සිදු විය. අදාල මුදල් එම වෙළඳසැල් හිමියාගෙන් අය කර ගන්නේද යන්න සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා කාරක සභාව වෙත ලිපියක් යොමු කර තිබුණි.

**තීරණය:**

මේ සම්බන්ධයෙන් අදාල වෙළඳසැල් හිමියා සමඟ සුහදව සාකච්ඡා කර අදාල මුදල් ගෙවීමේ හැකියාවක් තිබේද යන්න පළමුව සොයා බලා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

**Ix.** ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කාර්යාලීය ගබඩාව අලුත්වැඩියා කිරීම සඳහා සකස් කරන ලද රු.67.650.00 ක ඇස්තමේන්තුව කාරක සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

වර්ෂා දින වලදී ජලය එක් රැස් වීමෙන් ගබඩාවේ ඇති භාණ්ඩ විනාශ වන බැවින් කඩිනමින් එකී කාර්ය සිදු කිරීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

**x.** තල්දූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 02 හි දොර අබලන් වී ඇති බැවින් එය අලුත්වැඩියා කර දෙන ලෙස කඩ හිමියා විසින් ඉල්ලීමක් සිදු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන කාරක සභාවේ උපදෙස් ඉල්ලා විෂය නිලධාරී විසින් කාරක සභාව වෙත ලිපියක් යොමු කර තිබුණි.

**තීරණය:**

සභාව විසින් බදු දී මාස 06 ක කාලයක් ඉක්මවා ඇති බැවින් හා කඩය භාර දෙන විට දොර යථා තත්වයෙන් පැවති බැවින් සහ ගිවිසුමේ වගන්ති අංක 08 යටතේ අලුත්වැඩියා කටයුතු බදුකරු විසින් සිදු කර ගත යුතු බැවින් ඒ කාර්ය අයිතිකරු විසින් සිදු කර ගත යුතු බවට තීරණය කරන ලදී.

**xi.** රට තුළ උද්ගත වී ඇති දැඩි ආර්ථික අර්බුදය , රජයට විරුද්ධව පවත්වනු ලබන විරෝධතා හා වරින් වර පනවනු ලබන ඇඳිරි නීති තත්ව හේතුවෙන් ජනතාවගේ ආදායම් තත්වය අඩු වීම හා බඩු මිල සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ආදායම් අයකිරීමේ කටයුතු සඳහා ක්ෂේත්‍රෙය් යන නිලධාරීන්ට දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වන බැවින් ඒ සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා ක්ෂේත්‍ර නිලධාරින් විසින් යොමු කරන ලද ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.
**තීරණය:**

කණ්ඩායම් වශයෙන් කාර්යාල නිලධාරින් බෙදා ක්ෂේත්‍රෙය් බදු එකතු කිරීමේ කාර්ය සඳහා යැවීම සුදුසු බවට තීරණය කරන ලදී.

**xii.** රට තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ බල ප්‍රදේශයේ ජනතාවගේ දරිද්‍රතාවය අවම කර ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා ජනතාව ආර්ථිකමය වශයෙන් සවි බල ගැන්වීම සඳහා දෙහිඕවිට ප්‍රාදේශිය සභාව මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද " සාගිනි දුරලමු - වතු පිටි සරු කරමු" ගෙවතු වගා ව්‍යාපෘතිය කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

මහා සභා අනුමැතියක් ලබා ගෙන අදාල කාර්ය සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

**Xiii.** 2022 වර්ෂයේ වැය ප්‍රතිපාදන විෂන් කීපයක ප්‍රතිපාදන අවසන් වීම හා ඉදිරි මාස 07 ක කාලය සඳහා පමාණවත් නොවීම මත මෙම අමතර ප්‍රතිපාදන සලස්වා ගැනීම සඳහා සකස් කරන ලද පරිපූරක අයවැය ලේඛනය කාරක සභාව වෙත යොමු කර තිබුණි

**තීරණය:**

මහා සභා අනුමැතියක් ලබා ගෙන අනුමත කරවා ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022 මැයි මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම 01

# දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## 2022 මැයි මස 31 වන දින තෙක් ගෙවීම් වවුචර්පත්

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| මැයි:04 | 782 | අයි.ටී.විජේතුංග<br>දෙ/ප්‍රා/සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු කාර්මික නිලධාරී මයාට 2022 අප්‍රේල් මස දීමනා ලබා දීම. | 38,199.00 |
| මැයි:04 | 783 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මාර්තු මස JCB යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 79,270.00 |
| මැයි:04 | 784 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මාර්තු මස RD-6541 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,976.00 |
| මැයි:04 | 785 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි<br>2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 5,600.00 |
| මැයි:04 | 786 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 505.00 |
| මැයි:04 | 787 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>2021 වර්ශයට අදාල කාර්ය සාධන වාර්ථාව බයින්ඩින් කිරීම සඳහා වියදම් වූ මුදල් ලබා ගැනීම. | 240.00 |
| මැයි:04 | 788 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>දෙ/ප්‍රා/සභාවේ වාර්ශික සැලැස්ම බයින්ඩින් කිරීම සඳහා වියදම් වූ මුදල් ලබා ගැනීම. | 320.00 |
| මැයි:04 | 789 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>LL6937 ටිපර් රථය හා JX2221 යතුරුපැදිය සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට ගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 10,070.00 |
| මැයි:04 | 790 | මු.හා.ක-ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද<br>ගමන් වියදම් ගෙවීම. | 7,000.00 |
| මැයි:04 | 791 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 4,200.00 |
| මැයි:04 | 792 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 11,983.00 |
| මැයි:04 | 793 | මු.හා.ක-එච්.ජී.දේශප්‍රිය<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 11,420.00 |
| මැයි:05 | 794 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මාර්තු මස PF7369 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 47,300.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:05 | 795 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මාර්තු මස තණකොළ කපන මැෂිම සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 42,420.00 |
| මැයි:05 | 796 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස RD-6441 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 7,040.00 |
| මැයි:05 | 797 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්රේල් මස RC-1403 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 57,940.00 |
| මැයි:05 | 798 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස 250-4053 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 14,080.00 |
| මැයි:05 | 799 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස RD-5928 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,032.00 |
| මැයි:05 | 800 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස විදුලිජනක යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 26,400.00 |
| මැයි:05 | 801 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස LL-7582 දරණ කෘ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 59,700.00 |
| මැයි:05 | 802 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස LL-6937 දරණ ටිපර් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 18,656.00 |
| මැයි:05 | 803 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මාර්තු මස RD-9461 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 34,760.00 |
| මැයි:05 | 804 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>බොබ්කැට් යන්ත්‍රය සඳහා 2022 අප්‍රේල් මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,800.00 |
| මැයි:05 | 805 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස JX-2221 දරණ යතුරුපැදිය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 592.00 |
| මැයි:05 | 806 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස ZA0126 දරණ JCB යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 76,585.00 |
| මැයි:05 | 807 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස ගල්රෝල සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 49,780.00 |
| මැයි:05 | 808 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මාර්තු මස සෞ.වෛද්‍ය නිලධාරී කාර්යාලයේ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,301.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:05 | 809 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස සෞ.වෛද්‍ය නිලධාරී කාර්යාලයේ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 11,340.00 |
| මැයි:05 | 810 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>42-7498 දරණ ගිලන්රථය සඳහා 2022 අප්‍රේල් මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 6,160.00 |
| මැයි:05 | 811 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස LF-4836 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5,780.00 |
| මැයි:09 | 812 | ලේකම්-දේ/ප්‍රා/සභාව<br>2022 මැයි මස දේ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 779,000.00 |
| මැයි:09 | 813 | එස්.ඩී.ප්‍රමෝෂන්<br>කොරෝනා මෘත දේහ ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන ඇඳුම් කට්ටල මිලට ගැනීම වෙනුවෙන් ගෙවීම. | 50,000.00 |
| මැයි:09 | 814 | ලේකම්-දේ/ප්‍රා/සභාව<br>2022 අප්‍රේල් මස දේ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම. | 933,679.66 |
| මැයි:13 | 815 | එන්.කරුණාරත්න<br>දේ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2022 අප්‍රේල් මස මුදල් ගෙවීම. | 85,200.00 |
| මැයි:13 | 816 | මු.භා.ක-දේ/ප්‍රා/සභාව<br>ZA0126 දරණ JCB යන්ත්‍රයට හෝස් බටයක් ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 15,000.00 |
| මැයි:13 | 817 | මු.භා.ක-ආර්.ඩී.නලින් පුෂ්පකුමාර<br>නිවාඩු දින සේවයෙහි වැටුප් ගෙවීම. | 13,501.25 |
| මැයි:13 | 818 | මු.භා.ක-ආර්.ඩී.නලින් පුෂ්පකුමාර<br>දේ/ප්‍රා/සභාවේ ලේකම් ධුරයේ වැඩ බැලීමට අදාල දීමනාව ගෙවීම.(2022.04.10-2022.05.10 දක්වා) | 10,583.75 |
| මැයි:17 | 819 | වැනට් ලංකා කොම්පියුටර්ස්<br>දේ/ප්‍රා/සභාවට Subwoofr සෙට් එකක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,500.00 |
| මැයි:17 | 820 | වැනට් ලංකා කොම්පියුටර්ස්<br>කාර්යාලයේ ප්‍රධාන පරිගණකය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,900.00 |
| මැයි:17 | 821 | වැනට් ලංකා කොම්පියුටර්ස්<br>LapTop පරිගණකය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 14,900.00 |
| මැයි:17 | 822 | පොස්ට් මාස්ටර් ජනරාල්<br>තැපැල් මුද්‍රණ යන්ත්‍රයට ගාස්තු ඇතුලත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,000.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:17 | 823 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දූව පොදු වෙළඳ සංකීරණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 අප්රේල් සඳහා) | 156,136.31 |
| මැයි:17 | 824 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 136,352.00 |
| මැයි:17 | 825 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>QU2004 ත්‍රීවිලරය සඳහා 2022 අප්‍රේල් මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,839.00 |
| මැයි:17 | 826 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස RD-9461 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 44,317.00 |
| මැයි:17 | 827 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස RD-8018 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 56,004.00 |
| මැයි:17 | 828 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>2022 ලෝක කාන්තා දින සැමරුමෙහි "මිහිලිය" මල් ප්‍රදර්ශනය සඳහා 15*20 ප්‍රමාණයේ කැනපිය ලබා ගැනීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 5,000.00 |
| මැයි:17 | 829 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 12,000.00 |
| මැයි:17 | 830 | මු.හා.ක-ආර්.ඩබ්.එම්.ඊ.කේ.චන්ද්‍රවීර<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 1,090.00 |
| මැයි:17 | 831 | මු.හා.ක-බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න<br>2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 4,200.00 |
| මැයි:17 | 832 | මු.හා.ක-එම්.ජී.ආර්.සී.ජී.විජේරත්න<br>ගමන් වියදම් ගෙවීම. | 776.00 |
| මැයි:17 | 833 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>ගමන් වියදම් ගෙවීම. | 1,018.50 |
| මැයි:17 | 834 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක<br>QU2004 ත්‍රීවිලරයේ පැච් දැමීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 500.00 |
| මැයි:17 | 835 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දිගලවත්ත පූර්ව මිශ්‍රණ අංගනයේ කළුගල් මිශ්‍රණය එලා සැකසීම සඳහා තත්කාලීන පදනම මත සේවයේ යෙදවූ කම්කරුවන් වෙනුවෙන් මුදල් ගෙවීම. | 18,300.00 |
| මැයි:17 | 836 | සී.එම්.ප්‍රියන්ත රුවන් කුමාර<br>ලිපිද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,000.00 |
| මැයි:17 | 837 | සී.එම්.ප11ප්‍රියන්ත රුවන් කුමාර<br>තීන්ත පැඩ් 05ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,250.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:17 | 838 | නිපෝන් හාඩ්වෙයාර් ඇන්ඩ් ස්ටෝර්ස්<br>තණකොළ කපන යන්ත්‍රයට තල ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,170.00 |
| මැයි:17 | 839 | නිපෝන් හාඩ්වෙයාර් ඇන්ඩ් ස්ටෝර්ස්<br>කාර්යාලීය සංකීරණයේ වැසිකිළි පද්ධතියේ ජලනල හා කරාම අලුතින් යෙදීම සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 7,365.00 |
| මැයි:17 | 840 | නිපෝන් හාඩ්වෙයාර් ඇන්ඩ් ස්ටෝර්ස්<br>තල්දූව සතිපොලේ පළමු කඩකාමර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ලබාගත් ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවීම. | 5,575.00 |
| මැයි:17 | 841 | මොබිටෙල් පුද්ගලික සමාගම<br>ගි.අ18080420 දරණ පෙරටු කාර්යාලීය කෙටි පණිවුඩ සේවාව වෙනුවෙන් මුදල් ගෙවීම.(22/03/25-22/04/24) | 527.43 |
| මැයි:17 | 842 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 අප්‍රේල් මස බිල්පත ගෙවීම. | 815.51 |
| මැයි:17 | 843 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 අප්‍රේල් මස බිල්පත ගෙවීම. | 7,872.85 |
| මැයි:17 | 844 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 අප්‍රේල් මස බිල්පත ගෙවීම. | 7,705.96 |
| මැයි:17 | 845 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 අප්‍රේල් මස බිල්පත ගෙවීම. | 815.51 |
| මැයි:17 | 846 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2262315 දරණ කාර්යාලීය දුරකථනයේ 2022/03/16-2022/04/15 දක්වා බිල්පත ගෙවීම. | 2,032.77 |
| මැයි:17 | 847 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-3868934 දරණ ඊ/ආදාහනාගාර දුරකථනයේ 2022.03.16-2022.04.15 දක්වා බිල්පත ගෙවීම. | 489.19 |
| මැයි:17 | 848 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>ආයුර්වේද ජංගම සායනයේ සංග්‍රහ වියදම් සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 1,760.00 |
| මැයි:17 | 849 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>මාගම්මන නිදහස් ආයුර්වේදය සඳහා රුධිර පීඩන මාපකයක් ලබා ගැනීමට ගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 11,000.00 |
| මැයි:17 | 850 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබාගත් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:17 | 851 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබාගත් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |
| මැයි:18 | 852 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 51,882.00 |
| මැයි:18 | 853 | එම්.කේ.පී.එස්.විජේරත්න<br>දෙ/ප්‍රා/සභාවට අයත් වෛබ්රේටි රෝල ප්‍රවාහනය කිරීම සඳහා මුදල් ගෙවීම. | 47,000.00 |
| මැයි:18 | 854 | කෑගල්ල ඩිස්ට්රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 91,970.00 |
| මැයි:18 | 855 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>2022 මාර්තු මස අතිකාල ගෙවීම. | 632.00 |
| මැයි:18 | 856 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි<br>2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 4,000.00 |
| මැයි:18 | 857 | මු.හා.ක-එච්.ඒ.සී.ඩබ්.හේනකආරච්චි<br>නිවාස හා ප්‍රජා කාරක සභාවේ සංග්‍රහ වියදම් ගෙවීම. | 900.00 |
| මැයි:18 | 858 | මු.හා.ක-එම්.සී.ආර්.විජේරත්න<br>ගල්රෝල සඳහා එන්ජින් ඔයිල් 5L හා හයිඩ්‍රොලික් 5L ක් ලබා ගැනීම වෙනුවෙන් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 9,000.00 |
| මැයි:18 | 859 | මු.හා.ක-එච්.පී.පී.සමන් කුමාර<br>PF7369 දරණ කැබ් රථය සඳහා ඔයිල් 8 1/2 L ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13,175.00 |
| මැයි:18 | 860 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/03/14 සිට 2022/04/17 දක්වා බිල්පත ගෙවීම. | 715.80 |
| මැයි:18 | 861 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරණ ඊ/ආදාහනාගාරයේ 2022/03/25-2022/04/30 දක්වා බිල්පත ගෙවීම. | 3,076.50 |
| මැයි:18 | 862 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7991487016 දරණ දෙ/පැරණි සභාවේ 2022/03/31-2022/05/04 දක්වා බිල්පත ගෙවීම. | 1,283.10 |
| මැයි:18 | 863 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.3612082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2022/03/13 සිට 2022/04/13 දක්වා බිල්පත ගෙවීම. | 240.00 |
| මැයි:18 | 864 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/03/10 සිට 2022/04/10 දක්වා බිල්පත ගෙවීම. | 532.80 |
| මැයි:18 | 865 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස PF7369 දරණ කැබ්රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 107,450.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:18 | 866 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 අප්‍රේල් මස තණකොළ කපන මැෂිම සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 36,950.00 |
| මැයි:18 | 867 | වරුණ ඉංජිනියරින් වර්ක්<br>LF4836 කැබ්රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 50% ඉතිරි මුදල් ගෙවීම. | 260,000.00 |
| මැයි:18 | 868 | එස්.ඩී.ප්‍රමෝෂන්<br>කොරෝනා මෘත දේහ ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන ඇඳුම් කට්ටල මිලට ගැනීම වෙනුවෙන් ගෙවීම. | 58,000.00 |
| මැයි:18 | 869 | සී/ස සකසුරුවම් හා ණය ගනුදෙනු පිලිබඳ සමුපාකාර සමිතිය කාර්යාලීය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 48,687.50 |
| මැයි:18 | 870 | බිටුමික්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>පූර්ව මිශ්‍රණ නිශ්පාදන සඳහා අවශ්‍ය තාර ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 435,500.00 |
| මැයි:20 | 871 | මු.භා.ක-ජනිතා සිරිසේන<br>දෙ/ප්‍රා/සභාවේ RD6441,RD9461 හා QU2004 යන වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13,160.00 |
| මැයි:20 | 872 | මු.භා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවයෙහි දීමනා ලබා ගැනීම. | 7,179.00 |
| මැයි:20 | 873 | මු.භා.ක-දෙ/ප්‍රා/සභාව<br>සුළු මුදල් අග්‍රිමය අලුත් කිරීම. | 890.00 |
| මැයි:20 | 874 | මු.භා.ක-ඩබ්.එස්.කේ.වර්ණපුර<br>ඇඟිලි සළකුණු යන්ත්‍රය සවි කිරීමට අවශ්‍ය ප්ලග් එකක් මිලදී ගැනීම වෙනුවෙන් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 880.00 |
| මැයි:20 | 875 | මු.භා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාව සතු LL6937 ටිපර් රථය සඳහා ඉන්ධන ලබා ගැනීමට වියදම් වූ මුදල් ගෙවීම. | 20,230.00 |
| මැයි:20 | 876 | මු.භා.ක-යූ.එල්.ජී.ජයතිලක<br>QU2004 ත්‍රීවිලරයේ බ්රේක් වොෂර් දමා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 900.00 |
| මැයි:20 | 877 | මු.භා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>PF7369 කැබ් රථය සඳහා ලබා ගන්නා ලද ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 10,700.00 |
| මැයි:20 | 878 | මු.භා.ක-ඩබ්.එස්.කේ.වර්ණපුර<br>ඇඟිලි සළකුණු යන්ත්‍රය ගෙන්වා ගැනීමේ කුරියර් සේවාව වෙනුවෙන් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 400.00 |
| මැයි:20 | 879 | මු.භා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2022.05.20 දින පැවැත්වීමට නියමිත මහාසභා රැස්වීමේ සංග්‍රහ වියදම් වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 5,000.00 |
| මැයි:20 | 880 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/04/04-2022/05/04 දක්වා බිල්පත ගෙවිම. | 435.78 |

| | | | |
|---|---|---|---|
| මැයි:20 | 881 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/04/02-2022/05/03 දක්වා බිල්පත ගෙවිම. | 2,734.02 |
| මැයි:20 | 882 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2022/04/08-2022/05/09 දක්වා බිල්පත ගෙවිම. | 296.25 |
| මැයි:20 | 883 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/067/174/14 දරණ ඊ/ආදාහනාගාරයේ 2022/03/22-2022/04/22 දක්වා බිල්පත ගෙවිම. | 870.66 |
| මැයි:20 | 884 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/03/24-2022/04/24 දක්වා බිල්පත ගෙවිම. | 494.82 |
| මැයි:20 | 885 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2022/04/04-2022/05/04 දක්වා බිල්පත ගෙවිම. | 3,324.41 |
| මැයි:23 | 886 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.6312082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2022/04/13 සිට 2022/05/17 දක්වා බිල්පත ගෙවීම. | 276.60 |
| මැයි:23 | 887 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/04/10-2022/05/17 දක්වා බිල්පත ගෙවීම. | 496.20 |
| මැයි:23 | 888 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7921106404 දරණ දෙ/ම/පුස්තකාලයේ(E-library) 2022/04/09-2022/05/14 දක්වා බිල්පත ගෙවීම. | 1,209.90 |
| මැයි:23 | 889 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6316208308 දරන දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2022/04/12-2022/05/15 දක්වා බිල්පත ගෙවීම. | 2,802.00 |
| මැයි:23 | 890 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7970101003 දරණ දෙ/නව ප්‍රා/සභා කාර්යාලයේ 2022 අප්‍රේල් මස බිල්පත ගෙවීම. | 39,191.60 |
| මැයි:23 | 891 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 අප්‍රේල් මස බිල්පත ගෙවීම. | 815.51 |
| මැයි:23 | 892 | යුනික් මෝටර්ස්<br>ගල්රෝල සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 32,190.00 |
| මැයි:23 | 893 | ඔෆිස්ට්‍රොනික් පුද්ගලික සමාගම<br>ඇඟිලි සළකුණු යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 28,500.00 |
| මැයි:23 | 894 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 599.40 |

| | | | |
|---|---|---|---|
| මැයි:23 | 895 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 732.00 |
| මැයි:23 | 896 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 6,062.00 |
| මැයි:23 | 897 | මු.හා.ක-එස්.පී.තිලකරත්න<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 8,345.00 |
| මැයි:23 | 898 | මු.හා.ක-ඩී.එල්.ආර්.එස්.කුමාර<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 10,833.00 |
| මැයි:23 | 899 | මු.හා.ක-ආර්.ජී.එස්.ඩී.රොෂාන්ත<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 10,416.00 |
| මැයි:23 | 900 | මු.හා.ක-පී.ජී.සෙනවිරත්න<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 11,250.00 |
| මැයි:23 | 901 | මු.හා.ක-කේ.එම්.ටී.එම්.කපුකොටුව<br>2022 මාර්තු මස අතිකාල ගෙවීම. | 1,031.00 |
| මැයි:23 | 902 | මු.හා.ක-එම්.එල්.ටී.එන්.මුණසිංහ<br>2022 මාර්තු මස අතිකාල ගෙවීම. | 1,064.00 |
| මැයි:23 | 903 | මු.හා.ක-කේ.ජී.කේ.තිලකරත්න<br>2022 මාර්තු මස අතිකාල ගෙවීම. | 1,178.00 |
| මැයි:23 | 904 | මු.හා.ක-කේ.එම්.ඒ.ජේ.එන්.සිරිසේන<br>2022 මාර්තු මස අතිකාල ගෙවීම. | 1,254.00 |
| මැයි:23 | 905 | මු.හා.ක-එච්.ආර්.කේ.ජයවර්ධන<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 8,166.00 |
| මැයි:23 | 906 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 6,750.00 |
| මැයි:23 | 907 | මු.හා.ක-බී.පී.එන්.විජේතුංග<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 8,232.00 |
| මැයි:23 | 908 | මු.හා.ක-දර්ශන කොඩිකාර<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 10,562.00 |
| මැයි:23 | 909 | මු.හා.ක-එම්.ආර්.පී.කුමාරසිරි<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 8,666.00 |
| මැයි:23 | 910 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 5,313.00 |
| මැයි:23 | 911 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර<br>2022 අප්‍රේල් මස අතිකාල ගෙවීම. | 6,785.00 |
| මැයි:23 | 912 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>2022/04/29 දින පැවැත්වීමට නියමිත පරිසර හා පොදු කාරක සභාවේ සංග්‍රහ වියදම් ලබා ගැනීම. | 1,250.00 |
| මැයි:23 | 913 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>කසල කළමණාකරනය සම්බන්ධව සැකසූ ව්‍යාපෘති යෝජනා 03ක් බයින්ඩින් කිරීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 600.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:23 | 914 | මු.හා.ක-ඩබ්.එස්.කේ.වර්ණපුර<br>මාර්ග සිතියම්ගත වැඩමුළුව සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 35,000.00 |
| මැයි:24 | 915 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 මැයි මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,193,462.76 |
| මැයි:25 | 916 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ගි.අ 2235101 දරණ ජංගම ගිණුමෙන් 18% පොළී අනුපාතයට ස්ථාවර තැන්පතු අලුත් කිරීම.(No Cash) | 16,000,000.00 |
| මැයි:25 | 917 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ගි.අ 2235101 දරණ ජංගම ගිණුමෙන් 18% පොළී අනුපාතයට ස්ථාවර තැන්පතු නැවත ආයෝජනය.(No Cash) | 5,000,000.00 |
| මැයි:25 | 918 | සභාපති-දෙ/ප්‍රි/සභාව<br>ජල බවුසරය ලබා දීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 3,500.00 |
| මැයි:25 | 919 | දිලාන් ජයසිංහ ප්‍රවාහන සේවය<br>වෙබේෂන් මාර්ග තලනය දින 1/2 ක් සඳහා ලබා ගැනීම හා ප්‍රවාහනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5,500.00 |
| මැයි:25 | 920 | දෙහිඕවිට පික්චර් පැලස්<br>ස්වයංක්‍රියව ක්‍රියා කරන දොර ලොක් 02ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,400.00 |
| මැයි:26 | 921 | මු.හා.ක-ඩබ්.ඩී.එස්.සී.රණසිංහ<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| මැයි:26 | 922 | මු.හා.ක-ජනක රත්නායක<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| මැයි:26 | 923 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 1,395.00 |
| මැයි:26 | 924 | මු.හා.ක-ර්.පී.එස්.සමන්ලතා<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 3,680.00 |
| මැයි:26 | 925 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>කාර්මික සේවා කාරක සභාවේ සංග්‍රහ වියදම් ගෙවීම. | 3,600.00 |
| මැයි:26 | 926 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 2,160.00 |
| මැයි:26 | 927 | එල්.එම්.ඩී.දමයන්ති විජේසිංහ<br>දෙ/ප්‍රි/සභාවේ ළමා හා කාන්තා ආරක්ෂණ කමිටුව සඳහා සහභාගීවූවන් හට සංග්‍රහ කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,980.00 |
| මැයි:26 | 928 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ අප්‍රේල් මස දෙහිඕවිට මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 7,580.00 |
| මැයි:26 | 929 | ඒ.ඩී.චන්ද්‍රසේන<br>2022 වර්ෂයේ අප්‍රේල් මස තල්දූව මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,780.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:26 | 930 | බී.ජී.තිලංග බුද්ධික මුදලිගේ<br>2022 වර්ෂයේ අප්‍රේල් මස ඉඹුල්පිටිය මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,970.00 |
| මැයි:26 | 931 | කේ.ඒ.පී.කුරුප්පු<br>2022 වර්ෂයේ අප්‍රේල් මස පනාවල මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 7,360.00 |
| මැයි:26 | 932 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2022 වර්ෂයේ අප්‍රේල් මස මාගම්මන මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,280.00 |
| මැයි:26 | 933 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>42-7498 අංක දරණ ගිලන් රථයේ ටියුබ් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 400.00 |
| මැයි:26 | 934 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>ZA0126 දරණ JCB යන්ත්රයේ ටියුබ් පැච් හා ටයර් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,900.00 |
| මැයි:26 | 935 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>250-4053 කැබ් රථයේ ටයර් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 400.00 |
| මැයි:26 | 936 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>RD 9461 ට්‍රැක්ටරයේ ටයර් පැච් 1 ක් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 400.00 |
| මැයි:26 | 937 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>RC 1403 ට්‍රැක්ටරයේ ටයර් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 800.00 |
| මැයි:26 | 938 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>ZA0126 දරණ JCB යන්ත්‍රයේ ටියුබ් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 900.00 |
| මැයි:26 | 939 | දාස මෝටර්ස්<br>කසල කරත්තයේ තට්ටුව තහඩු දමා පැස්සීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,500.00 |
| මැයි:26 | 940 | දාස මෝටර්ස්<br>RX1998 ට්‍රේලරයේ සපයන ලද තහඩු දමා දිරාගිය තැන් පැස්සීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,500.00 |
| මැයි:26 | 941 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>බේල් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය උපාංග මිලදී ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 30,000.00 |
| මැයි:26 | 942 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>2022/05/20 දින පැවති මහා සභා රැස්වීම සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 5,000.00 |
| මැයි:30 | 943 | උදාරා ලී මෝල<br>දිස්ත්‍රික් කාර්යාලයේ සිට දිගලවත්ත කසල මධ්‍යස්ථානය වෙත බේලර් යන්ත්‍රය ප්‍රවාහනය කිරීම සඳහා මුදල් ගෙවීම. | 22,500.00 |

| | | | |
|---|---|---|---|
| මැයි:30 | 944 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 11,520.00 |
| මැයි:30 | 945 | ලේකම්-දෙ/ප්‍රි/සභාව<br>ZA0126 දරණ JCB යන්ත්‍රයට හෝස් බටයක් ලබා ගැනීම වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 14,200.00 |
| මැයි:31 | 946 | ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය<br>වාර්ශික කාර්ය සාධන වාර්තා හා ගිණුම් සම්මාන තරගාවලිය සඳහා අයඳුම්පත්‍ර ගාස්තුව ගෙවීම. | 10,000.00 |
| | | | **28,974,753.30** |
| මැයි:26 | 11 | සේවක ණය<br>එම්.එල්.ටී.එන්.මුණසිංහ<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 250,000.00 |
| | | **එකතුව** | **29,224,753.30** |

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

2022 මැයි මාසයේ ගෙවීම් වවුචර්පත් විස්තරයේ ගල් රෝලට සහ වයිබ්‍රේටින් රෝල සඳහා ගෙවන ලද රු.47,000.00 ක මුදලක් ගෙවීම් සම්බන්ධයෙන් පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එසේම වවුචර්පත් අංක 795 යටතේ 2022 මාර්තු මස තණකොළ කපන මැෂිම සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් රු.42,420.00ක මුදලක් දෙහිඕවිට ඉන්ධන පිරවුම්හලට ගෙවා ඇති බවට සඳහන් වී ඇති බවත් එතරම් මුදලක් වැය කර මේ අවස්ථාවේදී තණකොළ කපන මැෂින් සඳහා ඉන්ධන ලබා දීම කොතෙක් දුරට සාධාරණද යන්න සිතා බැලිය යුතු බව පෙන්වා දෙන ලදී. මෙහි යම් අක්‍රමිකතාවයක් සිදු වී ඇතිද යන සැකය උද්ගත වන නිසා මේ සම්බන්ධයෙන් පරික්ෂා කර බලන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාව සතු ගල් රෝල යටියන්තොට සීපෝත් ප්‍රදේශයේ කැන්දල් ඔය මාර්ගය සංවර්ධන කටයුතු සඳහා කුලී පදනම මත ලබා දී තිබූ බවත් එය නැවත රැගෙන ඒම සඳහා වියදම් වූ මුදල ඒ ආකාරයෙන් සඳහන් වූ බවත් ඔවුන්ගෙන් අදාල මුදල් අය කර ගැනීම සිදු කරන බවත් දන්වා සිටියේය. එසේම තණ කොළ කපන මැෂිමට ඉන්ධන ලබා දීම ලෙස සඳහන් වුවත් සභාව සතුව තණකොළ කපන මැෂින් 04 ක් තිබෙන බවත් මාර්ග කම්කරුවන්ට සිය දෛනික රාජකාරි කටයුතු සිදු කිරීමට මේ තණකොළ කපන මැෂින් සඳහා ඉන්ධන ලබා දීම සිදු කළ යුතු බවත් මෙහි සඳහන් කර ඇති ගෙවීම් සිදු කර ඇත්තේ ඒ සියල්ලම සඳහා බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

ගල් රෝල සේවා කිරීම සඳහා රු.32,000 ක මුදලක් වියදම් කර ඇති බවත් එම සේවා කටයුතු සිදු කරන ලද ආයතනයේ අය කිරීම් අනෙකුත් ආයතන වලට සාපේක්ෂව වැඩි අගයක් ගන්නා බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගල් රෝල නියමිත කාල සීමාවේදී සේවා කිරීම සිදු කළ යුතු බවත් එසේම සභාව සතු වාහන සේවා කිරීම ලියාපදිංචි ආයතනයකින්ම සිදු කළ යුතු බවත් පැවසීය. වර්තමානයේ පවතින මිල ගණන් යටතේ මීට වඩා අඩු මුදලකින් එම කාර්ය සිදු කළ හැකිද යන්න ගැටළුවක් බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

පූර්ව මිශ්‍රණ නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාර ලබා ගැනීම වෙනුවෙන් රුපියල් හාරලක්ෂ තිස් පන්දහස් හාරසියක මුදලක් වියදම් කර තිබෙන බවත් ඒ කාර්ය සිදු වනවාද යන්නත් විමසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම කාර්ය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ අනුමැතිය හිමි වූ බවත් තාර ගැනීම මේ වන විය සිදු කර ඇති අතර ඒ කාර්ය කඩිනමින් සිදු කරන බවත් පවසා සිටින ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.04)

**01.(iii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දීගලවත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පොහොර හැලීම, කසළ වර්ග කිරීම හා ගොඩ ගැසීම සඳහා දැනට සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන් ප්‍රමාණවත් නොවීම හා යොදවා ඇති කම්කරුවන් දෛනිකව සේවයට නොපැමිණීම මත බොහෝ කටයුතු අඩාල වේ. ඒ සඳහා ආදේශක කම්කරුවෙකු යොදා ගැනීම දැනට පවතින අවශ්‍යතාවයක් වන බැවින් පඹේගම, හිඟුරලකන්ද, දෙහිඹිවිට ලිපිනයේ පදිංචි අරුණ කුමාර රාජපක්ෂ මහතා ඒ සඳහා බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ එවනු ලබන සේවකයන් වෙනත් ආයතන වල කම්කරුවන් ලෙස සේවයේ යොදවා ඇති බවත් මේ ආයතනයේ එලෙස බඳවා ගත් පිරිස් බොහොමයක් කිසිදු කාර්යක් නොමැතිව දවස ගෙවා දමමින් සිටින බැවින් ඔවුන්ගෙන් අයෙකු මේ සඳහා යොමු කළ නොහැකිදැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔවුන් මේ ආයතනය වෙත යොමු කර ඇත්තේ පුහුණුවක් සඳහා පමණක් බවත් කිසිදු අයෙකු සඳහා මේ ආයතනයේ ස්ථිර පත් වීම් ලබා දී නැති බවත් පෙන්වා දෙන ලදී. විදුලි කාර්මික පුහුණුව , රියදුරු, සහ ආයුර්වේද පුහුණු සඳහා යොමු කර තිබුණත් ඔවුන් කිසිවෙකු සෞඛ්‍ය කම්කරුවන් ලෙස යොමු කර නොමැති බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

කාර්යාල කාර්ය සහයක තනතුර සඳහා පත් කරන්නේ සාමාන්‍ය පෙළ විභාගය සමර්ථ වූවන් පමණක් බැවින් මේ වැඩසටහන යටතේ පත් වීම් ලබන කිසිවෙකුටත් ඒ තනතුරේ කාර්යන් සිදු කිරීමේ හැකියාව නොමැති බැවින් ඒ තනතුරු වෙනස් කිරීමේ හැකියාවක් ගරු සභාපතිතුමාට තිබේද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔවුන් පුහුණුව සඳහා යොමු කරන ලද තනතුරට පරිබාහිරව වෙනත් තනතුරු සඳහා ඔවුන් සේවයේ යොදවා ගැනීමේ හැකිවක් නොමැති බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.07)

සභාවේ ඇතැම් තනතුරු සඳහා පුරප්පාඩු ඇතිවා සේම මුදල් රෙගුලාසි අංක 71 යටතේ අලුතින් තනතුරු කීපයක් ඇති කිරීමේ අවශ්‍යතාවයත් තිබෙන බැවින් තමන් විසින් පළාත් පාලන කොමසාරිස් මඟින්

රැකියා ලක්ෂයේ පත් වීම් මඟින් හෝ මේ පුරප්පාඩු සපුරා ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලුම් කර ඇති බවත් නමුත් තවමත් ඒ සම්බන්ධයෙන් සාර්ථක පිළිතුරක් ලැබී නොමැති බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

පවතින ආර්ථික අර්බුදය හමුවේ තවත් අලුත් බඳවා ගැනීම් සිදු කර ඔවුන් සඳහා වැටුප් ගෙවීම මේ අවස්ථාවේ කිසිසේත්ම ප්‍රායෝගික නොවන බවට තමන් විශ්වාස කරන බවත් පවතින තත්වය හමුවේ රැකියා ලක්ෂයේ ව්‍යාපෘතියෙන් බඳවා ගෙන ඇති පිරිස් යොදවා මේ අවශ්‍යතා සපුරා ගැනීම වඩාත් කාලෝචිත බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කම්කරුවන් ලෙස බඳවා ගන්නා පුද්ගලයන් බහුතරයක් දිගටම රාජකාරී කටයුතු සඳහා වාර්තා නොකරන බවත් එම ස්ථානයේ සිදු කළ යුතු කාර්යන් අනුව නියමිත සේවක පිරිස දිනපතා සේවයට වාර්තා නොකරන විට දෛනික කටයුතු සඳහා බාධා පැමිණෙන බවත් පැවසීය. එසේම වර්තමානය වන විට පවතින ඉන්ධන ගැටළුව හේතුවෙන් බොහොමයක් සේවකයන්ට එම රැකියාව සඳහා පැමිණීමට ක්‍රමවේදයක් නොමැති වීම මත ඇතැම් සති වල සේවකයන් දෙදෙනෙකුගෙන් පමණක් එම කාර්යන් කළමනාකරණය කිරීමට සිදු වූ බව පැවසීය. සභාවේ ප්‍රධාන කාර්යන් වලින් එකක් වන කසළ එක් රැස් කිරීමේ කාර්ය නිසි ආකාරයෙන් සිදු නොවුනහොත් එය විශාල ගැටළුවක් වන බවත් පෙන්වා දෙන ලදී. ඒ අනුව පවතින සේවක හිඟය හේතුවෙන් නව බඳවා ගැනීමක් සිදු කරනවා මිස අතිරික්ත සේවකයන් බඳවා ගැනීමේ අරමුණින් මේ කාර්ය සිදු නොකල බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

මේ බඳවා ගැනීම් සම්බන්ධයෙන් විරුද්ධ නොවන බවත් නමුත් අද වන විට රැකියා ලක්ෂය මඟින් බඳවා ගත් පිරිස් විශාල වශයෙන් මේ කාර්යාල පරිශ්‍රයේ කිසිදු කාර්යක් සිදු නොකර නිකරුණේ රැඳී සිටීම හේතුවෙන් අතිරික්ත සේවකයන් පිරිසක් බඳවාගෙන නිකරුනේ ඔවුන්ට වැටුප් ගෙවමින් රඳවා තබා ගෙන සිටින බවට වැරදි මතයක් සමාජය තුළ පැතිරෙන බව පෙන්වා දෙන ලදී. එසේම මේ වන විට මධ්‍යම රජය මඟින්ද කොන්ත්‍රාත් පදනම මත කිසිදු නව පත් වීමක් ලබා නොදෙන ලෙස දැනුවත් කර ඇති නිසා මේ ආකාරයෙන් නව බඳවා ගැනීම් සිදු කළහොත් එයට මහජන විරෝධයක් එල්ල විය හැකි බැවින් කල්පනාකාරීව කටයුතු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

විදුලි කාර්මිකයන් 04 දෙනෙකු පුහුණුව සඳහා යොමු කර ඇති බවත් ඔවුන් බොහෝ අවස්ථා වල පහත මාලයේ ඇති විදුලි කාමරය අසල ගැවසෙන බැවින් කිසිදු කාර්යක් සිදු නොකර ඔවුන් නිකරුණේ කාලය ගත කරන බවට වැරදි අවබෝධයක් ඇතැම් පිරිසකට ඇති විය හැකි බව පැවසීය. එසේම රැකියා ලක්ෂය යටතේ රියදුරන් දෙදෙනෙකු මේ කාර්යාලය වෙත යොමු කර ඇති බවත් ඔවුන්ගෙන්ද රියදුරු පුහුණුව හැර වෙනත් කාර්යක් සිදු කරවා ගැනීමේ හැකියාවක් නොමැති බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මේ ආයතනයේ යම් තනතුරක් සඳහා පුරප්පාඩුවක් පවතී නම් එය ප්‍රසිද්ධ කර සම්මුඛ පරීක්ෂණයක් මඟින් එකී බඳවා ගැනීම් සිදු කිරීම කළ යුතු බවත් පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් ආයතනයක් වශයෙන් අනාගතයේ විශ්‍රාම වැටුප් හිමි වන රැකියාවක් සඳහා බඳවා ගැනීමේදී ඒ සඳහා අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියා පටිපාටිය එය සිදු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. නමුත් අද වන විට සිදු වන්නේ ගරු සභාපතිතුමා විසින් කවුරු හෝ පුද්ගලයෙකුගේ නමක් සහ ලිපිනයක් සහිතව පුරප්පාඩුව ඇති තනතුර

සඳහා එම නම යෝජනා කිරීමත් මහා සභාවේදී මන්ත්‍රීවරුන් විසින් එම බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීමක් බවත් පැවසූ එතුමා අදාල පුද්ගලයා එකී තනතුරේ කාර්යන් සිදු කිරීම සඳහා සුදුසු ශාරීරික මානසික යෝග්‍යතාවයකින් පසුවන්නේද යන්නවත් නොදන්නා බව පෙන්වා දෙන ලදී. එම නිසා අදාල තනතුරේ ඇති පුරප්පාඩුව පළමුව ප්‍රසිද්ධ කර මේ කාර්ය සිදු කළ යුතු බවත් වර්තමානය වන විට පවතින ආර්ථික අර්බුදය හමුවේ සිටින සේවකයන්ගෙන් මේ කාර්ය සිදු කර ගන්නවා විනා නව බඳවා ගැනීමක් සිදු කිරීම කිසිසේත් සුදුසු නොවන බව පෙන්වා දෙන ලදී. භාණ්ඩාගාරයට දැරිය නොහැකි පිරිසක් රැකියා ලක්ෂය මඟින් බඳවා ගෙන ඇති බවත් පැවසූ එතුමා රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගනු ලැබූ පුද්ගලයන්ට පවරනු කාර්යන් සිදු කළ නොහැකි නම් ඔවුන් මේ ආයතනය තුළ රඳවා තබා ගැනීමේ කිසිදු අවශ්‍යතාවයක් නොමැති බව පැවසීය. සභාවේ පොදු අරමුදලින් මේ වන විටත් රුපියල් ලක්ෂ 09 කට ආසන්න මුදලක් අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන් සඳහා ගෙවනු ලබන බවත් මේ අවස්ථාවේ තවත් වැය බරක් ඒ මත පැටවීම යෝග්‍ය නොවන බවත් පෙන්වා දෙන ලදී. මේ බඳවා ගැනීමේ ක්‍රියාදාමය සාධාරණ නොවන බවත් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති ආකාරයත් සාධාරණ නොවන බවත් මේ පවතින අර්බුදකාරී අවස්ථාවේදී නව බඳවා ගැනීම් සඳහා යොමු වීමත් සාධාරණ නොවන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

සෞඛ්‍ය කම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් නමක් පමණක් යෝජනා කර ඇති බවත් පෙර අවස්ථා වලදි මෙන්ම ඒ සඳහා සම්මුඛ පරීක්ෂණයක් සිදු කර නොමැති බවත් පැවසීය. අද වන විට රාජ්‍ය සේවය රටට බරක් බව පවසා ඔවුන්ට විදේශගත වීමට අවස්ථාව සලසා දී ඇති බවත් එවැනි පසුබිමක රැකියා ලක්ෂය වැඩසටහන යටතේ බඳවා ගත් පිරිස මේ වන විට වසරකට වඩා වැඩි කාලයක් පුහුණුවීම් සඳහා යොදවා ඇති බවත් පෙන්වා දෙන ලදී. සාමාන්‍ය ක්‍රමවේදය යටතේ පුහුණු කාල සීමාව ලෙස වෙන් කරනු ලබන්නේ මාස 06 ක කාලයක් බවත් එම කාලය ඉක්මවා මේ පිරිසි පුහුණු කරවීම සිදු කර ඇති බවත් පැවසූ එතුමා දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් මේ ආකාරයට විශාල පිරිසක් බඳවාගෙන ඔවුන් සඳහා මහජන මුදලින් ගෙවීම් සිදු කිරීම කිසිසේත් සාධාරණීකරණය කළ නොහැකි බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා සහ ගරු මන්ත්‍රීනී අජන්තා සුමනදාස මැතිණිය සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.19)

රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගනු ලැබූ පිරිසි විදුලි බල මණ්ඩලයට , ජල සම්පාදන මණ්ඩලයට, පළාත් පාලන ආයතන වලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා බඳවා ගන්නා බවට පෙර අවස්ථා වලදී සඳහන් කර ඇති බවත් එකී ආයතන හරහා පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් සිදු කරනු ලබන ව්‍යාපෘති වලදී අවශ්‍ය ශ්‍රම දායකත්වය මොවුන් මඟින් ලබා දීමට සූදානම් කර තිබූ බවත් පැවසූ එතුමා අද වන විට මේ කාර්යන් සිදු නොකර අලුතින් බඳවා ගැනීම සඳහා යෝජනා ගෙන ඒම කිසිසේත්ම සාධාරණ නොවන බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්‍රම් චන්දන මැතිතුමා:**

දෛනික ගෙවීම් මත බඳවා ගනු ලබන සේවකයෙකුගේ දිනක වැටුප ආසන්න වශයෙන් කොපමණ මුදලක් වනවාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

රු. 1020.00ක් බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්‍රම් චන්දන මැතිතුමා:**

අද වන විට පවතින ජීවන වියදම හමුවේ දීගලවත්ත වැනි දුෂ්කර ප්‍රදේශයකට දෛනිකව සේවයට වාර්තා කිරීම සඳහා එම ප්‍රදේශයට පොදු ප්‍රවාහන සේවා නොමැති වීම මත එකී සේවකයන්ට සිය මෝටර් සයිකල් සඳහා ඉන්ධන වියදමත් දෛනික වැටුපට වඩා වැඩියෙන් වියදම් විය හැකි බව පෙන්වා දෙන ලදී.

බඳවා ගනු ලබන සේවකයන් බොහොමයක් ඉතාමත් කෙටි කාලයකදී නැවත සේවයට නොපැමිණීමට මෙයත් යමතාක් දුරකට හේතු විය හැකි බව පැවසූ එතුමා එම සේවකයන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීම හෝ ආසන්න ප්‍රදේශ වල අය සේවයට යොදවා ගෙන හෝ යම් ස්ථිරසාර විසඳුමකට යොමු වීම වඩාත් කාලෝචිත බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මේ ස්ථානයේ කාර්යන් අඛණ්ඩව පවත්වාගෙන යායුතු බැවින් ගරු සභාපතිතුමා විසින් මේ ආකාරයෙන් නව බඳවා ගැනීමකින් හෝ ඒ කාර්ය සම්පූර්ණ කිරීමට පියවර ගැනීමට ක්‍රියා කිරීම එක් අතකින් සාධාරණ බවත් නමුත් මීට පෙර සිටම මේ ආකාරයට බඳවා ගනු ලැබූ පුද්ගලයන් කිසිවෙකු සම්බන්ධයෙන්වත් විශ්වාසයක් තැබීය නොහැකි වූ බැවින් නැවත මේ ආකාරයෙන් බඳවා ගනු ලබන පුද්ගලයා දිගු කාලයක් මේ තනතුරේ සේවය කරනු ඇති බවට වගකීමකින් ප්‍රකාශ කිරීමේ හැකියාවක් ඇතිද යන්න විමසා සිටියේය. අඩු තරමින් මේ බඳවා ගන්නා පුද්ගලයා දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ආසන්නයේ ඇති වසම් නියෝජනය කරනු ලබන කිසිදු මහජන නියෝජිතවරයෙකු මේ වන තෙක් පෞද්ගලිකව නොදන්නා බැවින් නැවත වරක් සිය අභිමතය පරිදි මේ ආකාරයට බඳවා ගැනීමක් සිදු කිරීමෙන් යම් දේශපාලනිත අවශ්‍යතාවයක් ඉටු කර ගැනීමට ක්‍රියා කරන්නේද යන් ගැටළුව උද්ගත වන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මේ බඳවා ගැනීම සාධාරණ බවත් මේ ආකාරයෙන් හෝ එම කාර්ය සිදු කිරීම අවශ්‍ය බව පෙන්වා දෙන ලදී. මේ පුරප්පාඩුව සඳහා පළාත් සභාවෙන් ඉල්ලීම් සිදු කර බඳවා ගැනීමක් සිදු කළහොත් ඇතැම් අවස්ථාවක පිට පළාතක පුද්ගලයෙකු මේ සඳහා යොමු කිරීමට ඉඩ ඇති බවත් එමඟින් මේ වසම් 39 තුළ සිටින පුද්ගලයෙකුට රැකියාවක් ලබා ගැනීම සඳහා ඇති අවස්ථාව අහිමි වී යා හැකි බවත් පෙන්වා දෙන ලදී. මෙය තම පෞද්ගලික අදහස බවත් වෙන්ත මන්ත්‍රීවරුන් මේ සම්බන්ධයෙන් විවිධ අදහස් දරනවා විය හැකි බවත් පැවසූ එතුමා මෙවැනි බඳවා ගැනීමක් සඳහා නමක් ඉදිරිපත් කරන විට අදාල වසමේ මන්ත්‍රීවරයා දැනුවත් කිරීම සිදු විය යුතුය යන මතයේ තමන්ද සිටින බව පවසා සිටියේය. රැකියා ලක්ෂය වැඩසටහන යටතේ බඳවා ගත් පිරිස කිසිදු කාර්යක් සිදු නොකර මේ ස්ථානයේ කාලය ගත කරන බවත් පසුගිය දිනක තමන් කාර්යාලයට පැමිණෙන අවස්ථාවේ පිළිගැනිමේ නිලධාරී කවුළුව අසල මේසයේ උඩ එම සේවකයෙක් අසුන් ගෙන සිටි බවත් කාර්යාලයට පැමිණෙන සේවා ලාභීන් මේ සිද්ධීන් දුටු විට එය අශෝභන දර්ශනයක් බැවින් මේ සේවකයන්ට එම ස්ථානයේ රැඳී නොසිටින ලෙස අවවාද කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

රැකියා ලක්ෂයේ වැඩසටහනින් එවන ලද තිදෙනෙක් දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කළ බවත් ටික දිනකින් ඔවුන් සේවයට පැමිණීම නතර වූ බවත් පැවසීය. කෙසේ වුවත් මේ ස්ථානයේ කාර්යන් අඛණ්ඩව පවත්වාගෙන නොගියහොත් මුළු පද්ධතියම අක්‍රිය වන බවත් එම නිසා ඒ කාර්යන් වෙනුවෙන් කෙසේ හෝ සේවකයන් යොමු කිරීමේ ගැටළුවකට තමන් මුහුණ දී සිටින බවත් පවසා සිටියේය. දැනට සිටින සේවකයන්ගේ දෛනික පැමිණීම දුර්වල මට්ටමක පවතින බවත් එය 50%ක වත් ප්‍රගතියක් නැති තත්වයක් බවත් පැවසූ එතුමා එබැවින් තම වසම් වල මේ තනතුරු සඳහා සුදුසු යම් අයෙකු වේ නම් ඔවුන්ගේ අයදුම්පත් තමන් වෙත යොමු කරන ලෙස දන්වා සිටියේය. කාරක සභා රැස්වීම් සඳහා පැමිණෙන විට හෝ දීගලවත්ත කසළ අංගනයට ගොස් ඒ ස්ථානය පරීක්ෂා කරන ලෙසත් දුඟද පාලනය කරගෙන නමුත් එම කැළිකසළ මධ්‍යයේ සිට දිවා ආහාරය පවා ලබා ගනමින් එම ස්ථානය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා එම සේවකයන් සිදු කරනු ලබන කැප කිරීම පරීක්ෂා කර බලන ලෙස සියළුම මහජන නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටින ලදී. මේ සේවකයා මාස 04 ක කාලයක් එම ස්ථානයේ පුහුණුව සඳහා යොදවා තිබූ බවත් එම කාලයෙන් පසුව ඔහු මේ සඳහා බඳවා ගැනීමට තීරණය කළ බවත් පැවසූ එතුමා එම ස්ථානය සුවදායී ආකාරයෙන් සේවය කළ හැකි ස්ථානයක් හෝ මේ තනතුර සුවදායී ලෙස ක්‍රියා කළ හැකි තනතුරක් හෝ නොවන බවත් සිටින්නා වූ සේවකයන් අප්‍රමාණ කැපකිරීමකින් ම

ස්ථානය ක්‍රමානුකූලවත් පිරිසිදුවත් පවත්වාගෙන යාමට කරනු ලබන කැප කිරීම එම ස්ථානය පරීක්ෂා කිරීමෙන්ම අවබෝධ කර ගන්නා ලෙස මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින ලදී. 2015 සිට එම ස්ථානයට බඳවා ගත් කිසිදු සේවකයෙකු ස්ථිර කර නොමැති බවත් නමුත් දෛනික වැටුපට හෝ සේවය කරමින් එම ස්ථානය ක්‍රමවත්ව පවත්වා ගැනිමට මොවුන ක්‍රියා කරන බවත් පැවසීය. තමන් සහ ලේකම්තුමා සතියක් පාසා එම ස්ථානය නිරීක්ෂණය කරන බවත් එම ස්ථානයට ආසන්න පදිංචිකරුවෙකු මේ ආකාරයට බඳවා ගැනීමෙන් ඉන්ධන නොමැති අවස්ථා වලදී හෝ සේවයට වාර්තා කිරීමේ හැකියාව ඇති බැවින් මේ තීරණය ගත්තා මිසක තමන්ට අදාල සේවකයා සමඟ වෙනත් පෞද්ගලික හිතවත්කමක් නොමැති බවත් පෙන්වා දෙන ලදී. පසුගිය දිනක සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා මේ ස්ථානය පරික්ෂා කළ අවස්ථාවේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ හොඳම කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ලෙස දීගලවත්ත කසළ මධ්‍යස්ථානය නම් කළ හැකි බවට එතුමා ප්‍රකාශ කළ බවත් ඒ ගෞරවය රැකගෙන කටයුතු කිරීම අපගේ වගකීම බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රීනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 10.31)

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

කසළ අංගනයට සේවකයන් බඳවා ගැනීමේදී ගරු මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා සඳහන් කළ පරිදි රු. 1020.00 මුදකට සේවකයෙකු බඳවා ගත නොහැකි බවත් එම ස්ථානයට අවස්ථා කීපයකදී තමන් ඇතුළු මන්ත්‍රීවරු බොහොමයක් ගොස් ඇති බැවින් ගමන් මාර්ගයේ ඇති දුෂ්කරතාවය අවබෝධ වන බවත් පවසා සිටියේය. පසු ගිය කාලයේ එම ස්ථානයෙන් කසළ මධ්‍යස්ථානය ඉවත් කර ගැනීම සඳහා නොයෙකුත් ක්‍රියා මාර්ග ගනු ලැබූ බවත් ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා ඇතුළු මන්ත්‍රීවරු බොහොමයක් විසින් ඒ සඳහා විශාල අරගලයක් දියත් කළ බවත් සිහිපත් කළ එතුමා එම කසළ මධ්‍යස්ථානය සඳහා වෙනත් ස්ථානයක බිම් කොටසක් වෙන් කර දිගවත්ත ප්‍රදේශයේ එම ස්ථානයේ හෝටලයක් ඉදි කිරීමක් සම්බන්ධයෙන්ද කතා වූ බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රීනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.32)

ස්වභාවික පිහිටීම අතින් එම ස්ථානයේ තිබෙන රමණීය පරිසරය සභාවට ඉතාමත් වැදගත් ආදායම් උත්පාදක මාර්ගයක් ලෙස භාවිතා කළ හැකි බැවින් එම ස්ථානයේ හෝටලයක් ඉදි කිරිම සම්බන්ධයෙන්ද අවධානය යොමු වූ බව පවසා සිටියේය. එම නිසා නැවත ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සිදු කළ යෝජනාව සම්බන්ධයෙන් තමන්ද එකඟ වන බවත් දීගල වත්ත වැනි ස්වභාව සෞන්දර්යයෙන් අනූන ස්ථානයක් මෙවැනි කාර්යක් සඳහා සඳහා යොදවා ගැනීම පිළිබඳව තමන් එදත් විරුද්ධ වූ බවත් අදත් ඒ සම්බන්ධයෙන් තමන්ගේ ප්‍රතිචාරය එම කසළ මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට ගැනීම සුදුසු බව බවත් පවසා සිටියේය. නමුත් පසුගිය වසර වලට වඩා මේ වන විට එම ස්ථානයේ යම් ආකාරයක පිළිවෙලක්, කළමනාකරණයක් දක්නට ලැබෙන බවත් ඒ සම්බන්ධයෙන් සතුටු විය හැකි බවත් පවසා සිටියේය. අද දින නව බඳවා ගැනීමක් සඳහා යෝජනා කර ඇති පුද්ගලයා තමන් නියෝජනය කරනු ලබන වසමේ පදිංචිකරුවෙකු වුවත් තමන් ඔහු නොදන්නා බවත් ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සඳහන් කළ ආකාරයට යම් බඳවා ගැනීමක් සිදු කරන අවස්ථා වලදී අදාල වසමේ මන්ත්‍රීවරයා හෝ දැනුවත් කරන්නේ නම් වඩාත් සුදුසු බවට තමන්ද අදහස් කරන බව පවසා සිටියේය. විපක්ෂයේ මනත්‍රීවරුන් පුන පුනා ප්‍රකාශ කරන්නේ පෞද්ගලිකව මේ ස්ථානයට හෝ සේවකයාට යම් විරුද්ධ වීමක් නොවන බවත් ගරු සභාපතිතුමා විසින් දිගින් දිගටම සිදු කරනු ලබන බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගයේ ඇති වරද බවත් පෙන්වා දෙන ලදී. අද වන විට රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගනු ලැබූ පිරිස හේතුවෙන් ඔවුන්ට දීමනා ගෙවීම් හේතුවෙන් රට පවතින අර්බුදකාරී අවස්ථාවේ එය වඩාත් දරුණු තත්වයකට ළඟා වීමට හේතු වී ඇති බව පැවසූ එතුමා එවැනි තත්වයක් යටතේ මේ සභාවටත් නව බඳවා ගැනීම් සිදු කිරීම අවශ්‍යද යන්න සිතා බැලිය යුතු බව පෙන්වා දෙන ලදී. එසේම රැකියා ලක්ෂය යටතේ බඳවා ගනු ලැබූ පිරිස් මේ කාර්යාලය තුළ හැසිරෙන

ආකාරය සම්බන්ධයෙන් තමන්ද සතුටු නොවන බවත් ඔවුන්ගේ ස්වයං විනය සම්බන්ධයෙන් මීට වඩා සුපරික්ෂාකාරී විය යුතු බව පවසා සිටියේය. කාර්යාලයට පැමිණෙන අවස්ථාවේදීම ඒ ආකාරයෙන් රංචු ගැසී සිටීම අශෝභන බවත් කාර්යාලය තුළ සිටින උපාධිධාරීන්ගේ පටන් අනිකුත් සියළුම නිලධාරීන් සමඟ ඊට වඩා සුහදත්වයෙන් අවශ්‍ය ඕනෑම කාර්යක් සිදු කර ගැනීමේ හැකියාව ඇති බවත් පැවසීය. මේ තත්වය මේ කාර්යාලයට පමණක් නොවන රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගනු ලැබූ පිරිස් අනියුක්ත කර ඇති බොහෝ ආයතන වල මේ තත්වය දක්නට ලැබෙන බවත් ප්‍රකාශ කර සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

අවශ්‍යතාවය මත සේවකයන් බඳවා ගැනීම සිදු කළ යුතු බවත් නමුත් එය සිදු විය යුත්තේ ක්‍රමවත් ආකාරයකට බවත් පැවසීය. කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවකයන් සේම සෞඛ්‍ය කම්කරුවන් ඇතුළු පිරිස් සිදු කරනු ලබන කාර්ය සුළු පටු නොවන බවත් ඔවුන් ඉතා අසීරු කාර්යක් සිදු කරනු ලබන පිරිසක් බවත් පවසා සිටියේය. එසේම රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගනු ලැබූ පිරිස් හේතුවෙන් මහජන නියෝජිතවරුන්ගේ ගරුත්වය හානියට ලක්ව ඇති බවත් පසු ගිය මැයි 09 වෙනි දින සිදු වූ සිදුවීමෙන් පසු දැන් එය සමස්ථ රට තුළම දක්නට ඇති තත්වයක් බවත් පවසා සිටියේය. සභාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයන් කවුරුන්ද යන්න කාර්ය මණ්ඩලයේ අනිකුත් නිලධාරීන් දැනුවත්ව සිටියත් මොවුන්ගේ ඇතැම් පිරිස් ඒ බව නොදන්නා බව පෙනී ගොස් ඇති බව පැවසීය. එම නිසා මහජන නියෝජිතයන් පැමිණීමේදී ඔවුන් මේ සභාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයින් බවට අඩු තරමේ පිළිගැනීමේ කවුළුව අසල සිටින පිරිස් දැනුවත් කර සිටින්නේ නම් වඩාත් සුදුසු බව පවසා සිටියේය.එසේම සේවාලාභීන් සඳහාත් මේ පිරිස මඟින් සිදු විය යුතු සේවය නිසි ආකාරයට සිදු විය යුතු බවත් අනිකුත් පුද්ගලයන් සඳහා අප විසින් ගරුත්වය ලබා දෙන්නේ නම් ඔවුන් විසින් ඒ ගෞරවය අපටද ලබා දිය යුතු බව පැවසීය.

(ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 10.37)

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ මේ ආයතනය සඳහාත් සේවකයන් බොහෝ පිරිසක් යොමු කර ඇති බව පැවසීය. ගරු සභාපතිතුමා බලයට පත්වූ දිනයේ සිට මේ සභාව සඳහා සිදු කර ඇති සේවා දෙස බැලීමේදී ඉතාමත් වැදගත් පියවර රාශියක් ගෙන ඇති බවත් දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වර්තමාන තත්වයත් ඒ සිදු කරන ලද කාර්යන්ගේ සාර්ථකත්වය පිළිබිඹු කරන එක් අවස්ථාවක් බවත් පවසා සිටියේය. ඒ ආාකාරයට සේවක බඳවා ගැනීම් සම්බන්ධයෙන්ද නිසි කළමනාකාරිත්වයක් ඇතිව කටයුතු කරමු යැයි පවසා සිටියේය. අදාල පුරප්පාඩු සඳහා රැකියා ලක්ෂයේ වැඩසටහනෙන් යොමු කර ඇති පිරිසගෙන් කොටසක් බඳවා ගැනීමට අවසර ඉල්ලා අදාල අංශයන්ගෙන් ඉල්ලීම් සිදු කර ඔවුන් බඳවාගන අතිරික්ත පිරිස වෙනත් ආයතන කරා යොමු කිරීමට කටයුතු කරමු යැයි ඉල්ලා සිටින ලදී. මොවුන් පුහුණුව සඳහා යොමු ඇති බවක් පිටස්තර පුද්ගලයින් විසින් නොදන්නා බැවින් ඒ පිරිස සඳහා පැරණි සභා ගොඩනැඟිල්ලේ හෝ කාමරයක් වෙන් කර දීම සුදුසු බව පවසා සිටියේය. පිළිගැනීමේ කවුළුව අසල එක් අයෙකු පමණක් රැදී සිටීම ප්‍රමාණවත් බවත් අනෙකුත් පිරිස් ඒ අසල සිටීම උචිත නොවන බවත් පවසා සිටියේය. එසේම විදුලි කාර්මික සහයකයන් ලෙසින් පුහුණු වීම සඳහාත් පිරිසක් බඳවාගෙන ඇති බැවින් නගරය තුළ පිලිස්සී ගොස් ඇති වීථි පහන් වල තවමත් වගකීම් කාලය ඉක්ම ගොස් නැති වීථි පහන් සොයා ඒවා ගලවා නැවත රැගෙන ඒමට කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී. තම වසම තුළත් එවැනි බල්බ බොහොමයක් ඇති බැවින් විදුලි කාර්මික සහයක ලෙස පුහුණුවට යොමු කර ඇති සේවකයන් මඟින් එකී කාර්ය සිදු කිරිමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශාකාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා 2021 ඔක්තෝබර් 12 වෙනි දින සම්මත කරන ලද අය වැය ලේඛනය මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන , ආර්ථික අර්බුදය හමුවේ මිල වැඩි වීම මත ඉදිරි මාස සඳහා ප්‍රමාණවත් නොවන බැවින් පරිපූරක අය වැය ලේඛනයක් මඟින් මෙම අමතර ප්‍රතිපාදන සලස්වා ගත යුතුව ඇත. එබැවින් දෙහිඕවිට ප්‍රාදේශිය සභාවේ මූල්‍ය වියදම් දැරීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168 (3) වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව සකස් කරන ලද පරිපූරක අයවැය ලේඛනය සඳහා එකී පනතේ 168 (4) වගනන්තිය ප්‍රකාරව අනුමැතිය ලබා දිම සුදුසු බව යෝජනා කරමි. (ඇමුණුම 09)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.46)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශාකාමින්ද මැතිතුමා:**

2022 වර්ෂයේ ඉදිරි මාස වල කටයුතු සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය වන අමතර ප්‍රතිපාදන සලස්වා ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට සිදු වූ බවත් මේ වර්ෂය තුළ වරින් වර සිදු කරන ලද ඉන්ධන මිල සංශෝධන හේතුවෙන් අති දැවැන්ත මුදලක් ඉන්ධන සඳහා වියදම් කිරීමට සිදු වූ බව පෙන්වා දෙන ලදී. අද වන විට ඉන්ධන නිකුත් කිරීම සීමා කර ඇති තත්වයක් තුළ සභාවට ලැබෙන ඉන්ධන අත්‍යාවශ්‍ය සේවා සඳහා පමණක් යොදා ගැනීමට සිදු වී ඇති බව පෙන්වා දෙන ලදී. මේ හේතුවෙන් තම නිල රථයට ලැබෙන ඉන්ධන ලීටර් 50 න් ඩීසල් ලීටර් 50 ක් ලබා නොගැනීමට කටයුතු කර ඇති බවත් පැවසූ එතුමා මේ වන විට වාහන මඟින් සිදු කරන ගමන් බිමන් උපරිම මට්ටමින් සීමා කර කටයුතු කරන බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

2022 අයවැය ඉදිරිපත් කර මාස 06 කට පසු නැවත පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට සිදු වී ඇති බව පැවසීය. පවතින වියදම් සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සලස්වා ගැනීම සඳහා මේ ආකාරයට සිදු කිරීම සාමාන්‍යයෙන් සිදු වන බවත් පැවසීය. මෙම ඇස්තමේන්තුවේ වැටුප් ගෙවීම් සම්බන්ධ ශීර්ෂ වලට අදාල වියදම් සම්බන්ධයෙන් පැහැදිලි කර දක්වා ඇති බැවින් එහි ගැටළුවක් නොමැති බවත් නමුත් 101 (09) 2 (i) හි පුහුණු පාඨමාලා හා පුහුණු වැඩසටහන් යටතේ රුපියල් ලක්ෂයක මුදලක් වෙන් කර ඇතත් ඊට අමතරව රු.60,000.00 ක මුදලක් වෙන් කිරීමට අවශය බව දක්වා තිබෙන බවත් පෙන්වා දුන් එතුමා 2021 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා සම්පූර්ණයෙන්ම වියදම් වී ඇත්තේ රු.57,000.00 ක මුදලක් බව පෙන්වා දෙන ලදී. 2022 වර්ෂය සඳහා රුපියල් ලක්ෂයක් වෙන් කර තිබියදීත් තවත් අමතර රු. 60,000.00 ක මුදලක් මේ කාර්ය සඳහා වෙන් කර ඇත්තේ කුමන පුහුණු වැඩසටහනක් වෙනුවෙන්ද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශාකාමින්ද මැතිතුමා:**

කාරක සභාවක් බවට පත් කර මේ කරුණු සියල්ල පැහැදිලි කර ගනිමු යැයි පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ගරු සභාපතිතුමාට අවශ්‍ය බැවින් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ බවත් ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කර ගැටළු නිරාකරණය කර ගැනීමට විපක්ෂයට අවස්ථාව ලබා දිය යුතු බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශාකාමින්ද මැතිතුමා:**

පරිපූරකය මගින් ඉලක්ක ගත මුදල සඳහන් කර ඇති බවත් ඒ සියළුම මුදල් වියදම් කරන බවට සඳහන් කර නොමැති බවත් පැවසීය. පුහුණු වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදලෙන් නව පත් වීම් ලැබූ ගිණුම්

නිලධාරිනියට සිය විෂයට අදාල පුහුණු වැඩසටහනක් සඳහා රු.30,000.00 ක මුදලක් වෙන් කර ඇති බවත් ඊට අමතරව විද්‍යුත් පුස්තකාලය ආරම්භ කළ පසු එයට අදාල මෘදුකාංග පුහුණුවක් සඳහා රු. 60,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා අනුමැතිය ලබා ගෙන ඇති බවත් ඒ සියළුම වෙන් කිරීම් ඇතුලත්ව මේ මුදල් ප්‍රමාණය සඳහන් කර ඇති බව පැවසීය.

( ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.50)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

කාර්ය මණ්ඩලය වෘත්තීය නිපුණයන් විය යුතු බවත් ඒ කාර්යන් සඳහා මුදල් වියදම් කිරීම සිදු කළ යුතු බවත් එම පැහැදිලි කිරීම අවබෝධ වූ බවත් පවසා සිටියේය. මේ මාස කීපය සඳහා පරිපූරකය මඟින් ගරු සභාපතිතුමා එක්කෝටි පනස් පන්ලක්ෂ විසිතුන්දහස් හාරසියයක මුදලක් ඉල්ලුම් කරන බවත් මෙයින් වැඩිම මුදලක් වෙන් කර ඇත්තේ ඉන්ධන වෙනුවෙන් බවත් පෙන්වා දෙන ලදී. ලිපි ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් ඉල්ලුම් කරනු ලබන මුදල සාපේක්ෂව අඩු මට්ටමක පවතින බවත් රටක් වශයෙන් ඩොලර් අර්බුදය හේතුවෙන් ඉන්ධන හිඟයක සිටින මේ අවස්ථාවේදී වැටුප් ගෙවා ගැනීමටවත් නොහැකි වන ලෙස රුපියල් හිඟය පවතින අවස්ථාවක මහජනතාවගෙන් ලබා ගන්නා බදු මුදල් වලින් එක්කෝටි පහළොස් ලක්ෂයක මුදලක් ඉන්ධන සඳහා යෙදවීම අවස්ථානුරූපීව කාලෝචිත නොවන බව පෙන්වා දෙන ලදී. එසේම මේ අවස්ථාවේ වාහන ධාවනයේ යෙදවීම සීමා කර ඇති නිසා එම මුදල් ප්‍රමාණය යම් මට්ටමකින් සංශෝධනය කිරීම සුදුසු බැවින් එය සිදු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම මේ අවස්ථාව වන විට චක්‍රලේඛ මඟින්ම කාර්ය මණ්ඩල පවා සේවයට කැදවීම සීමා කිරීම තුළින් උත්සාහ ගෙන ඇත්තේ රට තුළ පවතින ඉන්ධන අර්බුදයට යම් මට්ටමකින් හෝ විසඳුමක් ලබා ගැනීමට ක්‍රියා කිරීම නිසා මේ ආයතනය තුළත් එකී ක්‍රමවේදයන්ට අනුගත වෙමින් වාහන ධාවනය සීමා කර පැමිණෙන සීමිත කාර්ය මණ්ඩලයෙන් කාර්යාල කටයුතු ක්‍රමානුකූලව කළමනාකරණය කර ගැනීමට ක්‍රියා කිරීම අපගේ වගකීම බව පවසා සිටියේය. ගරු සභාපතිතුමා තමන්ට හිමි ඉන්ධන ලීටර් 500න් 50%ක් අඩු කිරීමට පියවර ගැනීම අගය කරන බවත් නමුත් එය තමන්ට හිමි ප්‍රමාණයෙන් 10%ක තරම් ප්‍රමාණයක් පමණක් වන නිසා මීටත් වඩා යම් තරමක් අඩු කළ හැකි නම් එය වඩාත් සුදුසු බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වන බව පවසා සිටියේය.එසේම 104 (i) යටතේ යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව සඳහා ලක්ෂ අටක මුදලක් පවතිද්දී අමතරව රු.1,650,000.00 ක මුදලක් වෙන් කර ගෙන ඇති බවත් මෙතරම් වාහන අලුත්වැඩියා කිරීමට සිදු වන්නේදැයි විමසා සිටියේය. වාහන අලුත් වැඩියා කිරීම් සඳහා ගෙවනු ලබන බිල්පත් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීමට පෙර මේ කරුණු සම්බන්ධයෙන් සොයා බලන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය. එසේම 304 (i) සඳහාත් 2022 වර්ෂයට වෙන් කරගෙන ඇති ලක්ෂ 12 ක මුදලට අමතරව තව රුපියල් ලක්ෂ 08 ක මුදලක් ඉල්ලා තිබෙන අතර වර්ෂය අවසන් වීමට තව ඇත්තේ මාස 06 ක කාලයක් බැවින් එතරම් මුදලක් අවශ්‍ය වෙනවාද යන්න විමසා සිටියේය. සෑම මහා සභා රැස්වීමකම පොදුවේ විපක්ෂය හා ආණ්ඩු පක්ෂය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරු බොහෝ පිරිසක් සිය වසම් වල වීථි පහන් අලුත්වැඩියා කටයුතු සහ නව පහන් සවි කිරීම් සම්බන්ධයෙන් ඉල්ලීම් සිදු කරන බවත් පසු ගිය මහා සභා රැස්වීමේත් මේ සම්බන්ධයෙන් විමසීම් කළ මන්ත්‍රීවරයෙකුට අදාල කාර්ය සිදු කර දෙන ලෙස විදුලි කාර්මිකට නියෝග කළ බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කළ බව සිහිපත් කළ එතුමා මේ වන තෙක් එම කටයුතු සිදු වී නොමැති බව පැවසීය. එසේ තිබියදීත් තව මිලදී ගැනීම් සිදු කරන්නේ කුමන හේතුවක් මතද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 වර්ෂය සඳහා වෙන් කර ගත් ප්‍රතිපාදන වලින් තවමත් විදුලි උපකරණ මිලදී ගැනීමට තිබෙන බවත් නමුත් අනපේක්ෂිත ලෙස සිදු වූ මිල වැඩි වීම් හේතුවෙන් අදාල මුදල් ප්‍රමාණවත් නොවන තත්වයක් ඇති වී තිබෙන බවත් පෙන්වා දෙන ලදී. එසේම වීථි පහන් දැල්වීම සහ සවි කිරීම පවතින විදුලි අර්බුදය හමුවේ සීමා කරන ලෙස දන්වා චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත් මේ කාරණා හේතුවෙන් අලුතින් වීථි පහන් සවි කිරීම තාවකාලිකව නවතා ඇති බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ඉන්ධන සඳහා වෙන් කර ඇති මුදල අඩු විය යුතු බවට තමන් පෞද්ගලිකව විශ්වාස කරන බවත් අනෙකුත් මන්ත්‍රීවරුන්ගේද අදහස් විමසා බලා යම් සංශෝධනයක් සිදු කළ හැකි නම් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පසු ගිය වර්ෂ වලත් මේ ආකාරයට පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට සිදු වූ අවස්ථා තිබූ බවත් එම අවස්ථා වලදී වුවත් ඉදිරිපත් කරන ලද වියදම් හැකි තරම් සීමා කරමින් කටයුතු කිරීමට ක්‍රියා කළ බවත් පැවසීය. මෙහිදී යම් ඉලක්ක ගත මුදලක් අනුමත කර ගැනීමක් සිදු කළත් ඒ සියළුම මුදල් වියදම් කිරීමක් සිදු නොවන බවත් වියදම් සීමා කරගෙන අවශ්‍ය කාර්යන් සිදු කිරීමට කැප වී ක්‍රියා කරන බවත් පවසා සිටින ලදී. සෑම වියදම් කාර්යක්ම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යොමු කරන බවත් එසේම සෑම මාසයකම සිදු කරන ලද මාසික වියදම් සම්බන්ධ වාර්තාවක් මාසිකව සියළුම මන්ත්‍රීවරුන් වෙත ලබා දෙන ලෙස ඒවා එකින් එක පරීක්ෂා කිරීමේ හැකියාව තිබෙන බවත් පෙන්වා දෙන ලදී. අද වන විට සභාව සතු වාහන අත්‍යාවශ්‍ය කාරණයයක් සඳහා වන ස්ථාන පරීක්ෂාවක් ආදියට යෑම සඳහා පමණක් භාවිතා කරන අතර අනෙකුත් සියළුම ගමන් සීමා කර ඇති බවත් පෙන්වා දෙන ලදී. පරිපූරක ඇස්තමේන්තුව තුළ මේ ආකාරයට මුදල් ඉලක්ක ගත කර තිබුණත් අද වන විට ගිණුමේ ඇත්තේ රුපියල් ලක්ෂ විස්සක පමණ මුදලක් බවත් එම මුදලට අනුව පිරිමසා ගනිමින් මේ කාර්යන් සිදු කරන බව පැවසීය. මීට අමතරව මුද්දර ගාස්තු වරිපනම් ආදියෙන් ලැබිය යුතු මුදල්ද පවතින බැවින් මේ ආකාරයට ඉලක්ක ගත මුදලක් පෙන්වා ඇති බවත් මුදල් සංචිත ලෙස ගිණුමේ මෙතරම් මුදලක් නොමැති බවත් පැවසීය. එම නිසා අනවශ්‍ය වියදම් කපා හැර අත්‍යාවශ්‍ය කාරණා සඳහා පමණක් මුදල් වියදම් කිරීමට කටයුතු කරන බවට තමන් වගකීමෙන් ප්‍රකාශ කරන බව පැවසූ එතුමා ඉන්දන සඳහා එතරම් මුදලක් වෙන් කර ඇත්තේ පළාත් පාලන ආයතනයක් වශයෙන් කසළ එක් රැස් කිරීමේ කාර්ය දෛනිකව සිදු කිරීම මේ සභාවේ අනිාර්ය කාරණයක් වන බැවින් ට්‍රැක්ටර් රථ සඳහා ඉන්ධන ලබා දීම දෛනික සිදු කළ යුතු බැවින් බව පෙන්වා දෙන ලදී. 2022 අයවැය ඉදිරිපත් කරන අවස්ථාව වන විට ඩීසල් ලීටරයක් රු.101.00 ක මුදලකට පැවති බවත් අද වන විට එය රුපියල් 400 දක්වා වැඩි වී ඇති බවත් පෙන්වා දෙන ලදී. එකට හතර ගුණයකින් මිල ගණන් වැඩි වීම හේතුවෙන් පවතින මුදල් ප්‍රමාණවත් නොවීම මත මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් හැකි තරම් වියදම් සීමා කරගෙන කටයුතු සිදු කිරීමට උත්සාහ කරන බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

යෝජනාවේ පරිපූරක අයවැය ලෙසත් ලබා දී ඇති ලේඛනයේ පරිපූරක ඇස්තමේන්තුව ලෙසත් සඳහන් වී තිබීම එකම ආකාරයෙන් දැක්වීමට ක්‍රියා කලේ නම් වඩාත් සුදුසු බව පැවසීය. 2021 වර්ෂයේ 2022 වර්ෂය සඳහා මෙම අයවැය ලේඛනය සකස් කරන විට රට තුළ පැවති ආර්ථික සාමාජීය තත්වය වඩා හාත්පසින්ම වෙනස් තත්වයක් මේ වන විට උද්ගත වී ඇති බැවින් මේ ආකාරයෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට සිදු වීම පිළිබඳව පුදුම නොවන බව පැවසීය. රටේ පවතින ආර්ථික අර්බුදය හා බංකොලොත්භාවය හේතුවෙන් මේ වර්ෂයේ අය වැය ලේඛනයේ සඳහන් සියළුම සංඛ්‍යා ලේඛන වෙනස් වී ඇති බවත් සෑම දෙයකම මිල ගණන් ඉහළ යාම හේතුවෙන් 2022 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා මෙය ඉදිරිපත් කර ඇති බව පවසා සිටියේය. එම නිසාම මේ කාල සීමාව තුළ සභාවේ වියදම් හා නාස්තිය ඉතාමත් අවම කර ගත යුතු බවත් අද වන විටත් යම් යම් කාරණා සඳහා වන වියදම් ප්‍රමාණයන් උචිත නොවන මට්ටමෙන් අධික වීමක් දක්නට ලැබෙන බව පෙන්වා දෙන ලදී. ප්‍රාග්ධන වත්කම් නඩත්තුව යම් මට්ටමකින් කඩා වැටුණහොත් එය ආරක්ෂා කර ගැනීම අවශ්‍ය බවත් නමුත් ආයුර්වේදයේ ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම් ආදිය සඳහා වෙන් කර ඇති මුදල් මේ අවස්ථාවේ අනවශ්‍ය වියදම් ලෙස තමන් දකින බව පෙන්වා දෙන ලදී. එම නිසා මේ මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය පැහැදිලිව විස්තර කර තිබීම අත්‍යාවශ්‍ය බව පෙන්වා දෙන ලදී. 2023 වර්ෂය වන විට මේ සභාවට මොනවා වේදැයි පැවසිය නොහැකි තත්වයක සිටින අවස්ථාවේදී පවතින මුදල් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම අප සැමගේ වගකීම බව

පෙන්වා දෙන ලදී. සභාවේ ලිපි ද්‍රව්‍ය සඳහා ලක්ෂ අටකට වැඩි මුදලක් වෙන් කර ඇති බවත් මේ වියදම් අවම කර ගැනීමට ක්‍රියා කිරීම අප සැමගේ වගකීම බවත් පැවසීය. අ වන විට ලිපියක් යැවීම සඳහා ලියුම් කවර මුද්දර සහ ලිපි යැවීම සඳහා උපයෝගී කර ගන්නා කඩදාසි ආදී සියල්ලටම වන වියදම දෙස බැලූවිට එක් ලිපියක් යැවීම සඳහා විශාල මුදලක් වැය වන බවත් මේ අවස්ථාවේ වියදම් සීමා කිරීම සඳහා දුරකථන මාර්ගයෙන් පණිවිඩ ලබා දීම, මෙන්ම අනෙකුත් තාක්ෂණික ක්‍රමවේද මාර්ගයෙන් පණිවිඩ ලබා දීම ආදී විකල්ප සඳහා යොමු වීමට සිදුව ඇති බවත් එමඟින් වන වියදම් පාලනයට හුරු විය යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ලිපි ද්‍රව්‍ය සඳහා වන අධික වියදම හා වෙළඳපල තුළ කඩදාසි හිඟ වීම මත මහා සභා වාර්තා සහ න්‍යාය පත්‍රත් වට්ස් ඇප් මාර්ගයෙන් යොමු කිරීම සඳහා මීට පෙර මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කළත් මන්ත්‍රීවරුන් විසින් එය ලිඛිතව අවශ්‍ය බව ප්‍රකාශ කළ බව සිහිපත් කර සිටියේය. අද වන විට මහා සභා වාර්තා හා න්‍යාය පත්‍ර සහ කාරක සභා වාර්තා මුද්‍රණයට A 4 බන්ඩල් 08 ක් පමණ වැය වන බවත් මීට පෙර එක් බන්ඩලයක් රුපියල් පන්සියයකට මිලදී ගත්තද අද වන විට එය රුපියල් 3300.00ක් දක්වා මිල වැඩි වී ඇති බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මහා සභා වාර්තා සහ න්‍යාය පත්‍ර අනිවාර්යයෙන්ම ලිඛිතව මන්ත්‍රීවරුන් අතට පත් විය යුතු බවත් අනෙකුත් ලිපි කටයුතු සඳහා වන වියදම් දුරකථන පණිවිඩ ආදිය මඟින් ලබා දීමෙන් සීමා කර ගත හැකි බවත් පෙන්වා දෙන ලදී. එසේම විදුලිය සඳහා රුපියල් ලක්ෂ 08 ක මුදලක් වැඩිපුර ඉල්ලා සිටින බවත් නමුත් අද වන විට විදුලි පරිභෝජනය සීමා කරමින් කටයුතු කරන ලෙස විදුලි බල මණ්ඩලය විසින් ඉල්ලා ඇති බවත් සිහිපත් කර සිටියේය. එම නිසා විදුලිය භාවිතය සීමා කිරීම මඟින්ද යම්තාක් දුරකට වියදම් පිරිමසා ගත හැකි බවත් මේ මාස 06 සඳහා පුහුණු වැඩසටහන් අවශ්‍ය නොවන බවට තමන් විශ්වාස කරන බවත් පවසා සිටියේය. එසේම පළාත් සභාවෙන් අය කර ගැනීමට තවත් උසාවි දඩ හා මුද්දර ගාස්තු ලැබීම් තිබේ නම් ඒවාත් අය කරගෙන ඉදිරියේදී උද්ගත වන මූල්‍ය අර්බුදයට ශක්තිමත්ව මුහුණ දීම සඳහා සූදානම් වීම වඩාත් සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටින ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (v) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ අයවැය වාර්තාව සකස් කිරීමට අදාල කාර්යන් පහත සඳහන් අයවැය කාලසටහනට අනුව ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | විස්තරය | අවසාන ඉලක්ක දිනය | වගකිව යුතු අය |
|---|---|---|---|
| 01. | අයවැය ලේඛනය සකස් කිරීම සඳහා උපදෙස් ලේඛනය නිකුත් කිරීම. | 2022 ජුනි 03 | ප්‍රාදේශීය සභා ලේකම් |
| 02. | යෝජිත කොට්ඨාශ කමිටු,සමිති, සංවිධාන හා සභිකවරුන්ගේ යෝජනා ලබා ගැනීම. | 2022 අගෝස්තු 26 | ප්‍රාදේශීය දේශීය සභා ලේකම් /විෂය නිලධාරි |
| 03. | ආදායම් සහ වියදම් පිළිබඳ ඒ ඒ අංශ වල වාර්තා ඉදිරිපත් කිරීම. | 2022 අගෝස්තු 26 | අංශ ප්‍රධානීන් / විෂය නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| 04. | ඒ ඒ අංශ වල වාර්තා සාකච්ඡාවට ගැනීම. | 2022 සැප්තැම්බර් 09 | ප්‍රාදේශීය සභා සභාපති/ ප්‍රාදේශීය සභා ලේකම්/අංශ ප්‍රධානීන් ප්රධානීන් |
| 05. | මූලික ඇස්තමේන්තු සකස් කිරීම. | 2022 සැප්තැම්බර් 16 | ප්‍රාදේශීය සභා ලේකම්/අංශ ප්‍රධානීන් / විෂය නිලධාරීන් |
| 06. | මුදල් කමිටුවේ උපදේස ලබා ගැනීම | 2022 සැප්තැම්බර් 20 | ප්‍රාදේශීය සභා සභාපති/ ප්‍රාදේශීය සභා ලේකම්/විෂය නිලධාරීන් |
| 07. | අයවැය ප්‍රතිපත්තිය තීරණය කිරීම සහ සභාවට ඉදිරිපත් කිරීම. | 2022 සැප්තැම්බර් 22 | ප්‍රාදේශීය සභා සභාපති |
| 08. | ඒ ඒ අංශ වල අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | 2022 සැප්තැම්බර් 22 | අංශ ප්‍රධානීන් |
| 09. | අවසාන ඇස්තමේන්තු සකස් කිරීම සහ අයවැය ලේඛනය කෙටුම්පත් කිරීම. | 2022 සැප්තැම්බර් 22 | ප්‍රාදේශීය සභා ලේකම් /විෂය නිලධාරි |
| 10. | මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව විසින් කෙටුම්පත් අයවැය ලේඛනය සකසා බැලීම. | 2022 සැප්තැම්බර් 27 | ප්‍රාදේශීය සභා ලේකම් |
| 11. | අයවැය පණිවිඩය සැකසීම. | 2022 සැප්තැම්බර් 28 | ප්‍රාදේශීය සභා සභාපති |
| 12. | කෙටුම්පත් අයවැය ලේඛනය සැකසීම. | 2022 සැප්තැම්බර් 30 | ප්‍රාදේශීය සභා සභාපති |
| 13. | කෙටුම්පත් අයවැය ලේඛනය මහ සභාවට ඉදිරිපත් කිරීම. | 2022 ඔක්තෝබර් 11 | ප්‍රාදේශීය සභා සභාපති ප්‍රාදේශීය සභා ලේකම් |
| 14. | අවශ්‍ය වන්නේ නම් කෙටුම්පත් අයවැය ලේඛනය දෙවනවර ඉදිරිපත් කිරීම. | 2022 නොවැම්බර් 09 | ප්‍රාදේශීය සභා සභාපති/ ප්‍රාදේශීය සභා ලේකම් |
| 15. | අයවැය ලේඛනය මුද්‍රණය කර බෙදා හැරීම. | 2022 දෙසැම්බර් 23 | ප්‍රාදේශීය සභා ලේකම් /විෂය නිලධාරි |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රි කේ.නිශාන් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.08)

**01 (vi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

වර්තමානය වනවිට ආදාහනාගාරය සඳහා භාවිත කරනු ලබන 37kg ක ගෑස් සිලින්ඩරයක මිල රු.18,394.00 කි.එක් සිලින්ඩරයකින් පිළිස්සිය හැක්කේ මළ සිරුරු 02 ක් පමණි. එබැවින් ගෑස්වල අඛණ්ඩ මිල ඉහළයාම හේතුවෙන් වර්තමානය වනවිට මළ සිරුරු 02 ක් ආදාහනය කිරීමෙන් ගෑස් සිලින්ඩරයක්වත් මිලට ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලැබේ. මළ සිරුරු ආදාහනය කිරීමෙන් වාර්ෂිකව දළ වශයෙන් රු 3,102,500.00 ක මුදලක් ලැබෙන අතර වියදම දළ වශයෙන් වාර්ෂිකව රු 5,178,804.00 ක මුදලක් දැරීමට සිදුවේ. ඒ හේතුවෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයේ ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමට සුදුසු බව යෝජනා කරමි.

| ප්‍රදේශය | පැවති ගාස්තුව | සංශෝධනය වන ගාස්තුව |
|---|---|---|
| බල ප්‍රදේශය තුළ | රු 8,000.00 | රු 12,000.00 |
| බල ප්‍රදේශයෙන් පිට | රු 9,000.00 | රු 14,000.00 |

(මෙම සංශෝධිත යෝජනාව සඳහා ගරු සභාපතිතුමාට අමතරව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා , ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.ෆර්හාන් මැතිතුමා විසින් අත්සන් කර භාර දී ඇත.)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

ආදාහනාගාර ගාස්තු මීට වඩා අඩු කිරීමේ හැකියාවක් නොමැතිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඉදිරියේදී නැවත ගෑස් මිල වැඩි වීමක් සිදු විය හැකි බවට රාවයක් පැතිර යන බැවින් නැවත එවැන්නක් සිදු වුවහොත් ඒ සියල්ල සඳහා සූදානමින් අද දින ඉදිරිපත් කරන ලද මේ මිල ගණන් අඩු නොකර මේ ආකාරයෙන් පවත්වාගෙන යාමට කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (vii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මඟින් යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දීම සඳහා වන ගාස්තු 2022.04.22 වෙනි දින අංක 2277 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදී. එසේ වුවද මේ වන විට නැවත ආසන්න අවස්ථා දෙකකදී ( 2022.05.17 සහ 2022.05.24) ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් පවතින මිල ගණන් යටතේ යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දීම සිදු කළ නොහැකි තත්වයක් උද්ගත වී ඇත. එබැවින් යන්ත්‍ර සූත්‍ර කුලියට ලබා දීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය කර අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

(මෙම සංශෝධිත යෝජනාව සඳහා ගරු සභාපතිතුමාට අමතරව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්‍රම් චන්දන මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුධර්මා ලක්මාලි මැතිණිය විසින් අත්සන් කර භාර දී ඇත.)

| යන්ත්‍ර සූත්‍ර වර්ගය | පැවති ගාස්තුව | සංශෝධනය වන ගාස්තුව |
|---|---|---|
| ටිපර් කියුබ් 2 1/2 | 15,000.00 දෛනික ගාස්තුව/ කිලෝමීටරයකට රු.150.00 (කි.මී 100 වැඩි සෑම කිලෝ මීටරයකටම රු 100 ඉන්ධන සහිතව) | කිලෝමීටරයක් සඳහා රු.250.00 (ඉන්ධන සහිතව) |
| ට්‍රැක්ටරය(සන අඩි 75 ටේලරය සමඟ) | රු 7,000.00 (වැඩ කරන පැය 8 ක් ඉන්ධන සහිතව) | රු 15,,000.00 (වැඩ කරන පැය 8 ක් ඉන්ධන සහිතව) |

| | | |
|---|---|---|
| ගල් රෝල(පැය 4 ට අඩු අවම ගාස්තුව) පැය 4 ඉක්මවන කාලය සෑම පැයකටම | 15,000.00 (ඉන්ධන සහිතව)<br><br>3,000.00 | 20,000.00 (ඉන්ධන සහිතව)<br><br>4,500.00 |
| බැකෝ ලෝඩරය | රු 4,000.00 (මීටර් පැයකට ඉන්ධන සහිතව) | රු 6,000.00 (මීටර් පැයකට ඉන්ධන සහිතව) |
| ජල බවුසරය(ලීටර් 3000) | රු. 3,500.00 ඉන්ධන සහිතව) (මීටර් පැයකට අතිරේක ගාස්තුව රු 600.00) | රු. 5,000.00 (ඉන්ධන සහිතව) (මීටර් පැයකට අතිරේක ගාස්තුව රු 2000.00) |
| ගලි බවුසරය<br><br><br>අවසන් බැහැරකරලීමේ ගාස්තුව | රු 6,000.00 (ඉන්ධන සහිතව) (මීටර් පැයකට අතිරේක ගාස්තුව රු 600.00)<br><br>රු 2,000.00 | රු 7,500.00 (ඉන්ධන සහිතව) (මීටර් පැයකට අතිරේක ගාස්තුව රු 1,500.00)<br><br>රු 3,000.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01 (viii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

රට තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ දරිද්‍රතාවය අවම කර ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ ජනතාව ආර්ථිකමය වශයෙන් සවි බල ගැන්වීම අරමුණු කරගෙන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (vii) වගන්ති ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශිය සභාව විසින් සකස් කරන ලද “ සාගිනි දුරලමු - වතු පිටි සරු කරමු ” කෘෂි බෝග හා ගෙවතු වගා ව්‍යාපෘතිය යටතේ ගෙවතු 400ක් ඇති කිරීම සඳහා කොම්පෝස්ට් කිලෝ 05 බැගින් නොමිලයේ ලබා දීමටත් එම ගෙවතු සඳහා බීජ වර්ග ලබා දීමට රු.400,000.00ක මුදලක් වැය කිරීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සඳහා මේ වන විට ඇති රු.400,000.00ක මුදල රු. 600,000.00 දක්වා වැඩි කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද වන විට රටේ පවතින තත්වය සැලකිල්ලට ගෙන මෙම ගෙවතු වගා ව්‍යාපෘතිය මුදල් හා ප්‍රතිපත්ති කරාක සභාවට ඉදිරිපත් කර මහා සභා අනුමැතිය සඳහා යොමු කළ බව පවසා සිටියේය. ඒ අනුව සභාවක් වශයෙන් අප සිදු කරනු ලබන්නේ එක වසමක ආදර්ශමත් ගෙවතු 10 බැගින් වසම් 39 තුළ ගෙවතු 390 ක්

සකස් කර ඒවා සඳහා අවශ්‍ය බීජ හා පොහොර සභාවේ මැදිහත් වීමෙන් ලබා දී එම ගෙවතු අතරින් හොඳම ගෙවත්ත තෝරා ගැනීමට අදහස් කර ඇති බව පවසා සිටියේය. මෙමඟින් ගෙවතු වගාව කෙරෙහි ජනතාව උනන්දු කරවීම අපේක්ෂා කරන අතර මහ කන්නය වනවිට බල ප්‍රදේශයේ ඇති පුරන් කුඹුරු තෝරාගෙන ඉදිරියේදී මහා සභා අනුමැතිය හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන එම කුඹුරු අස්වැද්දීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බවත් පවසා සිටියේය. මේ සඳහා සභාව සතු ට්‍රැක්ටර් රථ යොදා ගත හැකි බැවින් පළාත් පාලන ආයතන ලෙස ප්‍රදේශයට පූර්වාදර්ශයක් වෙමින් මේ කාර්ය සඳහා මුල පිරූ බව පවසා සිටියේය. එසේම මන්ත්‍රී මණ්ඩලයේ සිළු දෙනාටද තම ගෙවතු තළ හැකි පමණින් වගා කර ආදර්ශයක් සැපයීමට එකතු වෙන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන බව පැවසූ එතුමා එම ගෙවතු අතරින්ද හොඳම ගෙවත්ත තේරීම සඳහා කටයුතු කරන බව පවසා සිටින ලදී. මේ කාර්ය දේශපාලන භේදයකින් තොරව සිදු කරන කාර්යක් බවත් පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රිවරුන්ට තම වසම් තුළින් මේ සඳහා යොමු කරන නිවාස සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන ලෙස දන්වා සිටින ලදී. එසේම මේ සඳහා අවශ්‍ය පොහොර සභාව මඟින් ලබා දීමට ක්‍රියා කරන බවත් එසේම වරින් වර මේ ගෙවතු අධීක්ෂණය කිරීම සිදු කිරීමටත් ඒ පරීක්ෂා සිදු කළ බව ඒ බව සඳහන් කර අත්සනක් යෙදිය හැකි පත්‍රිකාවක් වගා කටයුතු සඳහා යොමු වන නිවාස වෙත ලබා දීමටත් පියවර ගන්නා බව පවසා සිටියේය. මේ නිරීක්ෂණ කටයුතු සඳහා වසම් නියෝජනය කරන සියළුම පක්ෂ වල මහජන නියෝජිතයන්ට සහභාගී විය හැකි බවත් එලෙස සහභාගී වීමෙන් මේ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් බවත් රටේ රජතුමා විසින් මේ රටේ සහල් වෙනත් රටවල වලට අපනයනය කළ ආර්ථිකයක් පැවතීම හේතුවෙන් පෙර දිග ධාන්‍යාගාරය ලෙසින් අතීතයේදී ලෝක ප්‍රසිද්ධ වූ අපේ රටේ වත්මන් පාලකයින් අද වන විට මහජනතාවට මඤ්ඤොක්කා දඩු සිටුවන ලෙස දැනුම් දෙන කාලයක ජනතාව පත්ව ඇති අසරණ තත්වයට යම් තරමකින් හෝ සහනයක් ලබා දීම සඳහා මේ කාර්ය සාර්ථකව සිදු කිරීමට ක්‍රියා කරමු යැයි පවසා සිටින ලදී. හැම ගමකම පුරන් වූ කුඹුරු තිබෙන බැවින් සභාව සතු ට්‍රැක්ටර් හා අනෙකුත් උපකරණ ලබා දෙමින් ඒවා නැවත අස්වැද්දීමට කටයුතු කළ හැකි නම් එය වඩාත් සාර්ථක වනු ඇති බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව11.20)

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක් බවත් කෙසේ හෝ මෙය සාර්ථක කර ගැනීම සඳහා කැප වී ක්‍රියා කරමු යැයි පවසා සිටියේය. මේ කන්නයේ තම වසමේ කුඹුරු වගා කරනු ලබන්නේ කීපදෙනෙකු පමණක් බවත් නමුත් ඔවුන්ටද මේ කන්නයේ වගා කිරීම සඳහා අවශ්‍ය මුදල් නොමැති වීම මත අසරණ වී ඇති බව පැවසීය. එම නිසා ඊළඟ කන්නයේවත් මේ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා දැන් සිටම පියවර ගැනීම වඩාත් යෝග්‍ය බව පෙන්වා දෙන ලදී. එසේම සභාවේ මැදිහත් වීමෙන් ආදර්ශමත් කුඹුරු යායක් අස්වද්දා පෙන්වීමට හැකි වුවහොත් එය මීටත් වඩා සාර්ථක විය හැකි බවත් බල ප්‍රදේශයේ එවැනි කුඹුරු ඇති බවත් පෙන්වා දෙන ලදී. එසේ නොවුනහොත් සියළුඹ දේවල් සභාවෙන් ලබා දෙන තුරු ජනතාව බලා සිටිය හැකි බවත් ඊට වඩා සභාව මඟින් ප්‍රායෝගිකව එම කාර්ය සිදු කර ආදර්ශයක් ලබා දීමට හැකි නම් වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී. මෙවැනි කාර්යන් වලට හෝ මහජන නියෝජිතයන් ලෙස මැදිහත් නොවුනහොත් අද වන විට මන්ත්‍රීවරුන්ට සමාජයේ ඇති වී තිබෙන අයහපත් අවබෝධයෙන් දුරු යීමට නොහැකි වනු ඇති බවත් මන්ත්‍රී නාමයට ඉදිරියෙන් මහජනතාව මේ වන විට හොරා යනුවෙන් යොදා සමස්ථ මන්ත්‍රීවරුන් හැඳින්වීමට ක්‍රියා කර තිබීම සැබවින්ම කණගාටුදායක තත්වයක් බවත් පවසා සිටියේය. වර්තමාන රජය විසින් සිදු කළ අමනෝඥ ක්‍රියාවක් ලෙස රැකියා ලක්ෂය වැඩසටහන යටතේ

සිදු කළ බඳවා ගැනීම තමන් විසින් හඳුන්වා දෙන බවත් ඒ සා විශාල පිරිසක් බඳවාගෙන වැටුප් ගෙවීම මඟින් සමාජ අපකීර්තියට මේ රජය පත් වී ඇති බවත් පෙන්වා දෙන ලදී. එම නිසා මහජන නියෝජිතයන් වශයෙන් අප මේ අවස්ථාවේදී පක්ෂ පාට පසෙකලා සමස්ථ සමාජයෙන් අපට අහිමි වූ එම ගරුත්වය නැවත ළඟා කර ගත හැකි මහජනතාවට සේවයක් සැලසෙන මේ ආකාරයේ ක්‍රියාවන් සඳහා හැකි උපරිම දායකත්වය ලබා දීමට කටයුතු කරමු යැයි ඉල්ලා සිටින ලදී. වැඩිහිටියන් ලෙස අප වේලක් දෙකක් නොකා සිටියත් අපගේ දරුවන්ට ඒ තත්වය උසුලා ගත නොහැකි වනු ඇති බවත් කොම්පෝස්ට් පොහොර මෙන්ම ගම් මට්ටමින් වගා කටයුතු සිදු කර ගැනීම සඳහා කුඹුරු සකස් කර ගැනීමේ සිට අනෙකුත් සියළු කාර්යන් සඳහා අවශ්‍ය ඩීසල් ඇතුළු අනෙකුත් අවශ්‍යතා යම් මට්ටමකින් හෝ සපුරා දීමට හැකියාවක් ඇත්නම් මේ අවස්ථාවේදී එය එම ජනතාවට සිදු කළ හැකි හොඳම සේවයක් බව පෙන්වා දෙන ලදී. රැකියා ලක්ෂය මඟින් පුහුණුවට යොදා ඇති සේවකයන් හෝ යොදවාගෙන ආදර්ශමත් කුඹුරු යායක් සකස් කිරීමට හැකි නම් එය සුදුසු බවත් ඒ සඳහා ක්‍රියා කරන ලෙසත් ඉල්ලා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව අගය කරන බවත් මෙය ක්‍රියාත්මක කිරීමේදී පසු විපරමත් නිසි ආකාරයෙන් සිදු නොකළහොත් මෙහි සාර්ථකත්වයක් දැකීමට නොහැකි වනු ඇති බැවින් ඒ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා , ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී පෙ:ව: 11.30)

බීජ ලබා දීම සඳහා තෝරා ගත් පුද්ගල කණ්ඩායම් වලට එම කාර්ය නිසි පරිදි සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ තිබෙනවාද පාත්ති සකස් කිරීමේ සිට අනෙකුත් කාර්යන් සිදු කිරීම සඳහා ඔවුන් දක්වන උනන්දුව සම්බන්ධයෙන්ද පූර්ව විමර්ශනයකුත් සිදු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් එතුමා එසේ නොවුණහොත් මෙහි සාර්ථකත්වයක් දැකිය නොහැකි වනු ඇති බව පැවසීය. පුරන් කුඹරු අස්වැද්දීමේ කාර්ය සිදු කරන්නේ නම් ඒ සඳහා තමන්ද කුඹුරු අක්කර එකහමාරක් ලබා දෙන බවත් තමනට එම කුඹුර කරගෙන යාමට නොහැකි බව පවසා එක්තරා පුද්ගලයෙකු විසින් එය තමන් වෙත ලබා දී වගා කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටි බවත් ඒ කුඹුර මේ කාර්ය සඳහා ලබා දීමට තමන්ට හැකියාව ඇති බවත් පැවසීය. මේ වන විට රැකියා ලක්ෂයෙන් බඳවා ගත් පිරිස් හෝ යොදවාගෙන මේ කෘෂිකාර්මික සංග්‍රාමය සිදු කිරීමට මූලික වන්නේ නම් මේ අවස්ථාවේ එය මහත් සහනයක් වන බැවින් කඩිනමින් ඊට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටියේය. එසේම රැකියා ලක්ෂය යටතේ බඳවා ලත් පිරිස් සම්බන්ධයෙන් අද දින සභාවේදී දිගින් දිගටම අදහස් ප්‍රකාශ වූ බැවින් තමන්ද යම් අදහසක් ඉදිරිපත් කිරීමට අදහස් කළ පව පැවසූ එතුමා ඒ යටතේ බඳවා ගත් පිරිස් ඔවුන් බඳවා ගනු ලැබූ රාජකාරි කටයුත්තට අදාල වගකීම් සම්බන්ධයෙන් මූලික අවස්ථාවේදීම දැනුවත් කර නොතිබූ බවත් ඒ ආකායෙන් විවිධ තනතුරු සඳහා බඳවාගෙන අවසානයේ ඊට පරිබාහිර කාර්යන් සිදු කිරීම සඳහා ඔවුන් යොමු කිරීමත් මේ ආකාරයට ඔවුන්ගෙන් ඇතැම් පිරිස් නැවත සේවයට වාර්තා නොකිරීමට හේතු වන්නට ඇති බව පැවසීය. ඔවුන්ට රැකියාවේ ස්වභාවය පිළිබඳව පූර්ව අවබෝධයක් නොතිබීම මත ගම් වල යම් මට්ටමකට අධ්‍යාපනයක් ලැබූ පිරිස් අද වන විට මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීමට සෞඛ්‍ය කම්කරු ලෙස කටයුතු කිරීමට යොදවා තිබීම මත එක්තරා ආකාරයක මානසික පීඩනයක්ටද ඔවුන්ට මුහුණ දීමට සිදුව ඇති බවත් මේ රැකියා ලබා දීමේ ක්‍රමවේදය විධිමත් කළ යුතු බවත් පවසා සිටියේය.අවසන් වශයෙන් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව අගය කරන බවත් මේ ව්‍යාපෘතිය සිදු කරන අතරවාරයේ පසු විපරම් සිදු කිරීම සඳහාත් යම් වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව අගය කරන බවත් මෙය වර්තමාන සමාජය මුහුණ දී ඇති ව්‍යසනය හමුවේ සිදු විය යුතු කාර්යක් බවත් පවසා සිටියේය. ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සඳහන් කළ ආකාරයට පුරන් කුඹුරු අස්වැද්දීමේ කාර්ය සිදු කරන්නේ නම් ඒ සඳහා ලබා දිය හැකි කුඹුරු පිටදෙණිය ප්‍රදේශයේත් තිබෙන බවත් මේ කාර්ය පිළිබඳව දැනුම්දුනහොත් එම කුඹුරු ඒ සඳහා ලබා දීමට එම අයිතිනරුවන් කිසිසේත් විරුද්ධ නොවන බවට තමන්ට විශ්වාසයෙන් පැවසිය හැකි බවත් පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.32)

අද වන විට නගරයේ එළවළු කිලෝවක් රුපියල් හාරසියයකට පන්සියයකට වඩා වැඩි මුදලක් වන බවත් එසේ වුවත් ගෙවතු වගාව එදා සිටිම ජනතාව අතර සිදු කරන කාර්යක් බැවින් අඩු තරමේ පෝච්චියක හෝ එළවළු පැළයක් සිටුවීමට ජනතාව දීර්ග කාලයක සිට් හුරු වී සිටින බව පවසා සිටියේය.එසේම මේ ප්‍රදේශයේත් ගොඩගම්පළ, හිඟුරලකන්ද ආදී වසම් වල පමණක් නොවන තිඹිරිපොල , දෙහිඕවිට වසම් වලත් ජනතාව වගා කටයුතු මේ වන විටත් සිදු කරමින් සිටින බව පවසා සිටියේය. එසේම බීජ ලබා දීම තුළින් එම සියළුම බීජ එල හටගන්නා මට්ටමේ බීජ නොවන බැවින් එය සාර්ථක කාර්යක් ලෙස තමන් නොදකින බව පැවසීය. මේ සියළුම කටයුතු සඳහා වියදම් කරනු ලබන්නේ බල ප්‍රදේශයේ මහජනතාවගේ බදු මුදල් බැවින් වඩා ප්‍රයෝජනවත් කාර්යක් වෙනුවෙන් එම මුදල් ආයෝජනය කිරීම උචිත බැවින් කරවනැල්ල සිට අවිස්සාවේල්ල දක්වා මාර්ගය දෙපස ඕනෑ තරම් පුරන් කුඹුරු හමු වන බවත් සභාවේ ට්‍රැක්ටර් යොදවාගෙන සභාවේ සේවකයන්ගේ ශ්‍රම දායකත්වයෙන් එම කුඹුරු අස්වැද්දීම සඳහා කටයුතු කිරීම වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී. එම කුඹුරු සඳහා අවශ්‍ය තෙල් , පොහොර ආදිය සපයා ගැනීමට නොහැකිව ජනතාව අසරණ වී වගා කටයුතු වලින් ඉවත්ව  ඇති මොහොතක සභාවේ මැදිහත් වීමෙන් ඒවා ලබා දීම කුඹුරු අස්වැද්ද වීමට කටයුතු කිරීම වඩාත් කාලෝචිත බව පෙන්වා දෙන ලදී. එසේම ජනතාවගේ ආකල්ප වෙනස් කිරීමට පියවර ගත යුතු බවත් තම ඉඩමේ මිරිස් පැළයක් වගා කර ගැනීමට ඉඩ තිබියදී ඒ සඳහා යොමු නොවී අධික මිලක් වියදම් කර මිරිස් පවා වෙළඳපලෙන් මිලදී ගැනීමට ජනතාව කටයුතු කිරීම වෙනස් කළ යුතු බව පැවසීය. මන්ත්‍රීවරු පිළිබඳව ජනතාව තුළ ගොඩනැඟී ඇති අප්‍රසාදය ඉවත් කර ගැනීම සඳහා හොඳ අවස්ථාවක් නිර්මාණය කර දී ඇති මොහොතේ රටටම ආදර්ශයක් වන ආකාරයෙන් මේ කාර්ය සිදු කිරීමට කිසිදු භේදයකින් තොරව මන්ත්‍රීවරු ඒකරාශී විය යුතු බවට තමන්ද අදහස් කරන බව පැවසීය. රැකියා ලක්ෂයේ වැඩසටහන සම්බන්ධයෙන් භේදයකින් තොරව ආණ්ඩු පක්ෂය හා විපක්ෂය දරන අදහස ගැන සතුටු වන බවත් කිසිදු වගවීමකින් තොරව බඳවා ගත් මේ පිරිස වසර 10ක 15ක් ගිය පසු හවිහරනක් නොමැති පිරිසක් බවට පත් වන බව මේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියෙන්ම අවබෝධ වන බව පවසා සිටියේය. ගරු සභාපතිතුමාගේ සංකල්පයකට අනුව ඊරියගොල්ල ප්‍රදේශයේ ඉදි කරන ලද හෙළ බොජුන්හල අද වන විට සාර්ථකව ක්‍රියාත්මක වනවා සේම ඊටත් වඩා වැඩි සමාජ ගෞරවයක් ලබා ලැනීමට මෙම ව්‍යාපෘතිය සාර්ථකව සිදු කළහොත් හැකියාව ලැබෙන බැවින් එය ක්‍රියාත්මක කර ප්‍රදේශයේ ජනතාවට පූර්වාදර්ශයක් මේ සභාව තුළින්ම ලබා දෙමු යැයි පවසා සිටින ලදී.බීජ පැළ බෙදාදීමට වඩා පුරන් කුඹුරු අස්වැද්දීමේ කාර්යට ප්‍රමුඛත්වය ගැනීම තුළින් මෙය වඩාත් සාර්ථකව සිදු කළ හැකි බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පුරන් කුඹුරු අස්වැද්දීමේ කාර්ය කෙරෙහි අපගේ අවධානය තිබෙන බවත් නමුත් මහ කන්නය ආරම්භ කිරීමට තව මාස තුනක කාලයක් තිබෙන බැවින් මේ වැඩපිළිවෙල හරහා වසමින් වසමට ගොස් එලෙස වගා කළ හැකි කුඹුරු හඳුනා ගැනීමටත් මෙය අවස්ථාවක් කර ගත හැකි බව පවසා සිටියේය. මේ කාර්ය සඳහා මන්ත්‍රීවරුන්ගේ ඍජු අධීක්ෂණය අවශ්‍ය බවත් වසම තුළ තෝරා ගනු ලැබූ ගෙවතු 10 ඔවුන්ගේ අධීක්ෂණයට ලක් වූ බවට ලබා දෙන ලබන පෝරමයේ සහතික කිරීම මන්ත්‍රීවරුන් විසින් සිදු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. මේ සියළු වැඩසටහන් එක් වර ආරම්භ කළහොත් එය සාර්ථක කර ගැනීමට නොහැකි වනු ඇති බවත් ගෙවතු වගා ව්‍යාපෘතියට වසම් මට්ටමින් අධීක්ෂණ කටයුතු සඳහා යන අවස්ථාවල පුරන් කුඹුරු සම්බන්ධයෙන්ද වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

අද දින මේ යෝජනාව ගෙන ඒමට හේතු වූයේ රටේ නිර්මාණය වන ආහාර අර්බුදයට විසඳුමක් ලෙස බවත් නමුත් අප පළමුවෙන් මේ අර්බුදය කුමක්ද යන්න තේරුම් ගත යුතු බවත් පසුව ඒ සඳහා විසඳුම් සෙවිය යුතු බවත් පවසා සිටියේය. රටේ ඇති පහළම දේශපාලන ක්ෂේත්‍රය පළාත් පාලන ආයතන බවත් අද වන විට රට තුළ ආහාර සුරක්ෂිතතාවය නැති වී ඇති බවත් පෙන්වා දෙන ලදී. අද වන විට මඤ්ඤොක්කා දඬුවක් සිට වූ පමණින් කැළයට ගොස් කොස් , පොලොස් ආදිය කඩා ගෙන ආ පමණින් මේ අර්බුදයට විසඳුම් ලැබෙන බවට ජනතාවට ඒත්තු ගැන්වීමට උත්සාහ කළත් මෙය ඊට වඩා සංකීර්ණ කාරණයක් බව අප අවබෝධ කර ගත යුතු බව පවසා සිටියේය. මේ රටේ යැපුම් කෘෂිකර්මයේ ගැටළු නොතිබූ බවත් වගා කටයුතු සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය පොහොර සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා නොදී ඔවුන් අසරණ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේ තත්වය උදා වූ බවත් පවසා සිටින ලදී. මීට පෙර අවස්ථා කීපයකදී තමන් විසින් මේ පොහොර ලබා නොදීම නිසා ඉදිරියේ මෙවැනි තත්වයක් ඇති වනු ඇති බවට මේ සභාවේදී දැනුවත් කළ බව සිහිපත් කළ එතුමා 2015 වර්ෂය වන විට ලංකාවේ සහල් අතිරික්තයක් තිබූ බවත් මත්තල ගුවන්තොටුපලේ පවා අතිරික්ත වී ගබඩා කළ බව පවසා සිටියේය. නමුත් අද වන විට මේ රජයේ අදූර දර්ශී ක්‍රියා පිළිවෙත නිසා ලංකාවේ ශ්‍රම බලකායෙන් 1/3 ක් වූ ගොවීන් අන්ත අසරණ භාවයට පත් කොට රජයේ නිලධාරීන්ට වගා කරන ලෙස උපදෙස් ලබා දෙන තත්වයකට මේ රජය පත්ව ඇති බව පැවසීය. එම නිසා සංඛ්‍යා දත්ත වලින් ඔබ්බට ගොස් මේ ගැටළුව සම්බන්ධයෙන් බැලිය යුතු බවත් මේ රටේ යැපුම් කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් ගැටළුවක් නොතිබූ බවත් රැකියාවක් ලෙස කෘෂිකර්මානක්තයේ යෙදී සිටි ගොවියාට වගා කිරීමට අවශ්‍ය බීජ, පොහොර, සහ අනෙකුත් අවශ්‍යතා අහිමි කර ඔවුන්ට තම වෘත්තිය සිදුකරගෙන යාමට නොහැකි තත්වයක් උද්ගත කර ඇති බව පෙන්වා දෙන ලදී. එම නිසා ගොවීන්ට අවශ්‍ය පොහොර, බීජ, කෘෂි උපකරණ මෙන්ම දැනුම හා තාක්ෂණය ඔවුන්ට ලබා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. අද වන විටත් පොහොර ගෙන්වීම සම්බන්ධයෙන් රජයේ පැහැදිලි වැඩපිළිවෙලක් නොමැති බවත් යල කන්නය අවසන් වී මාස දෙකක කාලයකුත් ඉක්ම ගොස් ඇති බවත් මේවා සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවයත් පෙන්වා දෙන ලදී. වගා කටයුතු සඳහා යොමු වුවත් අප අයත් වන කෑගල්ල දිස්ත්‍රික්කයේ වගා කටයුතු සඳහා බාධා වන ප්‍රධාන ගැටළුව හඳුනා ගත යුතු බවත් ඒ අනුව වන සතුන්ගෙන් වන හානි හේතුවෙන් වගාවන් විනාශ වීම මේ දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණපාන ප්‍රධාන ගැටළු බවත් ඒ සඳහා විධිමත් විසඳුමක් පළමුව හඳුනා ගත යුතු බවත් පෙන්වා දෙන ලදී. ලංකාව තුළ හොඳ බීජ සම්පතක් තිබූ බවත් නමුත් පසුකාලීන බහුජාතික සමාගම් වෙත ඒවා ලබා දීම හේතුවෙන් එයත් කඩා වැටී ඇති බව පැවසීය. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පමණක් කුඹුරු අක්කර 21,000 ක් තිබෙන පැවසීය. අද වන විට චීනය, මැලේසියාව වැනි රටවල් කුඹුරු අක්කරයකින් වී බුසල් 400 ක් වැනි ප්‍රමාණයක් ලබා ගන්නා විට ලංකාවේ අපි තවමත් කුඹුරු අක්කරයකින් ලබා ගන්නේ වී බුසල් 75/ 80 ක ප්‍රමාණයක් බව පෙන්වා දුන්

එතුමා තාක්ෂණය අතිනුත් අපගේ කෘෂිකර්මාන්තය අද වන විටත් පවතින්නේ ඉතාමත් ප්‍රාථමික අවධියක බව පැවසීය. එම නිසා දිස්ත්‍රික්කය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය නිසි ආකාරයෙන් වගා කිරීමට යොදා ගතහොත් එයින් ලැබෙන අස්වැන්න අඩු තරමේ දිස්ත්‍රික්කයේ පරිභෝජනය සඳහා ප්‍රයෝජනයට ගත හැකි බවත් මෙය තව 40%කින් වැඩි කළහොත් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් 40%ක ප්‍රමාණයක් සහල් අපනයනය කිරීමේ හැකියාව ලැබෙන බවත් පෙන්වා දෙන ලදී. එමඟින් වසර 4 ක් තුළ බිලියන 35ක පමණ ආදායමක් ලබා ගැනීමට හැකියාව ඇති බවත් එය මීරිගම සිට කුරුණෑගල දක්වා අධිවේගී මාර්ගය සකස් කිරීමට වියදම් වූ මුදලට සමාන මුදලක් බවත් පැවසීය. මොනරාගල දිස්ත්‍රික්කයේ වගා කළ හැකි කුඹුරු අක්කර ප්‍රමාණය 124,000 ක් පමණ වන බවත් කෑගල්ලේ මෙන් 6 ගුණයක් විශාල ඉඩම් ප්‍රමාණයක් එම දිස්ත්‍රික්කය තුළ වගා කටයුතු සඳහා තිබෙන බවත් පෙන්වා දෙන ලදී. එම නිසා මේ ගැටළුවට විසඳුම අල බතල මඤ්ඤොක්කා වගා කිරීම නොවන බවත් රාජ්‍ය යාන්ත්‍රනය මඟින් ගනු ලබන තීන්දු තීරණ වෙනස්විය යුතු බවත් පැවසූ එතුමා ප්‍රදේශයේ ගොවි ජනතාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සහ ඒවාට පිළිතුරු සොයා නොගෙන මේ රට තුළ ඇති වී තිබෙන ආර්ථික ව්‍යසනයෙන් ගොඩ ඒමට හැකියාවක් නොමැති බවත් පෙන්වා දෙන ලදී. පසුගිය දිනක දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජ්‍ය නිලධාරීන් කොස් ඇට ඇහිදීම සඳහා යොමු කළ බවත් නිලධාරීන් සිටින්නේ ඒ කාර්යන් සඳහාදැයි විමසා සිටියේය. ලංකාවේ ගොවියන්ගේ වගා කටයුතු සඳහා තිබූ සියළුම අවස්ථා අහිමි කර මේ ආකාරයේ විසඳුම් සඳහා රජය යොමු වීම අතිශයින්ම ලැජ්ජාසහගත ක්‍රියාවලියක් බව පවසා සිටින ලදී. අද වන විට පවතින ජීවන වියදම් හමුවේ ලබා ගන්නා වැටුප ජීවත් වීම සඳහාවත් ප්‍රමාණ නොවීම මෙන්ම ලබා ගත් නිවාසණය ආදිය ගෙවීම් මෙන්ම එවැනි කටයුතු සඳහා තැබූ පියවර ඉදිරියට ක්‍රියාත්මක කර ගැනීමට ප්‍රමාණවත් වේතනයක් නොලැබීම මත හෙම්බත් වී සිටින ඔවුන් පිට මේ ආකාරයේ බර පැටවීම සාධාරණ නොවන බව පෙන්වා දෙන ලදී. ඉදිරියට උදා වන පලතුරු වාරයේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඉතා හොඳ ආදායමක්ලබා ගැනීමට හැකියාව ඇති බවත් නමුත් වන සත්ව හානි නිසා ඒ අස්වැන්න නිසි ආකාරයෙන් ලබා ලැනීමට නොහැකි වී ඇති බවත් පැවසීය. එම නිසා මේ අවස්ථාවේ ගරු සභාපතිතුමාට මේ සඳහා ප්‍රමුඛ වී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී හෝ මේ සම්බන්ධයෙන් බලධාරීන්ගේ අවධානය යොමු කොට වායු රයිපල් ලබා දීමේ වැඩපිළිවෙල හෝ ක්‍රමවත් කිරීමට හැකියාව ඇති බව පැවසීය. එම නිසා එම කාර්යට ගරු සභාපතිතුමාට මූලික වන ලෙස ඉල්ලා සිටි එතුමා රාජ්‍ය නිලධාරීන්ට සේවයට වාර්තා කිරීමට අවස්ථාව සලසා දී ගොවිකම ගොවීන්ට සිදුකරගෙන යාමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධ යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ගෙන ආ අවස්ථාවේදී අපි ඒ සඳහා සහය ලබා දුන් බවත් අද වන විට ජනතාව ජීවත් වීම සඳහා විශාල අරගලයකට මුහුණ දී ඇති බවත් ඩීසල් පෝළිමේ, ගෑස් පෝළිමේ මෙන්ම ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ගොස් ඇති වෙළඳසැල් වලද ගැටුම් ඇති කර ගන්නා තත්වයට ඔවුන්ගේ මානසික මට්ටම දරුණු වී ඇති බවත් අද වන විට පවතින ඖෂධ හිඟය හේතුවෙන් රෝගීන් මිය යන තත්වයට පත්ව ඇති බවත් පෙන්වා දෙන ලදී. මේ ජනතාව කුසගින්න හේතුවෙන් ගැටුම් ඇති කර ගන්නා තත්වයට පත් වුවහොත් එය වඩාත් ඛේදනීය තත්වයක් විය හැකි බැවින් ජනතාවගේ ආහාර අවශ්‍යතාවය වෙනුවෙන් පුරන් කුඹුරු අස්වැද්ද වීමේ කාර්ය සිදු කිරීමට ප්‍රධාන අවධානය යොමු කිරීම කාලෝචිත බව පෙන්වා දෙන ලදී. මේ ප්‍රදේදශයේ ඇත්තේ සරුසාර පසක් බවත් එම නිසා වෙනත් ප්‍රදේශ වල පොහොර යොදා සාදන එළවළු මේ ප්‍රදේශයේ සරුවට වැඩෙන බව පෙන්වා දෙන ලදී. පසුගිය දින වල තක්කාලි කිලෝව රු.1000.00 ක මුදලකට අලෙවි වූ බවත් මේ ආකාරයේ අධික වියදමක් දරමින් මිනිසුන්ට මෙම එළවළු මිලදී ගැනීමට නොහැකිව ඔවුන් අසරණ වන බැවින් තම ඉඩම් වල වගා කටයුතු සඳහා ජනතාව යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක් වී ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

පසුගිය මහා සභා රැස්වීම් වලදී මේ වගා කටයුතු සඳහා යොමු වීමේ අවශ්‍යතාවය තමන් විසින් පැහැදිලි කර දී ඇති බව පැවසීය.

(ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.00)

ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ජනාධිපතිතුමා මඤ්ඤොක්කා වගා කරන ලෙස රටේ ජනතාවට ප්‍රකාශ කිරීම යම් ආකාරයක විවේචනාත්මක මුඛයෙන් කතා කළ බවත් මඤ්ඤොක්කා යනු විදෙස් රට වල පවා ප්‍රචලිත බහුලව ආහාරයට ගන්නා ශාකයක් බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.02)

මේ බෝග බහුලව වගා කළහොත් එමඟින් රටට විදේශ විනිමය ගෙන ඒමේ හැකියාවත් ඇති බව පෙන්වා දුන එතුමා මේ සම්බන්ධයෙන් පුළුල් අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතු බව පැවසීය. අද වන විටත් තම ගෙවත්ත තුළ වගා කටයුතු ආරම්භ කර ඇති අයෙකු වශයෙන් එම පූර්වාදර්ශය මේ වන විටත් තමන් ලබා දී ඇති බව පවසා සිටියේය. තමන් විසින් සිදු කර ඇති මේ වගී හේතුවෙන් තම නිවසට ගෙන එනු ලබන පලතුරු සඳහා වැය කරනු ලබන මුදලෙන් 40% ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමට තමන්ට හැකියාව ලැබී ඇති බවත් හැකි අවස්ථාවක පැමිණ තම ගෙවත්ත නරඹන ලෙස මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන බවත් පවසා සිටියේය. එම නිසා ගෙවතු වගා කටයුතු සිදු කිරීම අවතක්සේරුවට ලක් නොකළ යුතු බවත් රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ඒ සඳහා යම් තරමකින් හෝ සහනයක් වීමට හැකියාවක් සලසා ගැනීම අප සැමගේ වගකීම බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.03)

මේ ව්‍යාපෘතිය ආරම්භ කළ පසු ඒ සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් එතුමා එසේ නොවුනහොත් විශාල පිරි වැයක් දරා සිදු කරනු ලබන මේ කාර්යයේ සාර්ථකත්වයක් දැකීමට නොහැකි වනු ඇති බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ව්‍යාපෘතියට පළමු අදියරේදී එක් වසමකින් 10 දෙනෙකු තෝරා ගන්නා බවත් ඔවුන් සම්බන්ධයෙන් පසු විපරම සිදු කිරීමේ කාර්ය අදාල වසමේ මන්ත්‍රීවරයා විසින් භාර ගත යුතු බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවට පැමිණෙන ලදී. ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.04)

අවශ්‍ය වුවහොත් කාර්යාලයේ නිලධාරීන්ගේ සහය ලබා දිය හැකි වුවත් සම්බන්ධීකරණ කටයුතු, වගාවන් සඳහා බිම් සැකසීම පරීක්ෂා කිරීම ආදී අනෙකුත් සියළුම කාර්යන් අධීක්ෂණයේ වගකීම වසමේ මන්ත්‍රීවරයා වෙත යොමු කරන බව පවසා සිටියේය. මේ ව්‍යාපෘතිය පුළුල්ව සිදු කරන කාලය වන විට එම දස දෙනාගේ කණ්ඩායමේ අය සිය මූලිකත්වයෙන් අවශ්‍ය අනෙකුත් පිරිස සොයා ගැනීම සිදු කරනු ඇති බව පවසා සිටියේය.මේ කාර්යයේ සම්බන්ධීකරණ ක්‍රියාවලිය සිදු කිරීම මඟින් මහජනතාවට මේ වන විට මන්ත්‍රීවරුන් කෙරෙහි තිබෙන අයහපත් ප්‍රතිරූපය ඉවත්ව යනු ඇති බවත් පසුව ක්‍රමයෙන් ජනතාව මේ වැඩසටහන සඳහා යොමු කර ගැනීමේ හැකියාව ලැබෙනු ඇතැයි පැවසීය. මේ ගෙවතු වල විනිශ්චය කටයුතු මාස 0 න් 06 ට සිදු කරන බවත් බෝග වල අස්වැන්න ලබා ගැනීම සඳහා මාස 06ක කාලයක් ගත වන බැවින් ඒ ආකාරයෙන් සිදු කිරීමට අපේක්ෂා කළ බවත් පවසා සිටියේය. මේ කාර්ය සඳහා සඳහා නිලධාරීන්ගේ සහභාගීත්වයක් සිදු නොවන බැවින් දරණ පිරිවැය යම් ආකාරයකින් අපතේ යැමක් සිදු වුවහොත් එහි සම්පූර්ණ වගකීම මන්ත්‍රීවරුන් වෙත යොමු වන බවත් එම නිසා වගකීමෙන් මේ කාර්ය සිදු

කිරීමට ක්‍රියා කරන ලෙසත් දන්වා සිටියේය. කාර්ය සාර්ථක වීම හෝ නොවීම සම්පූර්ණයෙන්ම මන්ත්‍රීවරුන්ගේ කැපවීම මතම සිදු වන බවත් වෙනත් කිසිදු පාර්ශවයකට මේ සඳහා චෝදනා කිරීමට මන්ත්‍රීවරුන්ට නොහැකි වනු ඇති බවත් පැවසූ එතුමා වසම් මට්ටමින් මහජනතාව මේ සඳහා උනන්දු කරවනවා සේම සියළුම මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීවරියන්ගේ ගෙවතු වලත් වගා කටයුතු ආරම්භ කළ යුතු බවත් ඒ ගෙවතු වලින් හොද්ම ගෙවත්ත තෝරා යම් ත්‍යාගයක් ලබා දීම සඳහා කටයුතු කරන බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

අනාගතයේ රට තුළ උද්ගත විය හැකි ගැටළුවකට මුහුණ දීම සඳහා මේ ආකාරයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව පැවසුවාය. නමුත් කොරෝනා කාලයේදී බීජ ලබා දුන්ආකාරයට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට හිතවත් පිරිස සඳහා පමණක් මේවා ලබා දීමට ක්‍රියා කළහොත් මෙම කාර්යත් ඒ ආකාරයෙන්ම අතරමඟ නවතිනු ඇති බව පවසා සිටියාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ කාර්ය සඳහා කිසිම ආකාරයකින් පක්ෂ පාට භේදයක් ඇති නොවන බවත් ගරු මන්ත්‍රීතුමියටත් වසමේ වගා කටයුතු සිදු කරන පවුල් 10ක අයදුම් පත්‍ර කාර්යාලයට ගෙනවිත් භාර දිය හැකි බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

වසම නියෝජනය කරන මන්ත්‍රීවරුන් දෙදෙනෙක් සිටින අවස්ථා වල මේ කාර්ය සිදු කරන්නේ කෙසේද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අනෙක් මන්ත්‍රීවරුන්ටද ඒ ආකාරයට අයදුම් පත්‍ර ලබා දිය හැකි බවත් ඒවායින් ගෙවතු 10ක තෝරාගැනීම සිදු වන බවත් පෙන්වා දෙන ලදී. එම තෝරා ගැනීමට කිසිදු අවස්ථාවක දේශපාලන භේදයක් නොසලකන බවත් පවසා සිටින ලදී

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

මේ වන විටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල වසම් මට්ටමින් " සිතමු " ගොවි කාන්තා සමිතියක් පිහිටුවා තිබෙන බවත් එහි දායකත්වය මේ සඳහා ලබා ගනිමු යැයි පවසා සිටියේය.මීට මාස 10 කට පෙර මේ ආණ්ඩුවෙන් බීජ පැකට් ලබා දීමක් සිදු කළ බවත් නමුත් එම බීජ පැළ නොවූ බවට චෝදනා එල්ල වූ බවත් සිහිපත් කළ එතුමිය ඒවා සඳහා යොදා තිබූ රසායන ද්‍රව්‍ය ඉවත් කර ගන්නා ආකාරය සම්බන්ධයෙන් විස්තර සඳහන් පත්‍රිකාවක් හෝ ඒ සමඟ යොමු කර නොතිබූ බව පැවසීය. පෙර අවස්ථාවේ බලාපොරොත්තු වූ ප්‍රගතිය නොලැබීමට මේවාද හේතු වූ බැවින් මෙවර ඒ ආකාරයේ අඩු පාඩු සිදු නොවන්නට මේ කාර්ය සිදු කරමුයැයි පවසා සිටියාය. තමන් නියෝජනය කරනු ලබන වෙලන්ගල්ල වසම මේ බල ප්‍රදේශයේ වැඩිම කුඹුරු පිහිටි වසම වන බවත් එම කුඹුරු 240 න් අද වන විට වැඩ කරනු ලබන්නේ 112 ක් පමණක් බවත් පුරන් කුඹුරු අස්වැද්දීමේ ව්‍යාපෘතිය යටතේ මේ වසම සඳහාත් අවශ්‍ය අනුග්‍රහය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී. මොන දේ සිදු කළත් වගා හානිය අවම කිරීම සඳහා යම් ක්‍රියා මාර්ග ගත යුතු බවත් රිලවුන් , ඉත්තෑවන් , වල් ඌරන් ආදී වන සතුන්ගෙන් වගාවන්ට වනක හානි මර්දනය සඳහා ගොවි ජනත.ාව වෙත සහය ලබා දිමට හැකි නම් එය වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී. ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා කී ආකාරයට තම වසමේ කුඹුරු වලින් වී බුසල් 190 කට වඩා ලබා ගත හැකි බවත් එය ජනගහනය 5000 ක් පමණ සිටින වෙලන්ගල්ල වසමේ

ජනතාවගේ පරිභෝජනයට ලබා ගෙන අතිරික්තයක් වන බවත් පැවසීය. එම නිසා මේ වගා සංග්‍රාමයත් තාප්ප වල චිත්‍ර ඇන්දා සේ රැල්ලක් පමණක් බවට පත් කර නොගෙන ගොවි ජනතාව මුහුණ දී ඇති ගැටළු වලට විසඳුමක් ලබා දෙමින් පීඩාවට පත් වී සිටින ජනතාවට අත්වැලක් වන්නට හැකි වේ නම් වඩාත් සාර්ථක වනු ඇති බව ප්‍රකාශ කළාය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

පසු ගිය මහා සභා රැස්වීමේදී අදහස් ප්‍රකාශ වූ කාර්යක් මේ මහා සභා රැස්වීම වන විට ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමට කටයුතු කර තිබීම අගය කළ යුතු බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රීනී සුධර්මා ලක්මාලි මැතිණිය, ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.11)

මේ සම්බන්ධයෙන් උනන්දු වන ජනතාව මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්නේ කවදාදැයි බලා සිටින බැවින් කවදා වන විට මේ කාර්යන් ආරම්භ කළ හැකිද යන්න සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියේය. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා විසින් මඤ්ඤොක්කා වගා කර මේ ගැටළුවට විසඳුම් සෙවිය නොහැකි බවට චෝදනා කළ බවත් නමුත් උද්ගත විය හැකි අර්බුදයකට මුහුණ දීම සඳහා තම නිවස තුළින් යම් සූදානම් වීමක් සිදු කිරීමේ වරදක් තමන් නොදකින බව පවසා සිටියේය. එම නිසා මේ වැඩපිළිවෙල හැකි ඉක්මණින් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මහා සභා රැස්වීම අවසන් වන විට සියළුම මන්ත්‍රීවරුන්ට අදාල අයදුම් පත්‍ර ලබා දීමට කටයුතු කරන බවත් ඒවා සම්පූර්ණ කර සතියක් ඇතුලත කාර්යාලයට ලැබීමට සලස් වන ලෙසත් දන්වා සිටියේය. ඒ අනුව ඊ ළඟ සතියේම මේ වැඩසටහන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත හැකි බවත් පවසා සිටියේය. සියළුම මන්ත්‍රීවරුන් සඳහා බීජ පැකට ලබා දීමට අදහස් කරන බැවින් රුපියල් ලක්ෂ 04 ක මුදල රුපියල් ලක්ෂ 06 දක්වා වැඩි කිරීමට තමන් යෝජනා කළ බවත් ඒ අනුව අදාල බීජ මිලදී ගැනීමේ කටයුතු සිදු කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ඉදිරියේදී ආහාර අර්බුදයක් උද්ගත වන බවට සමාජ මතයක් නිර්මාණය වී ඇති බවත් ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම ඇමතිවරයාද යම් යම් ප්‍රකාශ සිදු කර ඇති බව පවසා සිටියේය. ගරු සභාපතිතුමා විසින් මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලද්දේ ඒ සඳහා විසඳුමක් ලෙසද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

බල ප්‍රදේශයේ ජනතාවට එවැනි අවස්ථාවන් සඳහා මුහුණ දීමට අවශ්‍ය අත්වැලක් ලබා දීමත් මෙහි එක් අරමුණක් බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා ගරු මන්ත්‍රීනී සුධර්මා ලක්මාලි මැතිණිය සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.16)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ඉදිරියේදී ආහාර අර්බුදයක් උද්ගත වන්නේ නම් සභාවක් ලෙස බල ප්‍රදේශයේ ජනතාවට යම් සහනයක් සැලසීම සඳහා මේ ව්‍යාපෘතිය තුළින් වසමකින් පවුල් 10 ක පමණක් තෝරා ගෙන මේ කාර්ය සිදු කළ විට එහි ප්‍රතිලාභ හිමි වන්නේ ඒ පවුල් 10 සඳහා පමණක් නොවේදැයි විමසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා , ගරු මන්ත්‍රී තුෂාර අමරසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ගරු මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.17 )

මේ අවස්ථාවේ මිනිසුන්ට අවශ්‍ය කරන්නේ මීට වඩා වටිනා දෙයක් බව පැවසීය. දෙහිඕවිට පුරාම තිබෙන කුඹුරු අස්වැද්දීමට මේ සභාවට හැකියාව නැති බවත් එසේ හැකියාවක් ඇත්නම් ඉන්ධන සඳහා වන වියදම් පියවා ගැනීමට නොහැකිව අද දිනයේ පරිපූරක අය වැයක් සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.18 )

මහ කන්නය මේ වන විට අවසන් වී ඇති බවත් මේ වන විට මාසයකට සහල් මෙට්‍රික් ටොන් 195,000 ක හිඟයක් සෑම මාසයකම ඇති වන බවට කෘෂිකර්ම තොරතුරු මඟින් අනාවරණය වී ඇති බවත් පැවසීය. ලංකාවේ දැනට තිබෙන සහල් සංචිතය මාස 03 කින් අවසන් වන බවත් ඉන් පසු විදේශ රට වලින් සහල් ආනයනය කිරීමට සිදුවන බවත් පැවසූ එතුමා තවමත් මේ අර්බුදය සාමාන්‍ය ජනතාවට ගැඹුරින් දැනීමට පටන් ගෙන නොමැති නිසා මෙය සරල කරුණක් ලෙස සිතුවද ඉදිරියේදී කෑමට නොමැතිව සෝමාලියාව උගන්ඩාව වැනි රටවල පිටට කුස ඇලී ගිය මිනිසුන් ගේ තත්වයට රටේ ජනතාව පත් වුවහොත් කුමක් සිදු කරන්නේද යන්න සිතා ගත නොහැකි වනු ඇති බව පෙන්වා දෙන ලදී. එම නිසා මේ අර්බුදය උත්සන්න වීමට පෙර මිනිසුන්ට එයට උදව්වක් වන ලෙස මිරිස් පැළයක් හෝ පොහොර ටිකක් ලබා දෙන්නා සේම මෙහි ආදීනව සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමද සිදු කළ යුතුව ඇතැයි පෙන්වා දෙන ලදී. එස් නොමැතිව තෝරා ගත් පවුල් කීපයකට පමණක් මේ සහන ලබා දීමෙන් ගමේ අනෙකුත් පිරිස් කුපිත විය හැකි බවත් අවසානයේ ගමේ අනෙකුත් පිරිස් විසින් මේ පවුල් 10ට යම් ආකාරයක හිංසා පීඩාවන් සිදු කළ හැකි බැවින් සිදු කරනු ලබන උදව්වක් සුළුවෙන් හෝ වේවා සියළුම දෙනාට ලබා දීම වඩාත් යෝග්‍ය බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.20)

ආදර්ශ ගොවිපළවල් සකස් කිරීම සිදු කළ හැක්කේ අප යම් ආහාර සුරක්ෂිතතාවයක සිටින අවස්ථාවේදී බවත් අද වන විට සිදු කළ යුතු වන්නේ ඊ ළඟ යල කන්නයේ අස්වනු ලැබෙන තෙක් ජනතාවගේ කුසගින්නට යම් විසඳුමක් ලබා දීමට හැකි වන වැඩපිළිවෙලක් සකස් කිරීම බවත් පෙන්වා දෙන ලදී. මෙය තමන් දරණ මතය බවත් අනෙක් අයගේ මත වලට තමන් විරුද්ධ නොවන බවත් පවසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කාරක සභාවක් බවට පත්කර මේ කරුණ සම්බන්ධයෙන් ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවෙන් අනතුරුව මහා සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

තමන් පැළ තවානක් සිදු කරන අයෙකු නොවුණත් මේ වන විටත් බීජ සිටුවා පැළ ලබා ගෙන ඒවා තම වසමේ ජනතාව අතර බෙදා දීමේ කාර්ය සිදු කරන බව පවසා සිටියේය. ඒ කාර්ය සඳහා යම් මුදලක් වැය වුණත් එය දරා ගත නොහැකි මට්ටමේ වියදමක් නොවන බවත් මේ ආකාරයට පැළ බෝ කර ගත හොත් පැළ 100 ක් වුවත් ලබා දීමේ හැකියාව පවතින බව පැවසීය. එම නිසා බීජ ලබා දීම වෙනුවට බීජ පැළ කර ඒවා ජනතානට ලබා දීමේ වැඩපිළිවෙලක් සිදු කළ හැකි නම් එය වඩාත් සාර්ථක වනු ඇති බවත් පෙන්වා දෙන ලදී. අද වන විට පවතින අර්බුධකාරී තත්වය හමුවේ වෙළඳුන් විසිනි පාලන මිලකින් තොරව භාණ්ඩ අලෙවි කිරීම සිදු කරන බැවින් එළවළු සඳහා අධික වියදමක් දැරීමට මහජනතාවට සිදුව ඇති බවත් මිරිස් පැළයක් හෝ තම ගෙවත්තේ සිටුවා නොගෙන ඒවාත් වෙළඳපලෙන් මිලදී ගැනීමට ජනතාව පෙළඹී තිබීම හේතුවෙන් මේ වෙළඳ ඒකාධිකාරිය මර්දනය කිරීමට නෙහැකි වී ඇති බව පෙන්වා දෙන ලදී. ඒ වෙනුවට තම නිවස් තුළ හැකි පමණින් හෝ වගා කිරීමට ජනතාව උනන්දු කළහොත් වෙළඳපලේ පාලනයකින් තොරව ඉහල යන එළවළු මිලද පාලනය කළ හැකි බව පැවසීය. එම නිසා උසස් තත්වයේ බීජ ලබා ගෙන පැළ සකස් කර ඒවා ලබා දීමේ වැඩපිළිවෙලක් සකස් කරමු යැයි පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

පැළ තවාන් අදහස හොද බවත් නමුත් වසම තුළ පැළ තවාන් සකස් කිරීම ප්‍රායෝගිකව දුෂ්කර විය හැකිවා සේම ඇතැම් අවස්තා වල එය මන්ත්‍රිවරු කීපයක් නියෝජනය කරන වසම් වලදී ගැටළු සහගත තත්වයකට හේතු විය හැකි බැවින් හොද පැළ තවානක් සම්බන්ද කරගෙන එයින් පැළ ලබා ගැනීම හෝ එසේත් නොමැති නම් බීජ වශයෙන්ම බෙදා දීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

පැළ තවාන් දමන විට බටු සඳහා සති 06 ක කාලයක් යන බවත් ඒ සඳහා සුදුසු පැළ වර්ග හදුනා ගැනීම සිදු කළ යුතු බව පවසා සිටියේය. එසේම මේ ප්‍රදේශයේ පරිසරයට ගැලපෙන බීජ සොයා ගත යුතු බවත් කව්පි ඒ සඳහා වඩාත් යෝග්‍ය බවත් පෙන්වා දෙන ලදී. මෑ කැකිරි වැනි බීජ මඟින් විහාල අස්වැන්නක් ලබා ගත හැකි බවත් පැවසු එතුමා සභාවට සිදු කරන උදව්වක් වශයෙන් තමන් සතු වර්ග අඩි 1000 කට වැඩි ප්‍රමාණයෙන් යුතු ස්ථානය (Net house) පැළ තවාන් කර ගැනීම සඳහා ලබා දිය හැකි බවත් ඒ සඳහා කිසිදු අය කිරීමක් තමන්ට අවශ්‍ය නොවන බවත් මේ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා ලබා දිය හැකි දායකත්වය ඒ ආකාරයෙන් හෝ ලබා දීමට තමන් සූදානම් බව පැවසීය. සභාවේ සේවකයන් යොදවාගෙන පැළ තවාන් කර ගැනීමේ කාර්ය සිදු කළ හැකි බවත් ඉන් පසු එම පැළ ගොවීන් වෙත ලබා දිය හැකි බවත් පවසා සිටියේය. පසු ගිය කාලයේ රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් වසමේ හදුනා ගත් ඉඩමක මිනිස් දින 200 කට රු. 2000.00 බැගින් ගෙවීම් සිදු කර වසමකට රු.7000,000.00 ක් ලැබෙන ලෙස වගා ව්‍යාපෘතියන් හදුන්වා දුන් බවත් මේ වන විට එය ක්‍රියාත්මකකිරීමට ආසන්න බවත් පවසා සිටියේය. සමහර වසම් වල නිලධාරීන් ඒ සඳහා උනන්දු නොවීම මත එය සාර්ථකව සිදු නොවූ බවත් මේ වගා කාර්ය දෛනික වැටුපක් නොමැතිව කැපවීමකින් සිදු නොකළ හොත් සාර්ථක කර ගත නොහැකි බව පෙන්වා දෙන ලදී. එම නිසා සභාව මඟින්ද එවැනි මුදලක් යොදවා මේ කාර්ය සිදු කරමු යැයි පැවසූ එතුමා පැරණි සභා ඉඩමත් මේ සඳහා යොදා ගත හැකි බව පෙන්වා දෙන ලදී. ගෝලීය ආහාර අර්බුදයක් ඉදිරියේදී උද්ගත විය හැකි බවට අනතුරු අඟවා ඇති බැවින් සහ ඉදිරියේදී රාජ්‍ය නිලධාරීන්ටද වගා කටයුතු සඳහා දිනයක් නිවාඩු ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නියමිත බව පැවසීය. මේ සභාව ම ඟින් මීට වඩා මුදල් නාස්ති වන කටයුතු සිදු වී ඇති බවත් මේ අවස්ථාවේ උද්ගතව ඇති අර්බුදය

පිළිබඳව මානුෂීයව සිතා මේ සඳහා මුදල් යෙදවීමට කටයුතු කරමු යැයි පවසා සිටියේය. කොරෝනා අර්බුදය ආරම්භ වන විට රට තුළ සංචරණ සීමා පැනවීම හේතුවෙන් තමන් යටතේ සේවය කරනු ලැබූ සේවකයන් 08 දෙනෙකුට සිය නිවෙස් වලට යාමට නොහැකිව තම සේවා ස්ථානයේ රැඳී සිටීමට සිදු වූ බවත් ඒ අවස්ථාවේ ඔවුන් සමඟ එකතුව තමන් පැළ 50,000 ක් සෑදූ බවත් පසුව ඒවා තම ව්‍යාපාරික ස්ථානය අසල අළෙවියට තබා රුපියල් ලක්ෂ 10 කට ආසන්න මුදලක් උපයා ගත් බව පවසා සිටින ලදී. ඉදිරියේ පැළ සඳහා හොඳ ඉල්ලුමක් ඇති වන බවත් ඒ නිසා සේවකයන් යොදවාගෙන හෝ වගා කටයුතු සිදු කර එයින් 50%ක් ඔවුන්ට ලබා දී ඉතිරි 50% සභාවට ලබා ගැනීමට ක්‍රියා කිරීමත් සිදු කළ හැකි බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඉදිරියේ ඇති විය හැකි ආහාර හිඟයට මුහුණ දීම සඳහා පෙර සූදානමක් ලෙස හෙට දිනයේ සභාවේ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ආදර්ශ වගාවක් ආරම්භ කිරීම සඳහා ශ්‍රමදානයක් පැවැත්වෙන බවත් මීට පෙරත් මේ ස්ථානයේ ආදර්ශ ගෙවත්තක් සකස් කර තිබුණත් වර්ෂාව සහ කාර්ය මණ්ඩලයේ හිඟකම මත නඩත්තු කටයුතු සිදු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් එය අසාර්ථක වූ බවත් හෙට දිනයේ නැවත එය ආරම්භ කරමින් මේ සඳහා පූර්වාදර්ශය සැපයීමට බලාපොරොත්තු වන බව පවසා සිටියේය.මේ කාර්ය සඳහා සහභාගී වන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන බවත් පැවසීය. එසේම සභා කාර්යාලයේ ඉහල මහලේ මෙන්ම කොරිඩෝ වලත් බඳුන්ගත වගාවන් සිදු කිරීමට ක්‍රියා කරන බවත් ඒවායේ නඩත්තු කටයුතු කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ඇති බවත් පවසා සිටියේය. මහජනතාවගේ බදු මුදලින් නඩත්තු වන මේ ආයතන වලින් ඔවුන්ට සාධාරණයක් වන ලෙස සේවයක් සැලසීම ප්‍රධාන අභිප්‍රාය ලෙස සලකා කටයුතු කරන බවත් මන්ත්‍රීතුමන්ලාගේ අදහස් සියල්ලටම ඇහුම්කන්දී වඩාත් කාලෝචිත හා සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට නිරන්තරයෙන්ම උත්සාහ කරන බව පවසා සිටියේය. ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සඳහන් කළ ආකාරයට තවාන් ක්‍රමයත් යෝග්‍ය බැවින් ඉදිරියේදී ඒ සඳහාත් අවධානය යොමු කරන බව පවසා සිටියේය. පසු ගිය කාලයේදීත් මහජනතාවට විවිධ අවස්ථාවල නොයෙකුත් පැල වර්ග, ගස්, සහ බීජ ආදිය ලබා දුන්නත් බොහෝ වැඩපිළිවෙලවල් අසාර්ථක වීමට හේතු වූයේ අධීක්ෂණ කටයුතු සහ පසු විපරම් නිසි ආකාරයෙන් සිදු නොවීම මත බව පෙන්වා දෙන ලදී. ඒ හේතුවෙන් බොහෝ අවස්ථා වල මහජන නියෝජිතයන් ජනතා දෝෂදර්ශනයට ලක් වුවත් වසමක මහජන නියෝජිතයා හැරුනුකොට නිලධාරින් 06 දෙනෙකු සිටින බවත් ඔවුන්ගෙන් සිදු විය යුතු කාර්ය නිසි ආකාරයෙන් සිදු නොවූ බවත් පැවසීය. එම නිසා මේ කාර්යයේදී එහි සම්පූර්ණ වගකීම මහජන නියෝජිතයන්ට ලබා දීමට තීරණය කළ බවත් එම නිසා සම්පූර්ණයෙන්ම මේ කාර්ය ඍජු මහජන නියෝජිතයන්ගේ අධීක්ෂණය යටතේ සිදු වන අතර ඉදිරියේදී නිලධාරීන් විසින් සිදු කරන කාර්යන්ද මහජන නියෝජිතයන් සිදු කරන කාර්යන්ද සාර්ථ වන්නේ යන ආදර්ශය මේ සභාව මඟින් රටට ලබා දීම තම අපේක්ෂාව බව පවසා සිටියේය. තමන් පෞද්ගලිකව කෘෂිකර්මාන්තයේ නිරත වන අයෙකු බවත් මේ කන්නයේදී කුඹුරු අක්කර 2 ½ ක් වගා කළ බවත් ඉදිරියේදීත් එම කටයුතු සිදු කරන බවත් පැවසීය. එසේම පුරන් කුඹුරු අස්වැද්දීමේ කාර්ය සඳහා ප්‍රධාන මාර්ගයේ ඇති කුඹුරක් තෝරාගෙන ආදර්ශ කුඹුරක් සකස් කිරීම අපේක්ෂා කරන බව පවසා සිටියේය.

සංශෝධිත යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

කල් දී නැති යෝජනා

**02 (i) ගරු සභාපති දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා :**

දයිගල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර දයිගල කැකිල්ල ප්‍රධාන මාර්ගයේ ආපදා ගම්මානය අසල ඇති ප්‍රධාන බෝක්කුව පසුගිය දින වලදී ඇති වූ දැඩි වර්ෂාව හේතුවෙන් සහමුලින්ම විනාශ වී ගොස් ඇත. එම හේතුවෙන් ඒ මාර්ගයේ ගමන් ගන්නා ප්‍රදේශයේ ජනතාව දැඩි ලෙස පීඩාවට පත්ව ඇති අතර , එය කඩිනමින් පිළිසකර කළ යුතුව ඇත. එසේ නොකළහොත් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය කටයුතු සිදු කර ගත නොහැක. ප්‍රදේශයේ ජනතාවගේ ශ්‍රම දායකත්වයෙන් මෙම බෝක්කුව සකස් කර ගැනීමට සූදානම්ව සිටී. එම කාර්ය සිදු කර ගඅනීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් ද්‍රව්‍ය ආධාර අපේක්ෂා කරයි. ඒ සඳහා 3/4 ගල්, වැලි, සිමෙන්ති ලබා ගැනීම සඳහා රුපියල් හැත්තෑපන්දහසක මුදලක් සහා අරමුදලින් ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා :**

පසු ගිය කාලයේ ඇදහැලුනු අධික වැසි හේතුවෙන් මෙම බෝක්කුව කැඩී ගොස් අද වන විට ගමනාගමනයට නොහැකි වන පරිදි අබලන් වී ඇති බව පැවසීය. මේ නිසා එම මාර්ගය භාවිතා කරන ජනතාව විශාල දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බැවින් සභාවෙන් සිදු විය යුත්තේ කුමක්දැයි යන්න සම්බන්දයෙන් ගම්වාසින්ගෙන් කළ විමසීමකදී පාලම සකස් කර ගැනීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා යම් දායකත්වයක් සපයන ලෙස ඉල්ලා සිටි බව පැවසීය . ඒ අනුව සලකා බලා යෝජනාවේ සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා රු. 75,000.00 ක මුදලට වටිනා ද්‍රව්‍යාධාර ලබා දීමට කටයුතු කරන බව පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම හා වෙනත් දිනයක් නියම කිරීම:**

2022.05.26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා (ඇමුණුම 02) , 2022.05.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව (ඇමුණුම 03) ,2022.05.26 දින පැවති කාර්මික හි සේවා කාරක සභා වාර්තාව (ඇමුණුම 04), 2022.05.26 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව (ඇමුණුම 05) සහ 2022.05.26 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා වාර්තා (ඇමුණුම 06) සලකා බලන ලදී.

(උ) 2022 මැයි මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව (ඇමුණුම 07) හා වියදම් විස්තරය (ඇමුණුම 08)

ආදායම් ප්‍රගති වාර්තාව - 2022 මැයි

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

ඇමුණුම 07

| අනු අංකය | (I) ආදායම් විෂය | (II) අය ශීර්ෂය | හිඟ ආදායම (III) 2022.01.01 දිනට ශේෂය රු. | (IV) පසුගිය මාසය දක්වා එකතු කළ ආදායම රු. | (V) ප්‍රවර්තන මාසය තුළ එකතුකළ ආදායම | (VI) මුළු එකතුව රු. | (VII) ප්‍රතිශතය % | (VIII) තව දුරටත් පවත්නා හිඟය (III) - (VI) | ඇස්තමේන්තු ගත ආදායම (IX) 2022 අයවැය ඇස්තමේන්තුව රු. | (X) පසුගිය මාසය දක්වා එකතු කළ ආදායම රු. | (XI) ප්‍රවර්තන මාසය තුළ එකතුකළ ආදායම | (XII) මුළු එකතුව රු. | (XIII) ප්‍රතිශතය % | (XIV) වර්ෂයේ ලැබීම් වලින් හිඟය රු. (IX)-(XII) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | වරිපනම් බදු | 1.11 | 2,034,397 | 300,592 | 51,845 | 352,437 | 17% | **1,681,960** | 3,038,000 | 1,145,708 | 137,645 | 1,283,353 | 42% | **1,754,647** |
| 02. | අක්කර බදු | 1.12 | 2,111,057 | 51,363 | 9,861 | 61,224 | 3% | **2,049,833** | 150,000 | 38,548 | 16,564 | 55,112 | 37% | **94,888** |
| 03. | දැන්වීම් පුවරු ගාස්තු | 1.36 | - | - | | - | 0% | - | 125,000 | 22,250 | 3,300 | 25,550 | 20% | **99,450** |
| 04. | වෙළඳ බලපත්‍ර ගාස්තු | 2.31 | - | - | | - | 0% | - | 260,000 | 132,623 | 13,000 | 145,623 | 56% | **114,377** |
| 05.I | කර්මාන්ත බදු | 2.16.1 | - | - | | - | | - | 680,000 | 388,000 | 44,500 | 432,500 | 64% | **247,500** |
| 05.II | ව්‍යාපාර බදු | 2.16.2 | - | - | | - | 0% | - | 430,000 | 312,000 | 45,000 | 357,000 | 83% | **73,000** |
| 06. | පාරිසරික බලපත්‍ර ගාස්තු | 2.36 | - | - | | - | 0% | - | 120,000 | 20,000 | - | 20,000 | 17% | **100,000** |
| 07. | කොම්පෝස්ට් පොහොර /අබලි ද්‍රව්‍ය විකුණුම් | 2.62.2 | - | - | | - | 0% | - | 800,000 | 166,077 | 2,250 | 168,327 | 21% | **631,673** |
| 08. | ඉඩම් විකිණීම මත 1% බද්ද | 3.18 | - | - | | - | 0% | - | 150,000 | 96,860 | - | 96,860 | 65% | **53,140** |
| 09. | පොදු වෙළඳ සංකීර්ණ කඩ කුලී | 3.22.2<br>3.22.3 | 1,478,827 | 162,500 | 4,000 | 166,500 | 11% | **1,312,327** | 1,935,000 | 223,250 | 52,750 | 276,000 | 14% | **1,659,000** |
| 10. | අනෙකුත් කඩ කාමර කුලී | 3.22.1<br>5.22 | 32,508 | 675 | - | 675 | 2% | **31,833** | 169,800 | 52,200 | 10,000 | 62,200 | 37% | **107,600** |
| 11. | ඉඩම් වල එළදාව බදු දීම | 3.24 | - | - | - | - | 0% | - | 7,600 | - | - | - | 0% | **7,600** |
| 12. | යන්ත්‍රෝපකරණ කුලියට දීම | 3.25.1 | - | - | - | - | 0% | - | 1,500,000 | 207,500 | 36,900 | 244,400 | 16% | **1,255,600** |
| 13. | නගර ශාලා/ පූජා ශාලා | 3.25.3 | - | - | - | - | 0% | - | 500,000 | 83,000 | 40,000 | 123,000 | 25% | **377,000** |
| 14. | භූමිය කුලියට දීම/ වාහන නැවතුම් ගාස්තු | 3.43.2 | - | - | - | - | 0% | - | 50,000 | 31,913 | 5,250 | 37,163 | 74% | **12,838** |
| 15. | සතිපොළ ආදායම් | 5.23.1 | 196,250 | - | - | - | 0% | 196,250 | 1,894,000 | 557,730 | 116,360 | 674,090 | 36% | **1,219,910** |
| 16. | මස් කඩ හා මාළු කඩ කුලී | 5.23.2 | 3,450,256 | - | - | - | 0% | **3,450,256** | 6,867,000 | 2,356,941 | 691,023 | 3,047,964 | 44% | **3,819,036** |
| 17. | ආදාහනාගාර ගාස්තු | 5.43.1 | - | - | - | - | 0% | - | 2,000,000 | 942,400 | 164,000 | 1,106,400 | 55% | **893,600** |
| 18. | විනෝද බදු | 6.15 | - | - | - | - | 0% | - | 25,000 | 87,500 | - | 87,500 | 350% | **(62,500)** |
| 19. | වෙනත් ආදායම් (මාකට් කඩ, මස් මාළු කඩ, සති පොළ දඩ) | 5.51.1<br>3.51.1<br>5.51.2 | 231,080 | 15,793 | 800 | 16,593 | 7% | **214,488** | 101,000 | 5,090 | 11,183 | 16,273 | 16% | **84,727** |
| 20 | පුස්තකාල සාමාජික ගාස්තු | 6.43 | | | | | | | 47,800 | 14,812 | 320 | 15,132 | 32% | **32,668** |
| | එකතුව | | **9,534,375** | **530,923** | **66,506** | **597,428** | **6%** | **8,936,946** | **20,850,200** | **6,884,402** | **1,390,044** | **8,274,446** | **40%** | **12,575,754** |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 21. | මුද්දර ගාස්තු | 1.63 | 21,509,330 | 7,072,110 | - | 7,072,110 | 33% | **14,437,220** | 20,000,000 | - | - | - | 0% | **20,000,000** |
| 22. | උසාවි දඩ | 1.52 | 4,722,034 | 892,500 | - | 892,500 | 19% | **3,829,534** | 5,000,000 | 4,237,868 | - | 4,237,868 | 85% | **762,132** |

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## 2022 මැයි මාසය සඳහා ආදායම් හා වියදම් විස්තරය

**(01)** ආදායම් විස්තරය

| අය ශීර්ෂය | ආදායම් විස්තරය | මුදල (රු) | |
|---|---|---|---|
| | පුනරාවර්ථන ආදායම් | | |
| 10 | වරිපනම් හා බදු | 305,414.07 | |
| 20 | කුලී | 972,633.01 | |
| 30 | බලපත්‍ර ගාස්තු | 16,300.00 | |
| 40 | සේවා සඳහා ගාස්තු | 355,900.00 | |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 17,939.09 | |
| 60 | වෙනත් ආදායම් | 37,083.90 | |
| 70 | ආදායම් ආධාර | 3,740,638.39 | |
| | පුනරාවර්ථන ආදායම් එකතුව | | 5,445,908.46 |
| 80 | ප්‍රාග්ධන ආදායම් | | 20,000.00 |
| | පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | | **5,465,908.46** |
| | වෙනත් ආදායම් | | |
| | විවිධ ණය ගැතියෝ (කර්මාන්ත) | 351,528.98 | |
| | ගිවිසුම් ඇප තැන්පත් | - | |
| | ස්ථාවර තැන්පත් නිදහස් කිරීම | - | |
| | සේවක ණය | 250,291.00 | |
| | අත්තිකාරම් | 235,825.53 | |
| | මුද්දර බදු තැන්පත් | 8,800.00 | |
| | ටෙන්ඩර් තැන්පත් | - | |
| | ස්ථාවර තැන්පත් නිදහස් කිරීම | 23,873,606.49 | |
| | මිශ්‍ර තැන්පත් | 20,000.00 | |
| | වෙනත් ආදායම් එකතුව | | 24,740,052.00 |
| | මුළු ආදායම් එකතුව | | **30,205,960.46** |

**(02)** වියදම් විස්තරය

| වැය ශීර්ෂය | වියදම් විස්තරය | මුදල (රු) | |
|---|---|---|---|
| | පුනරාවර්ථන වියදම් | | |
| 1 | වැටුප් හා වේතන | 4,792,340.31 | |
| 2 | ගමන් වියදම් | 29,525.90 | |
| 3 | සැපයුම් හා උපකරණ | 1,556,273.50 | |
| 4 | ප්‍රා.ව. අ.වැ. හා නඩත්තු | 401,135.00 | |
| 5 | ප්‍ර.සම්, ආවශ්‍යක හා වෙනත් සේවා | 349,315.17 | |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 48,675.74 | |
| 7 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | - | |
| 8 | විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ | 63,246.00 | |
| | පුනරාවර්තන වියදම් එකතුව | | **7,240,511.62** |
| | ප්‍රාග්ධන වියදම් | | |
| 9 | ප්‍රාග්ධන / උපකරණ වැය | 15,000.00 | |
| 10 | ණය ආපසු ගෙවීම් | 107,460.57 | |
| | ප්‍රාග්ධන වියදම් එකතුව | | **122,460.57** |
| | පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් එකතුව | | **7,362,972.19** |
| | වෙනත් වියදම් | | |
| | සේවක ණය | 250,000.00 | |
| | අත්තිකාරම් | 114,481.11 | |
| | මිශ්‍ර තැන්පත් | 43,500.00 | |
| | ණය හිමියෝ | 453,800.00 | |
| | ගිණුම් අතර මුදල් මාරු කිරීම | - | |
| | මුද්දර බදු තැන්පත් | - | |
| | ස්ථාවර තැන්පත් ආයෝජන | 21,000,000.00 | |
| | වෙනත් වියදම් එකතුව | | 21,861,781.11 |

**(උෟ) වෙනත් කරුණු:**

සභාවට දන්වා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම:

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය අසනීප තත්වයක් හේතුවෙන් අද දින මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවන බවට දැනුම් දී ඇති බැවින් එතුමිය වෙනුවෙන් අසනීප නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණියගේ අසනීප නිවාඩු අනුමත විය.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

වැදගත් යෝජනාවක් වෙනුවෙන් මේ ස්ථානයේ මෙතෙක් වේලා රැඳී සිටි සියළුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වන බව පවසා සිටියේය. රටේ තිබෙන ආර්ථික ගැටළු ගැන තමන් හැමදාම ප්‍රකාශ කළ බවත් එන බඩු පාලනය වීමක් සතොස ආයතන වල තිබෙන බවත් සතොස හා අනෙකුත් සුපිරි වෙළඳසැල් වල රු 570.00 ට පරිප්පු කිලෝව අළෙවි කරන විට නගරයේ අනෙකුත් මහා පරිමාණ තොග වෙළඳසැල් වල පරිප්පු කිලෝව රු. 670.00 ක මිලට අළෙවි කරන බව පෙන්වා දෙන ලදී. සාමාන්‍ය ජනතාව සුපිරි වෙළඳසැල් වලින් බඩු ලබා ගැනීමට බියක් දක්වන බවත් එලෙස බැලූ විට සාමාන්‍ය ජනතාවට තොග කඩ වලින් වැඩි මිලක් ගෙවා පරිප්පු මිලදී ගැනීමට සිදු වී ඇති බවත් පෙන්වා දෙන ලදී. ඒ අනුව බලන විට මේ අර්බුදකාරී අවස්ථාව මහා පරිමාණ තොග වෙළඳුන් සිය අරමුණු ඉටු කර ගැනීම සහා උපයෝගී කරගෙන තිබෙන බව පැහැදිලි වන බවත් නමුත් ඒවාට විරුද්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් ගැනීමට නොහැකි වීම කණගාටුවට කරුණක් බවත් පැවසීය. සතොස ම හින් නිකුත් කරන ලබන භාණ්ඩ කළමනාකරනය කර සාධාරණ ලෙස මහජනතාවට ලබා දීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කරනු වෙනුවට තමන් මේ සභාවේදී සතොස සම්බන්ධයෙන් ප්‍රකාශ කරනු ලබන විවේචන එම ආයතනයේ සේවකයන්ට පැවසීමට මුල් වන පිරිසක් අප අ.ර සිටීම සම්බන්ධයෙන් කණගාටු වන බවත් පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී එම්.එම්.ඒ.ෆර්හාන් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 1.00 )

මේ සභාවට මහජන නියෝජිතයෙකු ලෙස තේරී පත්ව එන තෙක්ම මන්ත්‍රීවරයෙකු වන්නේ නම් ගමේ මඟුල් ගෙදරට, මරණ ගෙදරට ගොස් මහජනතාව ඉදිරියේ පෙනී සිටිනවා නම් එය ප්‍රමාණවත් බවට තමන් විශ්වාස කළ බවත් නමුත් මහජනතාව විසින් තෝරා පත් කරන ලද මහජන නියෝජිතයන්ට ඊට වඩා විශාල වගකීමක් තිබෙන බව දැන් අවබෝධ කරගෙන තිබෙන පව පවසා සිටියේය. සිදු වන අක්‍රමිකතා හෙලිදරව් කිරීම මහජන නියොජිතයන්ගේ වගකීම බවත් ඒවාට විරුද්ධ වී සාධාරණ ලෙස ක්‍රියා කිරීමට අදාල පාර්ශව වලට බලපෑම් කිරීමද සිදු කළ යුතු බව පවසා සිටියේය. දෙහිඕවිට බල ප්‍රදේශය තුළ තිබෙන සතොස අලෙවි සැල් වෙත ගොස් ඒවායේ මහජනතාවට අවශ්‍ය භාණ්ඩ තිබේද යන්න පරීක්ෂා කර බලන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටි එතුමා සතොස මඟින් අඩු මිලට සාමාන්‍ය ජනතාවට ගැනීමට තිබෙන භාණ්ඩ හොර රහසේ වෙනත් තොග වෙළඳ සැල් වෙත මාරු කර යැවීමේ සූක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බවත් පවසා සිටින ලදී. ඇතැම් ප්‍රදේශ වල මහජන නියෝජිතයන් සතොසින් බඩු රැගෙන ඒවා තොග වෙළඳසැල් වෙත විකිණීම සිදු කරන බවත් රජයක් ලෙස පීඩාවට පත්ව සිටින ජනතාවට යම් ආකාරයකින් හෝ සහන සැලසීමේ අරමුණින් යම් යම් ක්‍රියා මාර්ග ගැනීමේදී ඒවා මෙවැනි කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් ඒවා අසාර්ථක වන බවත් එයින් තවත් ජනතාවට පවතින රජය කෙරෙහි අප්‍රසාදයක් උද්ගත වන බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 01.10)

එසේම මේ වන විට පවතින ඉන්ධන අර්බුදය තුළත් තම දරුවා කොළඹ පාසල් වෙත යැවීමට එක් දරුවෙක් සඳහා වාහනයක් මාර්ගයට යොදනව පවුල් සිටින බවත් මෙතරම් පාසල් වෑන් රථ හා බස් රථ ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් එම පාසල් වෙතම යද්දී එක් දරුවෙක් වෙනුවෙන් ඉන්ධන දහනය කරමින් වාහනයක් මහා මාර්ගයට යොමු කරන පිරිස් මේ අවස්ථාවේ යම් ආකාරයකට මානුෂීය විය යුතු බව පැවසීය. එසේම අමාත්‍යාංශ ලේකම්වරුන්ට අමතරව පෞද්ගලික ලේකම්වරු තබා ගෙන ලක්ෂ ගණින් ඔවුන්ටත් වැටුප් ලබාදීමේ ක්‍රමවේද ඉවත් විය යුතු බවත් කුමන පක්ෂයක , රජයක වේවා අසාධාරණයක් සිදු වන්නේ නම් එයට විරුද්ධ වීමට කාලය පැමිණ ඇති බැවින් නිහඬව නොසිට මේ සම්බන්ධයෙන් කතා කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී. ඇතැම් විට මෙහි ඇති අසාධාරණය දුටුවත් පක්ෂ ප්‍රතිපත්ති තුළ අසරණ වී සිටින මන්ත්‍රීවරුන්ට මේවාට විරුද්ධව කතා කිරීමට නොහැකි තත්වයක් තිබෙන බවත් සැබෑ මහජන නියෝජිතයන් ලෙස පක්ෂ පාට භේදයකින් තොරව මේ සඳහා විරුද්ධ වීමට කාලය පැමිණ ඇති බව පවසා සිටින ලදී. එසේම මේ සභාවේදී ප්‍රදේශයේ ජලය සම්බන්ධයෙන් තමන් සිදු කළ ප්‍රකාශය වැරදි ලෙස සමාජ ගත වූ බවත් කාර්ය මණ්ඩලයට ජලය ලබා දීම සම්බන්ධයෙන් තමන් විරුද්ධ වූ බවට ප්‍රචාරයක් ගියත් එදා තමන් පැවසුවේ ජල සම්පාදන මණ්ඩලයට ජල බිල්පත් ගෙවා ප්‍රදේශයේ ජනතාව ලබා ගන්නා ජලයේ ඇති අපිරිසිදු භාවය පිළිබඳව බවත් එම ජලය නගරයේ වැසියන්ට පානය කිරීමට හැකි නම් අනිකුත් පුද්ගලයන්ට නොහැකි වන්නේ ඇයිද යන්න තමන් ප්‍රශ්න කළ  බවත් පවසා සිටියේය. එම ප්‍රකාශයෙන් පසු ඊළඟ මහා සභා රැස්වීමට වීදුරු වල ජලය දමා තිබූ බවත් පසු නැවත පානීය ජල බෝතල් මිලදී ගැනීම සිදු කර මහා සභා රැස්වීම් සඳහා ඒවා ලබා දීමට ක්‍රියා කළ බවත් පැවසූ එතුමා මේ වන විට එම බෝතල් වල මිලත් අධික ලෙස ඉහල ගොස් ඇති බැවින් තමන්ට එම ජල බෝතල් නොතියන ලෙසත් මින් ඉදිරියට මහා සභා රැස්වීම් සඳහා පැමිණෙන විට තමන්නිවසින් ජල බෝතලයක් රැගෙන ඒම අද දින සිට ආරම්භ කළ බවත් මේ රැස්වීමට පැමිණෙන අනෙකුත් මහජන නියෝජිතයන්ටත් ඒ ක්‍රමවේදය අනුගමනය කිරීමේ හැකියාව ඇති බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.ප:ව: 01.11)

එසේම මේ සභාවේ මුරකරුවෙකු විසින් ඉන්ධන පිරවුම්හල අසල මාර්ගයේ  වාහන එහා මෙහා කිරීමට සහය ලබා දෙන බවත් ඔහු එම කාර්ය සිදු කරන්නේ සභාපතිතුමා දැනුවත්වද යන්න තමන් නොදන්නා බවත් නමුත් කෙසේ හෝ ඔහුගෙන් සිදු වන්නේ එක්තරා ආකාරයක සේවයක් බව පවසා සිටියේය. පෞද්ගලිකව මේ ධූර කාලයේ වසර 04 තුළ තමන්ට හිමි මන්ත්‍රී දීමනා වලින් ජාතික පාසලේ ප්‍රවේශ මාර්ගයේ ඉන්ටලොක් ගල් ඇතිරීම සඳහා යෝජනාවක් පමණක් ලබා දී ඇති බවත් නමුත් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් සිහිපත් කළ එතුමා ඊට වඩා කිසිවක් මේ සභාවෙන් තමන් ලබා ගෙන නොමැති බව පෙන්වා දෙන ලදී. නමුත් විශාල වශයෙන් මාර්ග, බෝක්කු ආදිය සෑදීමේ කටයුතු මෑතක් වන තුරුත් සිදු වූ බව පැවසූ එතුමා නගරයේ ඇති අනවසර වෙළඳසැල් ඉවත් කර ඔවුන්ට සභාව අසල තාවකාලික කඩ පේළියක් හෝ සාදා දෙමුයැයි තමන් අවස්ථා කීපයකදී ප්‍රකාශ කළත් ඒ කිසිවක් සම්බබන්ධයෙන් යහපත් ප්‍රතිචාර නොලැබුණු බව පවසා සිටින ලදී. එසේම මීට පෙර අවස්ථා ගණනාවකදීම තමන් සඳහන් කළ ඉරට් වත්ත මාර්ගය සකස් කිරීමේදී සිදු වූ බරපතල මූල්‍ය වංචා සඳහා වගකිව යුතු පිරිස සම්බන්ධයෙන් පැහැදිලි හෙළිදරව්වක් සිදු කිරීමට මෙම සභාව අපොහොසත් වූ බවත් එවැනි කාර්යන දිගින් දිගටම ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් ඇති වන්නේ විශාල කලකිරීමක් බවත් පැවසීය.

**ගරු සභාපති දම්නු ශ්‍යාමින්ද මැතිතුමා :**

ඉරට්වත්ත මාර්ගය සකස් කිරීම යහපාලන රජය සමයේ හිටපු අමාත්‍ය තොන්ඩමන් මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ජාතික වැවිලි කර්මාන්ත භාරය මගින් සිදු කළ බවත් එය සෘජුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදු වීඇති කාර්යක් බවත් පැවසීය. මේ සම්බන්ධයෙන් සභාව හෝ ප්‍රෙද්ශයේ වෙනත් ආයතන කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවත් පවසා සිටියේය. ඒ සම්බන්ධයෙන් තමන් සම්බන්ධීකරණ කමිටුවේදී විමසීම් සිදු කළ බවත් ඔවුන් මෙය පැහැදිලි කර දුන් බවත් පැවසූ එතුමා අමාත්‍යාංශ මට්ටමින් සිදු කරන ලද කාර්යන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ හැකියාවක් පළාත් පාලන ආයතනයක් වශයෙන් මේ සභාවට නොමැති බව පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා :**

දෙබෑගම කඹුරාපොළ මාර්ගය සම්බන්ධයෙන් නැවතත් මහජන පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇති බවත් ගරු මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණියගේ නිවස අසල බෝක්කුව අවහිර වීම මත ජලය මාර්ගය පුරා ගලා යන බවත් මේ හේතුවෙන් මහජනතාවට මාර්ගයේ ගමන් කිරීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බව පවසා සිටින ලදී. ඒ මාර්ගයේ ජනතාව තම නිවසට පැමිණ මේ සම්බන්ධයෙන් මැදිහත් වන ලෙස තමාගෙන් ඉල්ලා සිටි බවත් ඒ මාර්ගය සභාවට අයත් මාර්ගයක් නොව බැවින් සභාවට මැදිහත් වීමට නොහැකි නම් මාර්ගයෙන් යන ජල පාර ඉවත් කර ගැනීමට කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා විධායක ඉංජිනේරු කාර්යාලයට දන්වා සිටින ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

තමන්ට සිදු වී ඇති පෞද්ගලික හානියක් සම්බන්ධයෙන් සභාව දැනුවත් කිරීමට අවශ්‍ය බව පවසා සිටියේය. පසු ගිය මාසයේ මහා සභා රැස්වීමේදී තමන් සභා ගර්භය තුළ නොසිටි අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා විසින් යහපාලන කාලය තුළ දින 100 ව්‍යාපෘතිය යටතේ විපක්ෂ නායකතුමාගේ කනංගම නිවසට යන මාර්ගය සකස් කර ගත් බවට ප්‍රකාශයක් සිදු කර ඇති බව පැවසීය. අද දින මේ සභා වාර්තාව සභළා සම්මත කරන තෙක් තමන් නිහඬව සිටියේ එම ප්‍රකාශයේ යම් නිවැරදි කිරීමක් සිදු කර ගැනීමට තිබුණා නම් අදාල මන්ත්‍රීතුමාට ඒ සඳහා අවස්ථාව තිබූ බැවින් බවත් නමුත් එතුමා විසින් එලෙස සිදු කර නොගැනීම නිසා මා ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් සිදු කළ යුතු බවට තීරණය කළ බව පැවසීය. යහපාලන ආණ්ඩුව කාලයේ දින 100 වැඩසටහන යටතේ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වූ බවත් මේවා සඳහා එක් ග්‍රාම නිලධාරී වසමකට රුපියල් ලක්ෂ 10ක මුදලක් ලැබුණු බවත් ඒයටතේ කනංගම වසම තුළ කුරුදු වත්ත අමුණ හා ළිඳ ගහ මුල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රතිපාදන හිමි වූ බව පැවසීය. තමන්ට කනංගම ඉඩමක් තිබෙන බවත් නමුත් නිවසක් නොමැති බවත් පැවසීය.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ප:ව: 01.22)

මේ මාර්ගයේ මුලින් තිබී ඇත්තේ නියරක් බවත් මාර්ගය සකස් කිරීමට සරත් විජේසිරි මැතිතුමා හා අබේසේන මැතිතුමා මුල් වූ අතර මුල් අදියරේ පැති බැම්ම සකස් කිරීමට මුල් වී ක්‍රියා කර ඇත්තේ ගරු මන්ත්‍රී අබේසේන මැතිතුමා බවත් පැවසීය. 2009 වර්ෂයේ තමන් අදාල ඉඩම මිලට ගෙන එයට යාමට මාර්ගයක් නොමැති බැවින් තම පෞද්ගලික වියදමින් අනික් ඉඩම් වලට මුදල් ගෙවා බැති බැම්ම සම්පූර්ණ කළ බව පැවසීය. තම වත්ත එම මාර්ගයේ අවසන් කොටසේ ඇති බවත් වගුරු හේන මාර්ගයේ ආරම්භයේ සිට පවුල් 15කට ආසන්න පිරිසක් ඒ මාර්ගය භාවිතා කරන බව පැවසූ එතුමා ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ 2017 හෝ 2018 වර්ෂයේදී ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම මත රුපියල් ලක්ෂ 10 මුදලින් කොන්ක්‍රීට් කළ බවත් එය වසම් සියල්ලගේම ඉහත ව්‍යාපෘතියට අදාලව සිදු කරන ලද සංවර්ධන කටයුතු වලට සමගාමීව සිදු කරන ලද්දක් බවත් පවසා සිටියේය. එතැන් සිට තම ඉඩමට යන තෙක් ඇති කොටස කුවිතාන්සියක් මඟින් මිලට ගෙන තම පෞද්ගලික වියදමින් කොන්ක්‍රීට් කර ගෙන ඇති බවත් ඒ තම වාහනයේ ටයර් ප්‍රමාණය ආවරණය වන තරමට පමණක් බවත් පැවසූ එතුමා ඒ සඳහා රජයේ මුදල් යොදා නොගත් බව වගකීමෙන් ප්‍රකාශ කරන බව පවසා සිටයේය. එම නිසා සභා වාර්තාවට ඇතුලත් වන ප්‍රකාශ වලදී මේ ආකාරයට පදනම් විරහිත චෝදනා සිදු කර තම කීර්ති නාමයට හානි සිදු වන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීම සම්බන්ධයෙන් කණගාටු වන බව පවසා සිටින ලදී. එසේම මීට පෙර අවස්ථාවකදී අදාල මන්ත්‍රීතුමා මෙවැනි ප්‍රකාශ සිදු කළ බවත් ඉරට් වත්ත මාර්ගය සම්බන්ධයෙන් සිදු කළ ප්‍රකාශද එවැනි ඒවා බව පැවසීය. නමුත් ඒ සඳහා අදාල පිළිතුරු අද දින ගරු සභාපතිතුමා විසින් සිදු කළ බවත් එවකට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීනී තුසිතා විජේමාන්න මැතිණිය මේ මාර්ගය සම්බන්ධ ගැටළුව පිළිබඳව සොයා බැලිය යුතු බව පවසා කෑගල්ලේ පිහිටි අදාල ආයතනයට ගිය බවත් නමුත් ව්‍යාපෘතිය සිදු කළ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට නොහැකි වූ බවත් පැවසීය. යහපාලන රජය සමයේ මේ ව්‍යාපෘතියේ සිදු වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් සැබවින්ම එම නායකයන්ද කණගාටු වූ බව

පැවසීය. එසේම මීට පෙර අවස්ථාවක තමන් සතු දෙබෑගම වත්තට යන මාර්ගය කොන්ක්‍රීට් කළ බවටත් මේ මන්ත්‍රීතුමා විසින් මීට පෙර අවස්ථාවක තමන්ට චෝදනා කළ බවත් ඒ සම්බන්දයෙන්ද පැහැදිලි කිරීමක් සිදු කළ යුතු බව පවසා සිටින ලදී. දෙබෑගම වසම නියෝජනය කරන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා මෙන්ම ගරු උප සභාපතිතුමාද මේ සම්බන්ධයෙන් දන්නා බවත් සාප්පු වත්ත හරහා වැටී ඇති මාර්ගය ටී.එච්.චන්ද්‍රදාස මුදලාලි මහතා විසින් මිලදී ගෙන තිබූ අක්කර 36 ක ඉඩමට යාමට එතුමා විසින් සිය මුදලින් පාලමක් සකස් කර තිබූ බවත් අද වන විටත් යම් යම් පැලැස්තර යොදා භාවිතා කරනු ලබන්නේ එකී පාලම බවත් පැවසීය. එම වත්තට යාමට මාර්ගයක් නොතිබූ බවත් ඉරට් වත්තේ පවුල් 40 කට ආසන්න වතු ජනතාව හා පවුල් 20 ක් වූ ගමේ ජනතාව සඳහා එම මාර්ගය සකස් කිරීමට හා ගැසට් කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා මුල් වී ක්‍රියා කළ බවත් එසේම එම ගමේ සිටි තිලකා ප්‍රනාන්දු මහත්මියත් මේ සඳහා මුල් වී ක්‍රියා කළ බව පැවසීය. එසේම පසුව ඒ ප්‍රදේශයට විදුලිය ලබා දී පවුල් 70 කට ආසන්න ප්‍රමාණයකට මේ වන විට එයින් ප්‍රයෝජන සැලසෙන බව පැවසීය. ඒ වන විට තමන් දෙබෑගම ඉඩමක් මිලදී ගෙන නොතිබුණු බවත් 2015 වර්ෂයේ ඔක්තොම්බර් මාසයේ පෙර සඳහන් කළ චන්ද්‍රදාස මුදලාලි මහතාගේ දරුවන් විසින් විකුණන ලද එක් කොටසක් බැංකු ණයක් ලබා ගෙන මිලදී ගත් බව පැවසීය. පසුව 2016 හෝ 2017 වර්ෂයේ රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයට හිමි වූ ගල් තාර ඇතිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ග නම් කිරීමට සිදු වූ බවත් ඒ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තමන්ට පැවරී තිබූ බවත් ඒ යටතේ අදාල මාර්ගය සඳහා ප්‍රතිපාදන වෙන් නොකළ බවත් අවසානයේ ඇස්තමේන්තු කරන ලද මාර්ග සඳහා තාර වෙනුවෙන් මුදල් වෙන් කර අවසන් වූ පසු කිලෝමීටර් 1.1 ක දුර ප්‍රමාණයක් සඳහා කාර දැමීමට ප්‍රතිපාදන ඉතිරි වූ බවත් එම මුදලින් දෙබෑගම පෙර සඳහන් කරන ලද මාර්ගයේ කොටසක් සඳහා තාර දැමීම සිදු කළ බවත් ඒ කාර්ය සිදු කරන ලද්දේ ඩිලන්ති කන්ස්ට්‍රක්ෂන් ආයතනය බවත් පැවසීය. නමුත් ඒ සඳහා ගල් රෝල රැගෙන යාමටත් නොහැකි වන ලෙස එම මාර්ගයේ වෙලමැදින් තිබූ මාර්ගය ගිලා බැස තිබූ බව පවසා සිටියේය

(ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදි. ප:ව: 01.32)

අදාල ව්‍යාපෘතිය යටතේම තමන් විසින් නැවත මහා මාර්ග අමාත්‍යාංශයට ගොස් එම ඇස්මේන්තුවේ තිබූ ලක්ෂ 37 ක මුදලින් නැවත ලක්ෂ 18 ක් ලබා ගෙන අදාල මාර්ගයේ ඇති පැති බැම් දෙකෙන් එක් පැති බැම්මක් සකස් කිරීමට කටයුතු කළ බව පැවසීය. එහිදී පෞද්ගලිකව තමන් මුදල් ලබා දී එම මාර්ගය අඩි 20 දක්වා පළල් කිරීමට ක්‍රියා කළ බව පවසා සිටින ලදී. එහි එක් පැති බැම්මක් සඳහා පමණක් මුදල් අනුමත වූ බවත් මාර්ගයේ දෙපසම අඩි 250 කට වඩා පැති බැම් දැමිය යුතු බවත් එහි මාර්යේ වම්පසට වන්නට ඇති එක් බැම්මක් සඳහා තමන්ගේ පෞද්ගලික මුදල් පමණක් වියදම් කර ඇති බවත් වගකීමෙන් ප්‍රකාශ කරන බව පැවසූ එතුමා මේ කාර්යනි සිදු කර පෙර සඳහන් කළ කිලෝ මීටර් 1.1 ක දුර ගල් තාර දැමීමේ කාර්ය තම ඉඩම දෙසින් නොව මාර්ගයේ අනෙක් පසින් ආරම්භ කළ ව පවසා සිටියේය. පසුව 2018 වර්ෂයේදී දයා ගමගේ අමාත්‍යතුමා විසින් අපනයන කෘෂිකාර්මික මාර්ග නමින් මිලියන 20 ක ව්‍යාපෘතියක් රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයට ලබා දුන් බවත් එයින් මිලියන 1.5ක් ලබා ගෙන ඉහත කී මාර්ගයේ කඳු සහිත කොටස කොන්ක්‍රීට් කළ බව පැවසූ එතුමා මේ වන විට ඒ මාර්ගයේ මීටර් 50/100 ක කොටසක් හැරුනු කොට අනික් සියළුම කොටස් කිසිදු ගැටළුවකින් තොරව ගමන් කිරීමට හැකි පරිදි සක් කර ඇති බව පවසා සිටියේය. එම නිසා තම නිවසට හෝ වත්තට යාමට මාර්ග සකස් කිරීමට නොවන බවත් මීට පෙර අනෙකුත් රජයන් මඟින් ඒ මාර්ගයේ එක් එක් කොටස් විවිධ ව්‍යාපෘති යටතේ සකස් කර දුන්නේත් තම නිවසට යාම සඳහාදැයි විමසා සිටියේය. එම නිසා මෙවැනි ප්‍රකාශ සිදු කරන විට ඒ සම්බන්ධයෙන් සොයා බලා සිදු කරන ලෙස අදාල මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින බව පැසූ එතුමා තමන් තම ඉඩමකට හෝ නිවසකට යාම සඳහා රජයේ මුදල් වියදම් කර මාර්ග සකස් කර නොගත් බව වගකීමෙන් මේ සභාවට ප්‍රකාශ කරන බවත් නමුත් අදාල මන්ත්‍රීතුමාගේ පියා එවකට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීනී තුසිතා විජේමාන්න මැතිණිය මුණ ගැසීමට දිනපතා පැමිණ තම නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් කර දෙ ලෙස ඉල්ලා සිටි බවත් ඒ අවස්ථාවේදී නම් ලක්ෂ ගණනක මුදලක් වියදම් කර එම කාර්ය අප විසින් සිදු කර දුන් බව ප්‍රකාශ කරමින් තම කතාව අවසන් කරන බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු සභාපති දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා :**

දිනයට නියමිත කරුණු සාකච්ඡා කර අවසන් බවත් දීර්ග අද දින කාල වේලාව ඉක්ම ගියත් රැඳී සිටිමින් සභය දැක්වූ සියළුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වන බවත් පවසා සිටියේය. මීළඟ මහා සභා රැස්වීම 2022 ජූලි මස 12 වෙනි දින පෙ:ව: 09.30 ට ප්‍රාදේශිය සභා කාර්යාලයේදී පැවැත්වෙන බව නිවේදනය කරමින් එදින ප:ව: 1.35 ට මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව